**2019/03/12 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව**

2019/03/12 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01.** **ආගම සිහි කිරීම**

2019.03.12 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02.** **මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින් 2019 මාර්තු මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. පෙර සභාවල පරිදිම ඔබ සියළු දෙනාගේ සහයෝගය මම ඉතා ගෞරවයෙන් අපේක්ෂා කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත.

**(අ)02. 2019.02.12 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

ඒ අනුව සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. 2019 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් යොමුකරන ලද 2019.03.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ ලිපියට අනුව අපට අදාළ පාරවල් 4 ක් ඇති බවත්, ඒවා මනින්න අප සභාවේ තාක්ෂණ නිලධාරී මහතා සහ මහත්මිය ගොස් ඇති බවත්, මෙහිදී අනුගමනය කල යුතු පියවරයන් ඇති නිසා අදාල ප්‍රදේශවල මැණුම් කටයුතු සිදු කිරීමේදී ගරු මන්ත්‍රීවරුන් විසින් අධීක්ෂණය කල යුතු බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

02. අලුත් ඉහළ , මාපලගම මධ්‍යම , කැටගොඩ පදිංචි ජාගොඩගේ චමින්ද පුෂ්ප මහතා විසින් යොමුකරන ලද උඩුගම, උතුර ගල්ලන්දල පාලම අසළ ගිංගගේ සුළං බෝට්ටු පැදීමේ ව්‍යාපාරය පවත්වා ගෙන යාම සහා අවසර ලබා ගැනීම සඳහා ඉල්ලීම් කරන ලද 2019.02.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙය අපේ පනතේ නැති ව්‍යාපාරයක් බවත් මේ පිළිබඳව ගරු සභාවේ අදහස් දැනගැනීමට අවශ්‍ය බවත්, දැනට දුරකථනයෙන් මේ සම්බන්ධව විරෝධතාවයක් ලැබී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. ඒ සම්බන්ධව රංජිත් ජයවීර මන්ත්‍රීතුමා, සමන් මන්ත්‍රීතුමා, වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා සහ ගරු උප සභාපතිතුමා අදහස් පළ කළහ. ගරු උප සභාපතිතුමා තව දුරටත් අදහස් ප්‍රකාශ කිරීමේදී, මෙය අපේ පනතේ නැතත් සභාවට හොඳ ආදායමක් ලබා ගත හැකි නිසා වෙනත් පළාත් පාලන ආයතනයකින් මීට අදාල පනතක් ගෙනවිත් සම්මත කර ගත හැකි බැවින් අපි සාකච්ඡා කොට ඉදිරි කටයුතු දැණුම් දෙන්නම් යනුවෙන් අදාළ පුද්ගලයා දැනුවත් කරන ලෙස සභාවෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට ගරු සභාපතිතුමා තීරණය කරන ලදී.

03. උඩුගම, ගමගොඩ, පදිංචි ඩබ්. ඩබ්. මැණික් නිරෝෂන් ප්‍රනාන්දු මහතා විසින් සත්ව ගොවිපලක් ආරම්භ කිරීමට අවසර ලබා ගැනීම සඳහා යොමු කරන ලද 2019.03.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා සහ ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ප්‍රකාශ කර සිටියේ සතුන් ඇති කිරීමට අවසර ලබා දිය හැකි වුවත්, සතුන් ඝාතනය කිරීමට අවසර ලබා දිය නොහැකි බවයි. මෙහිදී ගරු මන්ත්‍රී වෙරංග මහතා ප්‍රකාශ කර සිටියේ ස්වයං රැකියාවක් ලෙස ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා අවසර ඉල්ලා ඇති බවත්, ආදායම් පරික්ෂක මහතා මෙය පරික්ෂා කිරීමට ගිය බවත්ය. මේ සම්බන්ධව **පරික්ෂා කොට ඉදිරි කටයුතු කිරීමට ගරු සභාපතිතුමා විසින් තීරණය කරන ලදී.**

04. තල්ගස්වල, කලුකොත පදිංචි ඩබ්. ඒ. රෝහන කුමාර මහතා විසින් තල්ගස්වල නගරයේ පවත්වා ගෙන යනු ලබන නීති විරෝධි මත්ස්‍ය වෙළඳසැල් ඉවත් කර දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද 2019.03.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව පියල් මන්ත්‍රීතුමා හා රංජිත් ජයවීර මන්ත්‍රීවරුන් පුකාශ කර සිටියේ මේ ලිපිය යොමු කල පුද්ගලයා පමණක් සභාවට බදු ගෙවන අතර අනිත් අය අනවසරයෙන් වෙළඳාම් කරන බවයි. මෙහිදී චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටියේ අනවසර අය ඉවත් කිරීමට පියවර ගැනීමෙන් ඒකාධිකාරයක් ගොඩ නැගෙන බැවින් සියළු දෙනාගෙන් බදු අය කිරීමේ ක්‍රමවේදයක් සකස් කල යුතු බවයි. එයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ PHI මහත්වරුන් යවා පරික්ෂා කොට සියළු දෙනාගෙන් බදු අය කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීමට කටයුතු කරන බවත්, ජංගම

වෙළඳාම්වලින් බදු අය කල නොහැකි බවත්, එසේ බදු අය කරන්නේ නම් ඔවුන්ට ස්ථාන සකස් කර දීම හා ටෙන්ඩර් කැඳවීම සිදු කල යුතු බවත්ය. නමුත්, ජංගම රථ දිගු කාලීනව එක් ස්ථානයක ව්‍යාපාරවල නියලේ නම් එහිදී බදු අය කල හැකි බව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ප්‍රකාශ කරන ලදී. මීට අමතරව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා සහ ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතාතම අදහස් ප්‍රකාශ කරන ලදී. ගරු උප සභාපතිතුමා කියා සිටියේ ආදායම් පාලකතුමා සහ කාර්මික නිලධාරී යොදවා බල ප්‍රදේශයේ ඇති මෙම ස්ථාන පරීක්ෂා කොට, සංගණනයක් කර වාර්තාවක් ලබා ගැනීමට යෝජනා විය.

05. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ මගින් යොමු කරන ලද ගම් පෙරළිය වැඩසටහන - 2019 මාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධව 2019.02.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙහිදී ගරු උපසභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ මේ ලේඛනයේ සඳහන් වන කොරගමලේ ක්‍රීඩා පිටිය හා තවත් ක්‍රීඩා පිටියක් අජිත් මන්ත්‍රීතුමා සංවර්ධනය කිරීමට ඉල්ලූ අවස්ථාවේ අපිට අයිති නැති බැවින් ඒ සඳහා අවස්ථාව නොදුන් බවත්, ඒ වගේම කරුණාතිලක ක්‍රීඩාංගණයද අපිට අයිති නැති බවයි. මෙහිදී චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටියේ අයිතිය බල බලා හිටියොත් එම පිට්ටනි සංවර්ධනය කල නොහැකි බවයි. ගරු සභාපතිතුමා කියා සිටියේ අප සභාවට අයිති නැති අපි භුක්ති විඳින සියළු දේ දන්වා එවන මෙන් ප්‍රධාන ලේකම්තුමා අප වෙත දන්වා ඇති බවත්, ඒ පිළිබඳ දැනට පිළිතුරු සපයා ඇති බවත්ය. එමෙන්ම මේ ලේඛනයේ සඳහන් පාරවල් හා ක්‍රීඩා පිට්ටනි සංවර්ධනය කිරීමේදී ගරු මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් ඒ සඳහා සහභාගි වන ලෙසද දන්වා සිටින ලදී.

06. පරිසර නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද කන්නැලියේ කසළ ඉවත් කිරීම සඳහා සතියකට අය කරන මුදල වන රු. 3350.00 සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද 2019.03.11 දිනැති ලිපිය සභාගත කරන ලදී.

රු. 3550.00 ක මුදල 2015 තීරණය කල බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. මෙහිදී අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමා සහ ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ප්‍රකාශ කර සිටියේ මෙම මුදල අනිවාර්යයෙන්ම වැඩි කල යුතු බවයි. ඒ පිළිබඳව නෙලී මන්ත්‍රීතුමිය සහ වසන්ත මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කරමින් කියා සිටියේ මෙම මුදල රු. 4500.00 ක් වත් විය යුතු බවයි. ගරු උප සභාපතිතුමා නැවතත් අදහස් දක්වමින් වාහනයේ කාර්ය මණ්ඩලයේ දෙදෙනෙක් යා යුතු බැවින් රු. 5000.00 ක් වත් විය යුතු බවයි. අවසානයේ එම මුදල රු. 5000.00 දක්වා වැඩි කිරීමට ඒකමතිකව තීරණය විය

07. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත මගින් යොමු කරන ලද ගිංගග මිටියාවත ප්‍රජා මූලික පරිසර කළමනාකරණ වැඩසටහන සම්බන්ධව 2019.03.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ වැඩසටහන මගින් ගග අයිනේ පැළ වැවීම් ආදී කටයුතු රාශියක් සිදු වන බැවින් ඒ සඳහා සියළුම මහජන නියෝජිතයින් සම්බන්ධ විය යුතු බැවින්  මන්ත්‍රීතුමන්ලා සමග සාකච්ඡා කර දිනයක් ලබා දීමට කටයුතු කරන ලදී.

08. නව නගරය, තල්ගස්වල , ඇම්.ජී.ජයරත්න මහතා විසින් යොමු කරන ලද වල් බිහි වූ ප්‍රාදේශීය සභාවට අයත් තල්ගස්වල පිහිටි ගොඩනැගිල්ල සහ ඉඩම ග්‍රාම සංවර්ධන සමිතියට පවරා දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද 2019.02.17 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ මෙම ගොඩනැගිල්ල සභාව සතු බවත්, සර්වෝදය සඳහා ලබා දී තිබූ බවත්, දැනට පරිහරණය නොකරන බැවින් ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ඔවුන්ට පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත්ය. එසේ පවරා දීමට නොහැකි බව ඔවුන්ට දැන්වූ බවද ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව රංජිත් ජයවීර මන්ත්‍රීතුමා, වසන්ත මන්ත්‍රීතුමා, චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා, සහ උප සභාපතිතුමා අදහස් දක්වන ලදී. මෙය ග්‍රාම සංවර්ධනයට ලබා නොදීමට ඒකමතිකව තීරණය විය. තවද ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ප්‍රකාශ කර සිටියේ මෙම ශාලාව නිකරුනේ තියෙන නිසා එවැනි ඉල්ලීම් සිදු කරන බවත්, එය කියවීම් ශාලාවක් ලෙසවත් පවත්වා ගෙන යා යුතු බවයි. යතුර ඔවුන්ගෙන් ලබාගෙන මෙම ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාවේ භාරයට ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මීට අමතරව වලකුඹුරේද ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරන ලද ප්‍රජා ශාලාවක් පවතින බවත්, එහි යතුරද අපි සතුව නැති බව ගරු උප සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලද අතර චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා, ප්‍රියන්තා ගුණසේකර මන්ත්‍රීතුමිය,තරංග සුදර්ශන මන්ත්‍රීතුමා, නෙළී මන්ත්‍රීතුමිය, අජිත් මන්ත්‍රීතුමා අදහස් දැක්වූ අතර ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ දැනට එහි පෙර පාසලක් පවත්වා ගෙන යන බවයි. තවත් පෙර පාසලක් වෙරංග මන්ත්‍රීතුමාලගේ කොට්ඨාසයේ තුල ඇති බවත් ප්‍රකාශ කරන ලදී, චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා ඌරලත් එවැනි ප්‍රජා ශාලාවක් පවතින බව කියා සිටියේය. මේ සියල්ල සොයා බලා නැවත ප්‍රාදේශීය සභාවේ පාලනය යටතට ගැනීම සුදුසු බව තරංග මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

09. ප්‍රධාන අමාත්‍යාංශය, දකුණු පළාත විසින් යොමු කරන ලද සුව සවිය සෞඛ්‍ය හා ආයුර්වේද සායන වැඩසටහන -2019, සම්බන්ධව 2019.03.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පළාත් සභාවේ මූලිකත්වයෙන්, ප්‍රාදේශීය සභාවේ සංවිධානයෙන් හෙට දින නාගොඩ ජයසිංහාරාම විහාරස්ථානයේ සෞඛ්‍ය සායනයක් පැවැත්වෙන බවත් ඒ සඳහා සියළුම දෙනා සහභාගී වී සහයෝගය දක්වන ලෙස ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

10. ගෝල්ඩින් වේ උසස් අධ්‍යාපන ආයතනය හා යූ.සී.සී. ස්පෝර්ට් ක්ලබ් විසින් යොමු කරන ලද හිටපු විදුහල්පති, පරිසරවේදී, කතෘ ගරු උඩුගම එස් ජයසුන්දර ගුණානුස්මරණ ක්‍රිකට් තරගාවලිය හා වොලිබෝල් තරගාවලිය සඳහා 2019.03.20 දිනට වතුර බවුසරයක් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**අමර ධනංජය මන්ත්‍රීතුමා වතුර බවුසරය ලබා දෙන ලෙස ඉල්ලීම් කල අතර, එතුමා ගමට විශාල සේවයක් කල පුද්ගලයෙක් නිසා එය ලබා දීම සුදුසු බව අජිත් මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී. වතුර බවුසරය ලබාදීමට තීරණය විය**

11. ඌරල, වදුරඹ, නැහිනිගල පදිංචි එල් පණ්ඩිතරත්න මහතා විසින් ගල්කන්ද නැහිණිගල තලාව මාර්ගයේ දෙපස ඇති අවිධිමත් හා අනවසර ඉදිකිරීම් ඉවත් කර දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද 2019.03.09 දිනැති ලිපිය සභාගත කරන ලදී

මෙහිදී ගරු සභාපතිතුමා කියා සිටියේ මේ ලිපියේ කියන ආකාරයට පක්ෂපාතීව කිසිවක් නොකල බවයි. මේ ලිපිය ලැබීමට පෙරත් මේ සම්බන්ධව කටයුතු කල බවත්, මේ ස්ථානයේ හා වළකුඹුර ප්‍රදේශයේ පවතින අවහිර කිරීම් දීර්ඝ කාලයකට ඉහතදී සිදු කර ඇතත්, දැන් එහි වගකීම අප වෙත පැවරීම නුසුදුසු බවත්, නමුත් මේ අවහිර කිරීම් ඉවත් කල හැකි බවත්, ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා සහ පතිනායක මන්ත්‍රීතුමා , අජිත් මන්ත්‍රීතුමා වැඩිදුරටත් අදහස් ප්‍රකාශ කරන ලදී.

12. එස්.කේ.මල්ලවආරච්චි, කළමනාකරණ සහකාර, නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් යොමු කරන ලද මාපලගම ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ඖෂධ ලබා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කරන ලද 2019.03.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ)1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

**01.** නාගොඩ ප්‍රාදේශීය සභාවේ අවසරයකින් තොරව මාර්ග දෙපස ඉදි කල, එල්ලා ඇති බැනර් හා කටවුට් සම්බන්ධව ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරමි.

මෙසේ අවසරයකින් තොරව ඉදි කල හා එල්ලා ඇති බැනර්, කටවුට් තිබේනම් සියළුම මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන් ඒ පිළිබද සභාව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිමින් ඉදිරියේදි අනවසර බැනර් කටවුට් සියල්ල ඉවත් කිරීමට කටයුතු කරනබව සඳහන් කරන ලදී. ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ප්‍රකාශ කර සිටියේ අපට වඩා මාර්ග සංවර්ධන අධිකාරියට මේවායේ අයිතිය ඇති බැවින් ඔවුන්ද දින තිබුනත්, මෙම බැනර් කටවුට් ඉවත් කිරීමට කටයුතු කරන බවයි. එවිට මාර්ග සංවර්ධන අධිකාරියට සහ විදුලිබල මණ්ඩලයට මේ ප්‍රදර්ශන පුවරු ඉවත් කිරීමේ අයිතිය ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**02.** අනවසරයෙන් මත්ස්‍ය වෙළදාමේ යෙදෙන වාහන, වෙළදසැල්, මාළු ලැලි සම්බන්ධයෙන් බදු මුදලක් පනවා අය කිරීමට යෝජනා කරමි.
අනවසර මාලු වෙළදාම සම්බන්ධව ක්‍රියාමාර්ග ගන්නා බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. උතුර ගල්ලන්දල පාලම අසළ ගිංගගේ ආරම්භ කිරීමට බලාපොරොත්තුවන සුළං බෝට්ටු පැදීමේ ව්‍යාපාරය සඳහා බලපත්‍ර ලබාදීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සම්බන්ධව** ස්ථානය පරික්ෂාකොට සාකච්ඡා කර කටයුතු කිරීමට සභාවේ එකඟතාවය පළ කර අත,ර ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කිරීමට තීරණය විය.

04. උඩුගම, ගමගොඩ ප්‍රදේශයේ සත්ව ගොවිපළක් පවත්වා ගෙන යාමේ ව්‍යාපාරය සඳහා බලපත්‍ර ලබා දීමට යෝජනා කරමි.

මේ සම්බන්ධව කතා කිරීමේදී ගරු සභාපතිතුමා පවසා සිටියේ සත්ව ගොවිපළවල් ඇති කිරීම හොඳ ව්‍යාපාරයක් බවත්, ඇප්තොප්වත්තේද සත්ව ගොවිපලක් සකස් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් වූ බවයි. මෙහිදී ගරු මන්ත්‍රී වෙරංග මහතා සහ ගරු උප සභාපතිතුමා අදහස් ප්‍රකාශ කරනු ලදී. ගරු උප සභාපතිතුමා කියා සිටියේ ගමගොඩ පන්සලත් ආසන්නයේ ඇති බැවින් සතුන් ඇති කිරීම සඳහා පමණක් අවසර ලබා දෙන ලෙස දැන්වූ අතර, සතුන් මැරීමට අවසර ලබා දීමට නොහැකි බවයි. මේ සම්බන්ධව ධර්මසිරි මන්ත්‍රීතුමා, රංජිත් මන්ත්‍රීතුමා, නෙළී මන්ත්‍රීතුමිය, අජිත් මන්ත්‍රීතුමා, චන්ද්‍ර

සහබන්දු මන්ත්‍රීතුමා තම අදහස් ප්‍රකාශ කරන ලදී. මෙහිදී නිශාන්ත මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටියේ නීත්‍යානුකූලව ෆාම් එක පවත්වාගෙන යන්වානම් අපට අවසර නොදී සිටීමට නොහැකි බවයි.
ගරු සභාපතිතුමා මේ සම්බන්ධව වැඩි දුරටත් අදහස් දක්වමින්, එළුවන්, ඌරන්, ගවයන් ආදී සතුන් මෙම ස්ථානයේ ඝාතනය නොකෙරෙනවානම් ගැටළුවක් ඇති නොවන බවත්ය. ගරු උප සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටයේ දැනට සතුන් ඇති කිරීම සඳහා පමණක් අවසර ලබා දීම සිදු කරමු යන්නත්, සතුන් මැරීමට නම් ඔහුට ඒ සඳහා වෙනම අවසරයක් ලබා ගත යුතු බැවින් දෙවනුව ඒ පිළිබඳ දැනුවත් කරමු යනුවෙන් පැවසූ අතර බලපත්‍රය ලබා දීමට තීරණය කරන ලදී.

සත්ව ගොවිපල සම්බන්ධව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ප්‍රශ්ණ කරමින් සිටියේ ඉල්ලුම් කරන්නේ පරිසර බලපත්‍රයද යනුවෙනි. එහිදී ඉල්ලුම් කරන්නේ පරිසර බලපත්‍රය නොව ව්‍යාපාර බලපත්‍රය බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. සභා පනතේද මේ ව්‍යාපාරයන් සඳහා අවසර ලබා දීම සම්බන්ධව සඳහන් වන බවද ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සංශෝධනය කර දැනට සතුන් ඇති කිරීම සඳහා පමණක් අවසර ලබා දීය හැකි බවට ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. නාකියදෙණිය ඔයිල්ෆාම් කර්මාන්තශාලාවේ බලපත්‍රය 2019 වර්ෂයට අලුත් කිරීමට යෝජනා කරමි.
මෙහිදී චන්ද්‍ර සහබන්දු මහතා ප්‍රකාශ කර සිටියේ තමා පෞද්ගලිකව බලපත්‍ර ලබාදෙනවාට විරුද්ධ බව වාර්තාවේ සඳහන් කරන ලෙසයි. රංජිත් මන්ත්‍රීතුමා සහ තරංග මන්ත්‍රීතුමා, විජිත් සහබන්දු මන්ත්‍රීතුමාද බලපත්‍ර ලබාදෙනවාට විරුද්ධව අදහස් ප්‍රකාශ කරන ලදී. නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා, අජිත් මන්ත්‍රීතුමා, උප සභාපතිතුමා මේ සම්බන්ධව දීර්ඝ ලෙස අදහස් ප්‍රකාශ කල අතර, 16 දෙනෙකු අත උස්සා විරෝධය ප්‍රකාශ කළේය. **ඒ අනුව මාර්තු 15ට පෙර වැඩ අවසන් නොකරන්නේ නම් සභාවේ එකඟතාවය මත කටුපොල් කර්මාන්තශාලාව තහනම් කිරීමට තීරණය කල අතර ඒ බව දන්වා ලිපියක් යොමු කිරීමටද තීරණය විය.**

06. ජේ.පී ඉන්ද්‍රසිරි නමින් පවතින මාපලගම පැරණි කඩ කාමර අංක 4 ඔහුගේ පුත්‍රයා වන ජාගොඩගේ තිලක් ජයමිණී යන අයට පවරා දීමට යෝජනා කරමි.
මීට ඉහත සභාවේ මෙම කාමරයට බදු නොගෙවන බවට මත පළවූවද, රු. 1950.00 ක බදු මුදලක් සභාවට ගෙවන බව හා නව තක්සේරු මුදල 3450.00 ක් බව හා හිඟ මුදලක් පවතින බවද ගරු සභාපතිතුමා විසින් සභාවට දැන්වීය.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. කේ.ජී. ධම්මික කීර්ති කුමාර නැමති බදුකරු මාපලගම වෙළඳ සංකීර්ණයේ බිම් මහළ කාමර අංක 4 කිසිදු දැණුම්දීමකින් හෝ අවසරයකින් තොරව දෙකට බෙදා කුකුළු මස් අලෙවි කරන වෙළඳසැළක් සහ සැලුන් එකක් පවත්වා ගෙන යනු ලබයි. මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරමි. පියල් මන්ත්‍රීතුමා පවසා සිටියේ හාඩ් බෝඩ් එකකින් බෙදා වෙන් කර ඇති බවයි. මෙවිට ගරු උප සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ බදු කරුට තවත් අයෙකුට කඩය බදු දීමට අවසර නැති බවයි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සම්බන්ධව ඉදිරියේදී අවශ්‍ය කටයුතු කිරීමට තීරණය කරන ලදී.**

06. මාපලගම වෙළඳ සංකීර්ණයේ බිම් මහල අංක 01,02,03,04 උඩුමහළ අංක 01,03,04,06 හා තල්ගස්වල අංක 01 සහ 02 යන කඩ කාමරවලින් දිගින් දිගටම ප්‍රාදේශීය සභාවට කඩකුලී නොගෙවන අතර හිග කඩ කුලී ගෙවන ලෙස ලිඛිතව හා වාචිකව දැනුවත් කර ඇතත්, ඒ සම්බන්ධව අවධානයක් යොමු නොකරන බැවින්, අදාල කඩකාමර මුද්‍රා තැබීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. උනන්විටිය සති පොළේ කඩ කාමර 5 ක් සඳහා කොන්ක්‍රීට් කණු, ඇස්බැස්ටෝස් ෂීට් 03 ක් ලබාදීමට හා ජල අවශ්‍යතාවය සම්පූරණ කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. R D 9457 ට්‍රැක්ටරයේ දුම් පිටවීමේ දෝෂයක් හා තෙල් කාන්දුවීමේ දෝෂයක් පවතින හෙයින් එම දෝෂ පරික්ෂා කර බලා අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. මාපලගම ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් සපයන පළමු කාර්තුවට අදාළ ඖෂධ මෙතෙක් ලැබී නැති බැවින් හිගව පවතින අත්‍යවශ්‍ය ඖෂධ ශ්‍රී ලංකා ආයුර්වේ ඖෂධ සංස්ථාව වෙතින් මිළදී ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වී. වී. සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

10. 2018.08.06 දින පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු තීරණ ප්‍රකාරව බැංකු සැසඳුමේ පවතින ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ක කාලයක් ඉක්ම වූ පහත සඳහන් චෙක්පත් හා බැංකු සැසඳුමේ මාසයක කාලයක් ඉක්ම වූ හඳුනා නොගත් බැර ආදායමට බැර කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

10. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම

<u>2019.03.12 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>

**<u>ඉදිරි ගෙවීම් (පොදු අරමුදල්)</u>**

**<u>01.2019 පෙබරවාරි මස විදුලි බිල්පත්</u>**

| | | |
|---|---|---|
| 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| 2810236100 | -මාපලගම ක්‍රීඩාංගනය | - රු. 496.20 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 514.50 |
| 4507357802 | -සමනළ පෙර පාසල | - රු. 294.90 |
| 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 258.30 |
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු. 276.60 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1356.30 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 5473.80 |
| 8617046104 | - උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානය | - රු. 1301.40 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1392.90 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 276.60 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 276.60 |

**02.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2019.01.21 – 2019.02.21) -රු. 4121.98

**03. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

**2019 පෙබරවාරි**

| | | |
|---|---|---|
| 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 7048.59 |
| 0912296537 | - ප්‍රධාන කාර්යාලය | - රු. 3092.34 |
| 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 781.69 |

**2018 දෙසැම්බර්, 2019 ජනවාරි සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම - 0912231201**

| | |
|---|---|
| 2018.12.01 – 2018.12.31 දක්වා | - රු. 1978.32 |
| 2019.01.01 – 2019.01.31 දක්වා | - රු. 3266.10 |

**04. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාව සඳහා බිල්පත (2019.01.25) - රු. 69.86

**05.ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 පෙබරවාරි මස ඉන්ධන දීමනා ලබා දීමේ බිල්පත පියවීම -රු.81000.00

**06.අතිකාල දීමනා ගෙවීම**

**2019 ජනවාරි මස**

| | | |
|---|---|---|
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 4841.00 |

**2019 පෙබරවාරි මස**

| | | |
|---|---|---|
| බී.ජී. පියතිලක මයා | - රියදුරු | - රු. 2760.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු.7075.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 4720.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.5016.00 |
| එන්.එම්.රජිත මයා | -අනියම් මුරකරු | - රු.3232.00 |

**07.2019 පෙබරවාරි මස පරිවර්ථිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 3426.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 2806.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 3000.00 |
| ආර්.ඒ.ඒ.එල් රත්නායක මිය | -සංවර්ධන නිලධාරී | - රු. 3000.00 |

**08.ගමන් වියදම් ගෙවීම**

**2019 ජනවාරි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 350.00 |

**2019 පෙබරවාරි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 3150.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 486.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු. 2400.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 1750.00 |
| වයි.ජී. ගංගා පද්මිණී මෙය | - පුස්තකාල සහායක | - රු. 1760.00 |
| ඉෂානි දීපිකා ගනේවත්ත මිය | - පරිගණක ක්‍රියාකරු | - රු. 2640.00 |

**සේවාරම්භක පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම වෙනුවෙන් ගෙවීම (දින 10 ක් සඳහා )**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 7960.00 |
| ටී. සෙව්වන්දි මනම්පේරි මිය | - පුස්තකාලයාධිපති | - රු. 8700.00 |
| ඉෂානි දීපිකා ගනේවත්ත මිය | - පරිගණක ක්‍රියාකරු | - රු. 8800.00 |

**<u>2018.12.31 න් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතුවල යෙදීම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම</u>**

| | | |
|---|---|---|
| කේ.ජී. මානෙල් සුදර්ශනී මිය (දින 01) | - සංවර්ධන නිලධාරී | - රු. 500.00 |
| අයි. චතුරි චින්තිකා මිය (දින 01) | - සංවර්ධන නිලධාරී | - රු. 450.00 |
| චමරි මධුෂානි මිය (දින 06) | - කාර්යාල කාර්ය සහායක | - රු. 2700.00 |
| ජී.පී.පී. ශ්‍රීණිකා මිය (දින 04) | - කළමනාකරණ සහකාර | - රු. 1800.00 |

**<u>2019 මාර්තු මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 350.00 |

**09.එම්. කමල් සිරිවර්ධන මයා, දිස්ත්‍රික් ප්‍රජා සංවර්ධන නිලධාරී, පළාත් සහකාර කොමසාරිස් කාර්යාලය**

2018.12.20, 2019.01.17/24 යන දිනයන්හි නාගොඩ ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සහභාගී වීමේ ගමන් වියදම් ගෙවීම - රු. 2740.00

**10. එච්.ඩබ්.පී.අමරනාත් මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/02/22) - රු. 504.00

**11. එල්.ඒ.ජේ. දිවාකර මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/01/04) - රු. 430.00

**12. එච්. එල්.එන්.පී.කුමාර මයා, ම.සෞ.ප**

I. ආහාර සාම්පල් පරික්ෂාවට කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට යාම වෙනුවෙන් (2018.12.06) - රු. 700.00

**13. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 9370.00

**14.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**

**<u>2019 ජනවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 125ක් | - රු. 12625.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 120 ක් | - රු. 11980.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 105 ක් | - රු. 10605.00 |
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් | - රු. 4950.00 |
| RD 9457 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 38 ක් | - රු. 3762.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 70 ක් | - රු. 7070.00 |
| ඩෙංගු ධූමායන කටයුතු සඳහා පෙට්‍රල් ලීටර් 20 | - රු. 1980.00 |

**15. කේ.ජී. ධනසිරි මයා තෙල් පිරවුම්හල, ගා/නාගොඩ**

**<u>2019 පෙබරවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 531ක් | - රු. 54169.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 240 ක් | - රු. 24440.00 |

| | |
|---|---|
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 133 ක් | - රු. 13699.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 60 ක් | - රු. 6180.00 |
| තණකොළ කපන මැෂින් සඳහා පෙට්‍රල් ලීටර් 20 | - රු. 2580.00 |
| 2 T Oil ලීටර් 1 | - රු. 620.00 |

**16.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 පෙබරවාරි මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00

ii. 2019 පෙබරවාරි මස සභා වාර්තා පිටපත් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 2520.00

iii. ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන සඳහා දින 05 ක ප්‍රචාරන කටයුතු වෙනුවෙන් ශබ්ද විකාශන යන්ත්‍ර ලබාගැනීමේ බිල්පත - රු. 7500.00

**17.සී/ස අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස් පුද්. සමාගම, පිටිගල**

වීථි පහන් අළුත්වැඩියාව සඳහා වයර් කොයිල්, තම්බ්ලර් ස්විච්, ටේප් රෝල් මිලදී ගැනීමේ බිල්පත (2019.02.15 බි.අංක 21481) - රු.21320.00

**18. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා මාර්තු මස මාසික කුලිය ගෙවීම - රු. 4000.00

**19.බී.ජේ.කරුණාරත්න,රත්නගිරි ස්ටෝර්ස්,මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

| | |
|---|---|
| 2019 ජනවාරි | - රු. 4910.00 |
| 2019 පෙබරවාරි | - රු. 4430.00 |

**20.එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

2019 පෙබරවාරි - රු.4690.00

**21.හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

i. නඩු අංක පී 15977 අදාළව 2019.01.16 කැඳවන ලද නඩු වාරය සඳහා නීතීඥ පෙනී සිටීමේ ගාස්තු - රු.3000.00

ii. නඩු අංක එල් 13814 අදාළව 2019.03.08 කැඳවන ලද නඩු වාරය සඳහා නීතීඥ පෙනී සිටීමේ ගාස්තු - රු.3000.00

**22.ඊ.ඒ. සමන් කුමාර එදිරිසිංහ මයා, එදිරිසිංහ මෝටර්ස්, උඩුගම**

LL 7650 කෘ කැබ් රථයේ බ්‍රේක් පද්ධතියේ සහ ක්ලච් පොම්පයේ අලුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම ( බි.අංක 398, 2019.02.12) - රු.13955.00

**23.එස්.ඩබ්. දිනේෂා කුමාරි, වළකුඹුර , නාගොඩ**

මුදල් ගෙවා ඉල්ලීම් කරන ලද වතුර බවුසරය, එය ගෙන යන ට්‍රැක්ටරය ක්‍රියා විරහිත වීම නිසා වතුර බවුසරය ලබා දීමට නොහැකි වීම හේතුවෙන් මුදල් ආපසු ගෙවීම - රු. 4000.00

**24.සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, ලේක්හවුස්, කොළඹ 10**
නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල 03 සඳහා 2019 ජනවාරි , පෙබරවාරි,
මාර්තු මාස 03ට අදාළ සත්මඩල මාසික සඟරා මිළදී ගැනීමේ බිල්පත - රු. 540.00

**25.දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, කොළඹ 02**
2018.10.01- 2018.12.31 දක්වා කාර්තුවට අදාළ වැටුප්වලින් අය කර ගත් මුද්දර බදු
දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේශනය කිරීම - රු. 4500.00

**26.ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10**
**දුම්රිය බලපත්‍ර සඳහා බිල්පත් ගෙවීම**
එම්. එම්. මහින්දදාස මයා (සාමාජිකයින් 03ක් සඳහා) - අනුරාධපුර - ගාල්ල -රු. 2120.00
කේ.ඒ. මානෙල් අබේරත්න මිය (සාමාජිකයින් 02ක් සඳහා) නුවරඑළිය - ගාල්ල - රු. 2300.00

**27.කුමුදු ද සිල්වා මිය , පන්නිපිටිය**
පුස්තකාල 03 සඳහා මිළදී ගනු ලැබූ නිදහස් වීම,රොලි, වාලි,වීපී හරි සතුටින් යන ග්‍රන්ථ 4
සඳහා මුදල් ගෙවීම - රු. 2880.00

**28.මහේන්ද්‍ර ලොරන්සුහේවා මයා, ලොරෙන්ස් ෆැෂන්, උඩුගම, ගාල්ල**
නාගොඩ ප්‍රාදේශීය සභා පෙර පාසල් 15 ක දරුවන් දරුවන් 380 ක් වෙනුවෙන් ලබා ගත් පෙර පාසල්
නිල ඇඳුම් 380 ක ප්‍රමාණය සඳහා එකකට රු. 700 බැගින් මුදල් ගෙවීම - රු.266000.00

**29.ධනුෂ්ක ඇඩ්වර්ටයිසින්, යටලමත්ත**
PF 7360 දරණ කැබ් රථය ටින්ටඩ් කිරීමේ බිල්පත පියවීම - රු. 1000.00

**30.ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**

i. සෞඛ්‍ය කම්කරුවන් වෙනුවෙන් ජනවරි, පෙබරවාරි මාස සඳහා ඩෙටෝල් සබන් මිළදී ගැනීමේ බිල්පත - රු. 3300.00
ii. 2019 පෙබරවාරි මස 12 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 2101.00
iii. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන්දේසි කිරීමට තීරණය වූ භාණ්ඩ වෙන්දේසිය සඳහා සහභාගී වූ නිලධාරීන්ට සංග්‍රහ කිරීම වෙනුවෙන් දරන ලද වියදම - රු. 473.00

**31. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී එල් සී, කොළඹ 02**
MP 2001L ෆොටෝ කොපි යන්ත්‍රයට ටෝනර් කාට්‍රිජ් 02 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 17090.00

**32.එම්.ඒ.සිරිපාල ,සේසිරි ස්ටෝර්ස්,මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 පෙබරවාරි - රු. 2540.00

**33. ඒ. එල්.ජී දිනිඳු මයා, සුගත් සුපර් සිටි, උඩුගම**
උඩුගම පොළ භූමියේ වල් විනාශ කිරීම සඳහා වල්නාශක මිළදී ගැනීම වෙනුවෙන් ගෙවීම- රු. 3490.00

**34. කේ. කේ. බී. රාජකරුණා මයා, සී.පී.ආර්. එන්ටර්ප්‍රයිසස්**
222, ඌරල මධ්‍යම, කොතේගොඩකන්ද මාර්ගය ගාමිණී මහතාගේ නිවස දක්වා මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා J.C.B. යන්ත්‍ර පැය 09 යෙදවීම සඳහා ගෙවීම - රු. 22500.00

**35. සිංහගිරි ස්ටෝර්ස්, උඩුගම**
ප්‍රධාන කාර්යාලයේ ලේඛගාරය සඳහා කාර්යාල කබඩ් හා පොත් රාක්ක මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 93000.00

**36. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
2019 ජනවාරි - රු.13000.00
2019 පෙබරවාරි - රු.13000.00

**රජයේ ආධාර (මන්ත්‍රී ප්‍රතිපාදන)**
**පූජ්‍ය බද්දේගම සමිත හිමියන්ගේ ප්‍රතිපාදන**

**37. සී/ස බද්දේගම බටහිර ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, පුහුල්දූව**

i. කැප්පිටියාගොඩ ග්‍රාම නිලධාරී වසමෙහි උණුවටුනගෙදර වත්ත මාර්ගයට අවශ්‍ය හියුම් පයිප්ප ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් - රු. 19650.00

ii. **කළමනාකරු මහජන බැංකුව, තල්ගස්වල ගි.අංක 272100110000027** ට බැර
කැප්පිටියාගොඩ ග්‍රාම නිලධාරී වසමෙහි උණුවටුනගෙදර වත්ත මාර්ගයට අවශ්‍ය හියුම් පයිප්ප 02 එම ස්ථානයට ප්‍රාදේශීය සභාවේ කෘ කැබ් රථයෙන් රැගෙන යාම වෙනුවෙන් ගෙවිය යුතු මුදල පොදු අරමුදලට බැර කිරීම - රු. 5350.00

**දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ**
**38. ඒ.කේ.ජේ. ගයාන් සංජීව, ගයාන් එන්ටර්ප්‍රයිසස්, යටලමත්ත**
උඩවැලිවිටිතලාව මුක්තවිල මාර්ගය ජේ.සී.බී යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 20000.00

**දකුණු පළාත් සභා ගරු නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ**
**39. ඒ.කේ.ජේ. ගයාන් සංජීව, ගයාන් එන්ටර්ප්‍රයිසස්, යටලමත්ත**
ගල්ලෙනමුල් දරඅකුල්කන්ද පාමුල මාර්ගය ජේ.සී.බී යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 22500.00

**40. කේ.බී. රංග මධුෂාන්, කහඳුව**
ගල්ලෙනමුල් දරඅකුල්කන්ද පාමුල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා J K 5745 දරණ ටිපර් රථය සේවයේ යෙදවීම වෙනුවෙන් ගෙවීම - රු. 7350.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ අංක 22 යටතේ ඇති ගෙවීම පිළිබඳව විස්තර කරන මෙන් ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ප්‍රකාශ කල අතර, ගරු සභාපතිතුමා විසින් ඒ පිළිබඳව පැහැදිලි කරන ලදී.**
**ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපති තුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

➢ **(ඉ).2 කර්මාන්ත යෝජනා**

**11(8) යටතේ කරනු ලබන යෝජනා**

**ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

ගෝණදෙනිය ගොඩපිල්ලකන්ද මාර්ගය පිළිසකර කිරීම සහ හගරන්වල මැණික්දොළ කන්ද මාර්ගයට කඩා වැටී ඇති පස් කඳු ඉවත් කර කාණු පිරිසිදු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ගේ යෝජනා ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

| | |
|---|---|
| ඌරල පහළ ආරළිය මාර්ගයේ කාණු සැකසීම | රු. 12500.00 |
| ගෝණදෙනිය මහජන ක්‍රීඩාංගණය J.C.B. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම | රු. 20000.00 |
| හගරන්වල ග්‍රාම සේවා වසමේ නො. 4 කෝවිල J.C.B. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම | රු. 37500.00 |
| ගම්මැද්දේගොඩ උතුර බොකටියවෙල මාර්ගය J.C.B. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම | රු.27350.00 |
| කැටගොඩ කිඹුල්කොටුකන්ද මාර්ගය කොරිපස් යොදා සංවර්ධනය කිරීම | රු. 17000.00 |
| උඩුගම අළුත්වත්ත සුදුවැලිපොත ගල්කන්ද මාර්ගය J.C.B. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම | රු. 175000.00 |
| උඩුගම අලුත්වත්ත පෙරෙට්ටුමඩුව අසළ සිට අලුත්වත්ත රෝහල් මාර්ගය J.C.B. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම | රු. 50000.00 |
| උඩුගම අලුත්වත්ත පැණිගලයාය කොටිගල්ගේ මාර්ගය J.C.B. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම | රු. 135000.00 |
| උඩුගම අලුත්වත්ත සුදුවැලිපොත හංදියේ සිට උඩුගම නැගෙනහිර යා කරන ගොඩේකන්ද මාර්ගය J.C.B. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම | රු. 50000.00 |
| උඩුගම අලුත්වත්ත පැණිගලයාය මාර්ගය J.C.B. යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම | රු. 25000.00 |
| ලෙහුවලකන්ද දදිසානායක මාවත මාර්ගයේ කාණු සැකසීම | රු. 20000.00 |

ඉහත ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## (ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම

*රබර් මුද්‍රා සකස් කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන්*

| විස්තරය | ආරි ඇඩ්ස්, ගාල්ල | ෂා ක්‍රියේෂන්, හබරාදූව | ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල |
|---|---|---|---|
| • භාණ්ඩ සමීක්ෂණ මුද්‍රාව සෑදීම සඳහා අය කරන මුදල (අගල් 4X3) | රු. 1800.00 | රු. 1700.00 | රු. 1600.00 |
| • දින මුද්‍රාව සෑදීම සඳහා අය කරන මුදල | රු. 2100.00 | රු. 2000.00 | රු. 1950.00 |

රබර් මුද්‍රා සකස් කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල වෙතින් රබර් මුද්‍රා සකස් කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී.

***252-6478 කැබ් රථයේ දෙපස අංක තහඩු සැකසීම සඳහා ලැබී ඇති මිළ ගණන්***

| විස්තරය | ආරි ඇඩ්ස්, ගාල්ල | ෂා ක්‍රියේෂන්, හබරාදූව | ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල |
|---|---|---|---|
| • කැබ් රථයේ දෙපස අංක තහඩු සෑදීම සඳහා අය කරන මුදල | රු. 1900.00 | රු. 1850.00 | රු. 1750.00 |

***252-6478* කැබ් රථයේ දෙපස අංක තහඩු සැකසීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල වෙතින් එම උපකරණ මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී.**

මිළ ගණන් සම්බන්ධව කතා කිරීමේදී ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ මෙම ප්‍රදේශයෙන් කල හැකි දේවල් , මේ ප්‍රදේශයෙන් සිදු කර ගන්නා ලෙස ඉල්ලීම් කලත්, එසේ සිදු නොවන බවත්ය, ඉහත අවස්ථා දෙකම මෙම ප්‍රදේශයෙන් සිදු කර ගත හැකි බවයි. මෙම ආයතන නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි ආයතන බව ගරු උප සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**(ඊ)කාරක සභා වාර්තා**

- ❖ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කරන ලද අපහරණ හා වෙන්දේසි කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

## (උ). ලැබීම් හා ගෙවීම් වාර්තා

## 11.වෙනත් කරුණු :-

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. සභාපතිතුමනි, සභා වාර එකොළහක විතර වැඩිපුරම කතා කරන මාතෘකාවක් තමයි මම ගෙන එන්නේ. මාපලගම ආසිරි සර්විස් එක ඉස්සරහා යටවන ස්ථානය පිළිබඳව මම කතා කරනවා. එතන ඉදිරිපිට තියෙන ඉඩම සුද්ද පවිත්‍ර කරමින් පවතිනවා. බැකෝ යන්ත්‍රයක් ඒ ඉඩම දිගේ ගිහිල්ලඅර කාණුව ශුද්ධ කරන්න පුළුවන්. මේක තමයි අන්තිම අවස්ථාව. මීට පස්සේ ඒ ඉඩමේ තේ වගා කළාට පස්සේ ඒක උඩින් බැකෝ යන්ත්‍රයක් ගෙනියන්න කවුරුත් ඉඩ දෙන්නෙ නැහැ. එතන බැකෝ යන්ත්‍රයක් තියෙනවා. මං හිතන්නේ පැය තුනක් හතරක් තිබුනොත් අනිවාර්යයෙන් ඒ කොටස ගොඩ දාගන්න පුලුවන්. එහෙම කළොත් මේ පාර යට වන එක අනිවාර්යයෙන් නතර වෙනවා.

ඒ වගේම තමයි මාපලගම අනවසර කඩ විශාල සංඛ්‍යාවක් තියෙනවා. ඔබතුමා අර බැනර් ගැන කතා කළා වගේ මේ පිළිබඳවත් අවධානය යොමු කළොත් හොඳයි කියලා තමයි මම හිතන්නේ. දැන් ගොඩක් ඒවයි කොන්ක්‍රීට් දාලා හොරාට බිම සකස් කරලා අවසන්. ස්ථිර කඩ බවට පත්කරලා ඉවරයි. තල්ගස්වල හා මාපලගම ඒ වගේම අතුලදර්ශනාරාම විහාරස්ථානයේ පැවැත්වීමට නියමිත උත්සවයට අවශ්‍ය වීදි ලාම්පු කිහිපයක් තියෙනවා. ඒවා සකස් කරන්න කම්කරුවන් දෙන්න ඔබතුමා පොරොන්දු වුණා. අපේ වන්දෝදය හිමියන්ගේ විශාල උත්සවයක් පවත්වනවා. මම හිතන්නෙ ඒ කටයුතු ඉක්මනින් කරන්න කාලය එළඹිලා තියෙන්නේ.

ඒ වගේම තල්ගස්වල රාජ්‍ය වැවිලි සංස්ථාවේ නොම්මර එක 1, 12 ලයිම ළඟ කෝවිල් උත්සවයක් තියෙනවා. මේ 15,16,17 දිනවල එක වීථි ලාම්පුවක් තියෙනවා. ඒකෙ බල්බ් එක ඉක්මනින්ම, හෙට

අනිද්දම සවි කරල දෙන්න කියල මම ඉල්ලා සිටිනවා. ඒ වගේම දැන් නිලධාරි මහත්මයෙක් ඉන්න නිසා අර කඩ පිලිබඳවත් සොයා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ප්‍රථමයෙන්ම අපේ ගයන්ත මන්ත්‍රීතුමියගේ උපන්දිනයට සුභාශිංසන එකතු කරනවා. එතුමියගේ සියලු වැඩ කටයුතු සාර්ථක වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, තල්ගස්වල මාර්ගය ඉදිරිපස අනවසර ඉදිකිරීම් කරල තියෙනවා. ඔබතුමත් ගියා. නමුත් කිසිම දෙයක් සිදු වෙලා නැහැ. RDA එකෙන් ගලවන්න කිව්වා. නමුත් තවම ඒ විදියමයි. කොටසකට කරන්න පුළුවන් කොටසකට බැහැ. අන්න ඒකට විසඳුම මොකක්ද කියලා ඉල්ලනවා. ඒ වගේම සභාපතිතුමනි, තල්ගස්වල සර්වෝදය ගොඩනැගිල්ල ග්‍රාම සංවර්ධනයට පවරා දෙන්න කියලා ඉල්ලුවට එහෙම දෙන එක සුදුසු නැහැ. ගොඩනැගිල්ලේ පුස්තකාලයක් දැමීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ උසාවි වලින් ලැබෙන මුදල් තවම ලැබිලා නැහැ. ගරු ලේකම්තුමියනි, අපට ඒ ගැන කිසිම උත්තරයක් ලැබුණේ නැහැ. ඒ වගේම පියල් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට වතුර බහින්නේ නැති තැන් අපි මාස 11ක් තිස්සේ කිව්වා. ඒ වගේම අබේසුන්දර මහතාගේ නිවස ඉදිරිපිට මලගෙයක් සිදු වුන වෙලාවේ මෝටර් දෙකක් දාලා තමයි පාරේ වතුර ඉවත් කළේ. අන්න ඒ වගේ තත්වයක් තියෙනවා. එතන තියෙනවා ගගට බහින්න තොටුපලවල්. ඒක තවම හදලා දුන්නේ නැහැ. දියවර ගම්මානයෙත් ඒ වගේ තත්වයක් තියෙනවා. දැන් දැඩි වර්ෂාපතනය නිසා ළමයින්ට පාසල් යැමේදී මහත් අපහසුතාවයක් ඇති වුණා. සපත්තු මේස් ගලවගෙන තමයි දරුවන්ට ඉස්කෝලේ යන්න සිදුවුණේ. නමුත් ඒ ගැන කිසිම සැලකිල්ලක් දැක්වුවේ නැහැ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා බෝ නොවන රෝග පරීක්ෂාවක් සිදු කළා. අපි සායනයක් පැවැත්තුවා. මම සතුටු වෙනවා. අපේ මන්ත්‍රීතුමිය කතා කරලා එන්න ඕනද කියලා ඇහුවා. මම කිව්වා එන්න කියලා. එතුමියට කුමක් හෝ වැඩකටයුතු නිසා එන්න බැරි වෙන්නැති. ආවේ නැතත් මම ස්තුතිය පුදකරනවා. ගරු සභාපතිතුමනි, පොදු වැඩක් කරනකොට සභාවක් හැටියට සියලු දෙනා එකතු වෙන්න ඕන. ඒ වගේම කටුපොල් සම්බන්ධව කතා කිරීමේදී, කටුපොල් වගාවේ දී මේ උද්ඝෝෂණ විහිලුවක් කිව්වා. මේවා විහිළු නෙවෙයි. අපි ඒ කරපු වැඩෙන් නාගොඩ කටුපොල් වගාව නැවැත්තුවා. තල්ගස්වල නැවැත්තුවා. දැන් කුරුඳු පැළ දාලා තියෙනවා. පොල්පැල , තේ හිටවනවා. අපි උද්ඝෝෂණයෙන් ඇත්තටම ජයග්‍රහණයක් ලැබුවා. ඒ ගැන අපි සතුටු වෙන්න ඕන. අනිත් එක තමයි අපේ සහබන්දු මන්ත්‍රීතුමා කිව්ව වගේ, ව්‍යාපාර බලපත්‍ර දෙනවට අපි විරුද්ධයි. මෙච්චර දගලන්නෙ, එපාය කියන්නේ අනාගතයේ ඉන්න දරුවන් හින්දා. මේ දරුවන් ගේ සුව දුක් නිසා තමයි අපි මෙතනට ඇවිල්ලා ඉන්නේ. නැතුව මෙතනට ඇවිල්ලා නිදාගෙන ඉඳලා ගිහින් වැඩක් නැහැ. ඒ නිසා මේ කාරණා විහිළුවට ගන්න එපා. ගරු සභාපතිතුමනි, ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, අර්ථකථනය වැරදි වෙන්න පුළුවන්. නමුත් අපට ඇහුණේ ඒ විදියට. අනිවාර්යයෙන්ම අපි විහිළු කරන්නේ නැහැ. ඔබතුමා හිතුවට විහිළුවක් නෙවෙයි. එමෙන්ම පියල් මන්ත්‍රීතුමා කිව්වා වගේ අපේ පන්සලේ 30 වෙනිදා ලොකු උත්සවයක් පැවැත්වෙනවා. ඒ සඳහා කම්කරුවන් සහ විදුලිය ලබාදෙන්න ඔබතුමා පොරොන්දු වුනා. ඔබතුමාගෙන් ඒ කටයුත්ත සිදු වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒවගේම තව වීදි ලාම්පු දෙක තුනක් දාගන්න තියෙනවා. ගරු සභාපතිතුමනි, සාධාරනව හිතල බලලා සියලුදෙනාටම සාමූහිකව

වැඩ කටයුතු කරමුයි කියා ඔබතුමාගෙන් ඉල්ලා සිටින අතර, තව කතා කරන්න මන්ත්‍රීවරුන් ඉන්නවා. මගේ කතාව අවසන් කරනවා. ඔබ සියලු දෙනාටම ස්තූතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමනි, මුලින්ම අවධානය යොමු කරන්න ඕන. උඩුගම නගරය පිළිබඳව. මොකද උඩුගම නගරයේ කලින් තිබුන සුන්දරත්වය දැන් කෙමෙන් වියැකී යනවා. උඩුගම නගරය කුණු ගොඩක් බවට පත්වෙලා තියෙනවා. මීට කලින් හිටපු සියලුම සභාපතිවරුන් ඉන්දැද්දි උඩුගම නගරය පිරිසිදු කිරීමේ යම්කිසි වැඩපිළිවෙළක් තිබුනා. ඒ සඳහා කම්කරුවන් කීපදෙනෙක් හෝ අඩුතරමේ යොදවල තිබුණා. දැන් මේ වෙද්දී ඒ කටයුතු සිදු වෙන්නේ නැහැ. උඩුගම නගරයේ කඩවල් වල එකතු වෙලා තියෙන කුණු ටික සභාවෙන් ගිහින් ගන්නවා. නමුත් නගරය පිරිසිදු කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ පිළිබඳව සභාවේ අවධානය දැඩිව යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම අලුතින් පාර ඉදි කිරීමත් එක්ක ඉදිකරලා තියෙන තාප්ප වල පෝස්ටර් අලවලා තියෙනවා. ඉතින් මේ පිළිබඳ සැලකිල්ලක් යොමු කර උඩුගම නගරය ලස්සන නගරයක් කරල දෙන්න දායකත්වය ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඊලඟට කියන්න ඕන. උඩුගම ජනතාව මුහුණ දෙන ගැටලුවක් තමයි උඩුගම නගරයේ වටරවුමක් නැහැ. හැබැයි ඉතින් අඩියෙන් අඩියට පොලිස් නිලධාරීන් දහයක් විතර ඉන්නවා. දඩ ගහනවා. පහුගිය වසරේ ආදායම විසිපන් ලක්ෂ හැත්තෑපන් දහස් ගණනක්. ස්ථානීය දඩ මුළු ප්‍රමාණය ලක්ෂ හතළිස් අටක්. එතකොට ඒ මුදල් සභාවට ලැබිලත් නැහැ. ඊට පෙර වසරවල් වල ඒවා තමයි ලැබිලා තියෙන්නේ. මේක ජනතාවට විශාල පීඩනයක්. පහුගිය සභාවාරයේදී තරංග මන්ත්‍රීතුමා මේ පිළිබඳ කතා කළා. උඩුගම දවුල්හේන ප්‍රදේශයේ තිබුන මළගෙදරකට ඊට ගෙවල් දෙහෙකට විතර එහා මනුස්සයෙක් හෙල්මට් එකක් දාගෙන නැතිව ගිහිල්ලා තියෙනවා. මොකද මළගෙවල්වල හෙල්මට් නැතිවීමේ ප්‍රවණතාවයක් තියෙනවා. නමුත් මළගෙදර අවසන් කටයුතු සිද්ධ වෙද්දී, පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා, නිලධාරීන් කිහිපදෙනකු සමග ගිහින් ඒ මිනිස්සුන්ගෙන් දඩ ගහලා, ඒ මිනිස්සු පොලිසියට අරගෙන ගිහිල්ලා තියෙනවා. නමුත් මහා පරිමාණයෙන් රජයේ වතු සමාගමේ ඉඩම් අල්ලනවා. ඒ සම්බන්ධව සොයා බලන්නේ නැහැ. ඒ විතරක් නෙවෙයි. පසුගිය දවස්වල ගංජ අල්ලලා ඒ ගංජ අයිතිකාරයත් නිදහස් කරලා තියෙනවා. ඉතින් මේ විදිහට පොඩි මිනිහා සොය සොයා ක්‍රියාත්මක වෙන පොලිසිය හොයන්නෙ රථවාහන සම්බන්ධව විතරද කියලා ගැටලුව අපේ ප්‍රදේශයේ ජනතාවට පැන නැගිලා තියෙනවා. ඉතින් ඒ පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ පිළිබඳව අපට කරන්න පුළුවන් දෙයක් තියනවනම් කරන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම මට තව දෙයක් මතක් කරන්න ඕන. කැටගොඩ බස් නැවතුම්පොළ අසල මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් ඉදිකරන ලද ඉතාම අපිරිසිදු තත්ත්වයේ වැසිකිලියක් තියෙනවා. ඒක නඩත්තු වෙන්නෙ නැහැ. කැටගොඩ බස් නැවතුම්පොළට නෙළුව, තවලම, දෙල්ලව, මිල්ලව, අකුරැස්ස, ගාල්ල, කොළඹ ආදී ප්‍රදේශ කරා ගමන් කරන විශාල මගී පිරිසක් නිරන්තරව එකතුවෙනවා. එම මගීන්ට පාවිච්චි කරන්න වැසිකිලියක් නැහැ. ජල සැපයුම තිබිලත් නැහැ. තිබුණත් ටැංකිවලට පුරවන්න කෙනෙක් නැහැ. ඒක බාර ගනිපු කෙනෙක් නැහැ. අපට අයිති නැති උනත් මේ සම්බන්ධව ප්‍රාදේශීය සභාවක් විදියට අපටත් යම්කිසි වගකීමක් තියෙනවා. එනිසා සභාවෙන් හෝ කටයුතු භාරගෙන වැසිකිලිය පාවිච්චි කිරීමට හැකි ආකාරයෙන් පවත්වා ගෙන යන්න කටයුතු කරන්න. ඒ

වගේම උඩුගම බාරහන්දියෙත් වැසිකිලි පහසුකම් නැහැ. ඒ නිසා කැටගොඩ බස් නැවතුම්පොළේ තියෙන වැසිකිලිය සකස් කරන්න කියල මම විශේෂයෙන්ම අවධානය යොමුකරනවා.

ඊළඟ කරුණ විදියට සදරුස්ගම ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරපු ක්‍රීඩා පිට්ටනියක් තියෙනවා. කියන්න කනගාටුයි. අපේ පාලන සමයේ වෙන්න ඕන. මේ ක්‍රීඩා පිටියට පාරක් සුද්ද කරන කුණු ටික බාලා තිබුනා. දැන් ඒ පිට්ටනිය කුණු දමන තැනක් බවට පත් වෙලා තියෙනවා. ඒ පිළිබඳව අවධානය යොමුකරන්න. ඒ පිට්ටනිය සුද්ද කර දෙන්න කටයුතු කරන්න කියලා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම මම දැනගන්න කැමතියි. සභාපතිතුමනි, JCB යන්ත්‍රයේ තියෙන අඩුපාඩු මොනවද? JCB යන්ත්‍රය සකස් කරන කටයුතු සිදු වෙන්නේ කොහොමද කියලා දැනගන්න කැමැතියි. JCB යන්ත්‍රයේ අඩුපාඩු සම්බන්ධව යම්කිසි පරීක්ෂණයක් කළා ද? ඒ වගේම උඩුගම උපකාර්යාලයේ JCB යන්ත්‍ර ඇතුළු යන්ත්‍ර භාර දෙනකොට තිබුන තත්ත්වයන් පිළිබඳව ඡායාරූප තියෙනවා. මම ඒවා ඉදිරිපත් කරන්නට පළමුව දැන ගන්න කැමතියි.යම් කිසි අඩු වීමක් සිදුවෙලා තියෙනවාද? මොකක්ද සිදුවෙලා තියෙන්නෙ කියලා.

ඒ වගේම තව දෙයක් සභාපතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. මේ වෙනකොට උඩුගම ඉන්ධන පිරවුම්හලට 214082.00 ක හිඟයක් තියෙනවා. ඉන්ධන පිරවුම් හලකින් ආයතනයකට යම්කිසි මුදලක් ලබා දෙන්නේ, ආයතනයකට යම්කිසි order එකක් ඇතුලත. නමුත් අපේ සභාවට තියෙන විශේෂ අනුග්‍රහය හැටියට ඒ කිසිම දෙයක් නැතුව තෙල් නිකුත් කිරීම සිදු කරලා තියෙනවා. නමුත් ඉන්ධන පිරවුම්හලට මේ වෙනකොටත් ගෙවීම් සම්බන්ධව කිසිම දෙයක් කෙරෙන්නේ නැහැ කියලා දැනුම් දෙන්න කියලා දැනුම් දුන්නා. එය සභාවට අපකීර්තියක්. ඒ පිළිබඳව සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවක් තිබුනා. ඒත් සමීක්ෂණයේ අඩුපාඩු මොනවද කියලා අපේ සභාව දැනුවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. සභාවේ ඉන්වෙන්ට්‍රිවල තියෙන ඒවා, මොනවද අඩුවෙලා තියෙන්නෙ, මොකද වෙන්දේසියකුත් සිද්ධ වුණා. ඉතුරු භාණ්ඩ පිළිබඳව අපි දැනුවත් වීමක් සිදු වුණේ නැහැ. ඒ පිළිබඳව අපව දැනුවත් කරන්න.

ඒ වගේම, පසුගිය ටිකේම පොල් ඉඩම හා එමගින් ලැබෙන ආදායම පිළිබඳව කතා කළා. පසුගිය සභාවල හිටපු සභාපතිවරු කිහිප දෙනෙක්ම මෙතන ඉන්නවා. මම දැනගන්න කැමතියි. පසුගිය 2011, විශේෂයෙන්ම මගේ පියාගේ කාලයට පෙර හිටපු සභාපතිවරු ඉන්දැද්දි, පොල් ඉඩමේ ආදායම කීයක් තිබුණද? කියලා ඇත්ත කතාව ඊට කලින් පොල් ඉඩමේ ආදායම සභාවට ගත්තේ නැහැ. පොල් ඉඩමෙන් ආදායම පලවෙනි වරට සභාවට අරගෙන දුන්නේ හිටපු සභාපති හේමචන්ද්‍ර විලේගේ වන මගේ පියා කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕන. මොකද සමහර මන්ත්‍රීවරුන් කතා කරපු විදිහෙන් මට තේරුනේ, ඒකෙ යම් කිසි විදිහෙන් පොල් ඉඩමේ පොල් වල අක්‍රමිකතාවයක් සිදු වූ බවයි. එහෙම අක්‍රමිකතාවයක් කරන්න අවශ්‍ය නම්, ඒක සභාවට පවරා ගන්න කිසි අවශ්‍යතාවයක් නැහැ. ඒ පොල් ඉඩමේ පොල් ටික කඩාගන්න ඒ අවශ්‍ය බලය තියෙන කෙනෙකුට හෝ ඒ ගමේ මිනිස්සුන්ට හරි අවස්ථාව තිබුණා. නමුත් සද්භාවයෙන් කරපු ඒ ක්‍රියාව පිළිබඳව මම සොයා බැලුවා. පොල් ඉඩහ ශුද්ධ කරලා ඇප්තොප්වත්තෙ ඒ ආශිතව තිබුණ තේ ඉඩමක් ලබාගත්තා. තේ ඉඩමෙ ආදායම පවා ලබාගත්තේ ඒ ප්‍රදේශයේ අය. නමුත් ඒ සියල්ල නතර කරළා, ඒ සියල්ල සභාවට අරගෙන දෙන්න මගේ පියා කටයුතු කළා. ඒ පිළිබඳ මම මේ සභාව දැනුවත් කරන්න ඕන. මොකද අද එතුමා නැහැ. එතුමා වෙනුවෙන් කතා කිරීම මගේ යුතුකම. ඉදිරියේදීත් මේ සභාවේ ඉදිරිපත් වුණ ප්‍රශ්න සහ චෝදනා වලට සාක්ෂි සහිතව මම පිළිතුරු දෙන්න සූදානම්. ඒ පිළිබඳව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා, සියළුම මන්ත්‍රීවරුන්ගෙන් සහ මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. පළමු කොටම අපේ ගයන්ති මන්ත්‍රීතුමියගේ උපන්දිනය වෙනුවෙන් ලබා දුන් තේ පැන් සංග්‍රහය පිළිබඳ එතුමියට ස්තූතිය පුදකරන ගමන්ම, සුභම සුභ උපන් දිනයක් කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම මම සතුටුවෙනවා. අද දවසේ ගම්පෙරළිය වැඩසටහන යටතේ බොහෝ දේවල් මේ අවස්ථාවේදි කියවුනා. ගමින් ගමට, කොට්ඨාසයෙන් කොට්ඨාසයට ඒ කරනු ලබන සංවර්ධන කටයුතු පිළිබඳව අපි සතුටු වෙනවා. ඒ කෙසේ වෙතත් ඒ සංවර්ධන කටයුතු වලදී කණගාටු වියයුතු තැන් තියෙනවා. මොකද මම හිතනවා. යම් විදියකින් මේ මාර්ග නවීකරණය කිරීම හා සංවර්ධනය කිරීම පිළිබඳව තෝරාගන්නා ලද පාරවල් පිළිබඳව බොහොමත්ම කණගාටු වෙන්න වෙනවා. විශේෂයෙන්ම මම බොහෝ වෙලාවට කොට්ඨාසයක් හැටියට ගත්තම, බෙහෙවින්ම ජනතාව වෙසෙන ප්‍රදේශවල පාරවල් ඉස්සරවෙලාම හදනවා. නාගොඩ මොන පෙරලි යටතේ හරි කමක් නැහැ. සංවර්ධන කටයුත්තක් ඉෂ්ට සිද්ධ වෙනවා නම් අපි බොහොමත්ම සතුටු වෙනවා. මම ඒක කියුවෙ නාගොඩ වත්ත වළකුඹුර මංසන්ධියෙන් ගත්තට පසුව 70 කන්ද පියසෙන් ගම්මානය, සංවර්ධන ගම්මානය, විනි මුල්ල ප්‍රදේශය සහ බෙම්බඩ යන ප්‍රදේශ තුළ වෙසෙන විශාල ජනතාවක් ගමන් ගන්නා පාරක් තියෙනවා. මේ පාර පිළිබඳ කිසිම සංවර්ධනය කටයුත්තක් මේ වෙනකම් ක්‍රියාත්මක වෙලා නැහැ. මම මේ අවස්ථාවේදී කියාසිටින්නේ වැඩිපුර ජනතාව ප්‍රයෝජනයට ගන්නා පාරවල් පිළිබඳව අවධානය යොමු කරමින්, ඒ පාලකයන්ගේ අවධානය යොමුකරවලා මේ කටයුත්ත සිදු කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වගේම පසුගිය සභා වාරේ අපේ ඉනෝකා මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළා. කැප්පිටියාගොඩ පාලම ලඟ, විදුලි පහන පත්තු වෙන්නේ නැහැ කියන එක. ඒ පිළිබඳව අපට දැනුම් දීම පිළිබඳ සතුටු වෙනවා. ඒකේ යම්කිසි කාර්මික දෝෂයක් තිබිලා ඒ විදුලි බල්බය පත්තුවුණේ නැහැ. එදිනම අපි අපේ සභාපතිතුමාට යොමු කිරීමෙන් පසුව එතුමා ඒ පිළිබඳ සොයා බලා ඒ කටයුතු ඉටු කරලා දුන්නා. ඒ නිසා මේ අවස්ථාවේදී අපේ ගරු සභාපතිතුමාට ස්තූතිය පුදකරනවා. අද දවසේ අපට තේ පැන් සංග්‍රහයක් ලබා දුන් ගයන්ති මන්ත්‍රීතුමියට නැවත වතාවක් ස්තූතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රීනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන්ද, ලේකම්තුමියගෙන්ද, සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. එමෙන්ම මම ගයන්ති මන්ත්‍රීතුමියට සුභ උපන්දිනයක් කියල ප්‍රාර්ථනා කරනවා. මුලින්ම කියන්න ඕන. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මංමාවත් සභාවට පවරගැනීම සඳහා සඳහන් කරල දෙන්න කියලා අපට ලියුමක් එවලා තිබුනා. නමුත් අපි නවක මන්ත්‍රීවරු විදිහට සභාවට තියෙන පාරවල් දන්නෙත් නැහැ. සභාවට අයිති නැති පාරවල් දන්නෙත් නැහැ. ප්‍රදේශයේ මංමාවත් ගැන සඳහන් කරල යවන්න ඒ ගැන දැනගන්න ඕන. ඒ වගේම හෙට දින උඩවැලිවිටිය ක්ෂේත්‍රාරාම විහාරස්ථානයේ පින්කම් මාලාවක් තියෙනවා. ඒ නිසා ප්‍රදේශයේ තියෙන මාන පඳුරු ටික ඉවත් කර හෙට දිනට අවශ්‍ය විදියට සුද්ද කරල දෙන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම ප්‍රජාශාලාවේ මේ වන විට සභාව කියලා පවර කියලා දැනගන්න කැමතියි අද උදෙත් ප්‍රජාශාලාවෙ විදුලිය කපන්න කියලා විදුලිබල මණ්ඩලයෙන් ගියා. ඒ ගැනත් සඳහන් කරමින්, මගේ කතාව අවසන් කරනවා. සියලුදෙනාට ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ඇත්තටම සභාපතිතුමනි, මේ සභාව පත් වෙලා අවුරුද්දක් වගේ කාලයක් ගත වෙන මේ මොහොතේ දිගින් දිගටම මේ සභාවේ වෙනස්කම්, සිදුවිය යුතු වෙනස්කම් ගැන හා ප්‍රදේශයට වෙන්න ඕන සේවාවන් ගැන දිගින් දිගටම කතා කලා. ගරු සභාපතිතුමනි, මේ සභාවෙ සමහර දේවල් ,අපේ ඉල්ලීම් ගැන ලබා දෙන දායකත්වය, අනුග්‍රහය ඉතාම

අඩුයි. අද දිනයේදී බාහිර ප්‍රශ්න කතා නොකළත්, මේ සභා වාර්තාවේ යම් අඩුපාඩුවක් තියෙනවා. මුල් අවස්ථාවේ කියන්න බැරිවුනා. සභා වාර්තාවේ අපි වෙනත් කරුණු යටතේ කතා කරගෙන ගියාම, අඩුපාඩු නිසා සභා වාර්තාවෙන් සම්පූර්ණ අර්ථය වෙනස් වෙලා තියෙනවා. මොකද මම උදාහරණයක් කියන්නම්. අපේ චන්ද්‍රසිරි වනිගරත්න මන්ත්‍රීතුමා පාසලේ සිදුවුණු අඩුපාඩුවක් ගැන කතා කලා. එතුමාගේ කතාව යටතේ කියාගෙන යනකොට බැලුවම එකේ අවසානයේ එතුමා වාඩි වුණාට පස්සේ, මම නැගිටලා කතා කළා. ඒ සඳහා අපේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් ඒකට අනුග්‍රහය ලබාදෙන සූදානම් කියලා. ඒ අවස්ථාවේදී එතුමා ආපහු නැගිටලා කිව්වා. මට සමාවෙන්න. ඊයේ දිනයේ වෙනකොට මනුෂ නානායක්කාර මැතිතුමා ඇවිල්ලා ඒ වැරද්ද නිවැරදි කළා. ඒ පහසුකම් පාසලට ලබා දුන්නා කියලා. නමුත් මේ වාර්තාව කියාගෙන යනකොට තියෙන්නෙ ඒක නෙවෙයි. මේ වාර්තාවේ තියෙන්නේ එතුමා කතා කරලා ඉවරවෙලා වාඩි වුණාට පස්සේ ආයෙමත් ඒකෙම කොටසක් විදියට තමයි අවසාන තියෙන්නෙ. එකෙන් සම්පූර්ණ මේ සභාවේ සිදු වන සිද්ධිය නෙවෙයි වාර්තා ගත වෙන්නේ. මම කිව්වේ උදාහරණයක් විතරයි. මේ වාර්තාවේ කතා සීයට සීයක්ම අපි කියවන්නෙ නැහැ. නමුත් මම හොඳටම බැලුවා. ඒ කොටස මේකෙ තියෙනව ද කියලා. මේක අදට විතරක් නෙවෙයි. දිගින් දිගටම ට මේ වාර්තාව නිවැරදි කරන්න නෙවෙයි. කරන්නන ඕන මේ ක්‍රමය නිවැරදි කරන්න. නමුත් අපි දිගින් දිගටම අපි අඩුපාඩු පෙන්නලා දෙන ඒවා පිළිබඳව සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. ඒ නිසා ඒ ආකාරයට සිද්ධ වෙන්න දෙන්න එපා. වාර්තාව අඩුපාඩු නිවැරදි වුණා කියලා ලබන සැරේ වාර්තාවෙ සටහන් වෙයි. ඒකෙදි අපි කරපු දේ නෙවෙයි එයා කතා කරගෙන ගිහින් තියෙනවා. අර එතුමාව ගත්තා මට ඒ වෙලාවේ කියන්න බැරිවුනා කියලා පස්සෙ අපි ඒක මතක් කරාට පස්සේ නමුත් ඒ වගේ අඩුපාඩු මේ සභාව වෙලා තියෙනවා. නිවැරදි වෙච්ච කතාව කිව්වේ නැහැ. අපි ඒක මතක් කළා. ලබා දෙන්න සූදානම් කියලා, කිව්වට පස්සේ තමයි. එතුමා කිව්වේ. එක අඩුපාඩුවක් විදියට ඔබතුමා සළකන්නේ නැති නම් මම දන්නේ නැහැ. මොකක්ද අපි මේ කතාකරන එක, තේරුමක් තියෙනවද කියලා.

එවගේම මීට කලින් ඔබතුමාට මතක ඇති 15 වෙනිදා ඔයිල් ෆාම් කම්හලට යන්න කියලා, ඔබතුමාලා අපිට ලියුමක් එවනවා. අපිට පෙබරවාරි 15 වැනිදා උදේ 9.00 ට ප්‍රදේශීය ලේකම් කාර්‍යාලයට පැමිණෙන්න කියලා. එම ඔයිල් ෆාම් කම්හල තියන කොටස නියෝජනය කරන මන්ත්‍රී වරයා විදියට මමත් ආවා. නමුත් මෙතනට ඇවිල්ලා ඒ ගැන සොයා බලන කොට මෙතන කිසිම සූදානමක් නැහැ. ඔබතුමාට දුරකතනයෙන් ඇමතුමක් ගත්තම, ඔබතුමා ඔයිල් ෆාම් කම්හලේ කිව්වා. මම කියන්නේ වැරදීම් වෙන්න පුළුවන්. නමුත් මේවා අත්වැරදීම් නෙවෙයිනේ. සභාපතිතුමනි මෙන්න සභාවේ ලේකම්තුමිය අත්සන් කරපු ලියුම තියෙනවා. ඔබතුමාලා ඔයිල් ෆාම් කම්හලට ගිහිල්ලා එනකොට අපි ගියහම එතන ඉන්න අය හිතෙනවා අපි පරක්කු උනේ ඇයි කියලා. ඇත්තටම ඉතාමත් උනන්දුවෙන් තමයි අපි සහභාගි වුණේ. සභාපතිතුමනි මේ ලියුම් වල මෙහෙම තියනවනම් හා වාර්තාව මෙහෙම නම්, අනිත් කාර්යයන් ගැන මොන කතාද? මේවා මීට වඩා මේ ගැන අවධානය යොමු කරන්න. මම උදා සභාවේ කටයුතු ගැන උදාහරණයක් දෙකක් කිව්වේ අඩුම තරමේ ෆෝන් එකකින් කෝල් එකක් දීල කිව්ව නම් මෙහෙට එන්න කියලා. එහෙනම් කමක් නැහැ. කිසි වැඩසටහනක කිසි පිළිවෙළක් නැහැ. අපි හගරන්වල තියෙන ඔයිල් පාම් කම්හල ගෙන කතා කළා මම දන්න විදිහට මේක මාසෙකට රුපියල් ලක්ෂ 1500 විතර ආදායමක් ලබන ආයතනයක් විදිහට තමයි අපි අඳුනගෙන තියෙන්නෙ. කොහොමහරි මේ සභාවේ කිසිම බලපත්‍රයක් නැතුව තමයි අවුරුදු දෙක තුනක් තිස්සේ මේ කර්මාන්තශාලාව පවත්වාගෙන යන්නේ. අඩුම තරමින් මෝටර්සයිකල් හෝදන තැනක් තියෙනව නම් එතනට බලපත්‍රයක් ගන්න පරිසර බලපත්‍රය ඕන. නමුත් මේ කිසිම බලපත්‍රයක් නැතුව මේ මහා පරිමාණ සමාගමකට අපි දීලා තියෙන අවස්ථාව වැඩියි. නමුත් ඒ අවස්ථාව නිවැරදි කරගන්න ඒ අය දිනයක් දීලා පෙබරවාරි 15 හරි මාර්තු 15 හරි ඒක කරන්නම් කියලා. නමුත් එතනදී අපි තව දින දෙනවා. නමුත් මේ සභාවක් විදියට මේ මන්ත්‍රීවරු විරුද්ධ වෙද්දීත් මෙතෙන කියවෙන්නෙ ලබන

මාසෙ 15 වෙනකන් අපි මේක දීලා ඉවරයි කියලා. නමුත් ඒ වගේ දේවල් වෙනවා නම් අපට හිතෙනවා සභාවේ මන්ත්‍රීවරුන් නොමග යවලා කරන වැඩක් කියලා. සභාපතිතුමා මේකට සම්බන්ධ ද නැද්ද කියලා මම දන්නේ නැහැ. යම් ආකාරයකින් මොකක්හරි වැරැද්දක් වෙනවා. මේකට වක්‍රව උදව් කිරීමක් වෙනවා. බලපත්‍ර නැති කම්හලක් වෙනුවෙන් ඇයි අපි මෙච්චර අවස්ථාව ලබා දෙන්න කියලා. ඒක අපට ගැටලුවක්. මොකද ඉතිහාසය අපි අහල තියෙන දේවලුත් එක්ක වර්තමානයේ අපි ඔබතුමා විශ්වාස කරනවා. ඒ වගේම දැන් මේ වෙන සිද්ධිත් එක්ක අපට හිතෙනවා දවසින් දවස මේ සභාවත් එක්ක වෙනත් ගනුදෙනුවක් තියෙනවද කියලා. මේක වෙනවට නෙවෙයි. නමුත් ඔබ තුමාලා සද්භාවයෙන් ක්‍රියා කරනවා කියලා අපි විශ්වාස කරනවා.

ඒ විශ්වාසය මත තමයි අපි දැනට කටයුතු කරන්නේ. නමුත් මේ සභාවෙන් ඒක වෙන්නෙ නැත්නම්, අපි පෞද්ගලිකව අපට පුළුවන් ආකාරයට මේකට විරුද්ධ වෙලා, ජනමාධ්‍ය හරහා හරි යම් ආකාරයකට මේ විරුද්ධ වීම් මීටත් වඩා කරනවා. මොකද මේ සභාව ගැන ලොකු විශ්වාසයකින් අපි මෙතනට එන්නේ. නමුත් ඒ කටයුතු එකක්වත් සිදු වෙන්නේ නැහැ.

ඒ වගේම සභාපතිතුමනි, අපි මේ සභාවේ අවුරුද්දක් පුරාවට ඉල්ලීම් කළා. පොදු අරමුදලින් වියදම් කරනවා නම්, සභාවෙ මන්ත්‍රීවරු 27 දෙනාටම එක හා සමානව සලකන්න කියලා. ඔබතුමාට ඒකට අවශ්‍යතාවය තිබුනට, අද වෙනකම් එක ක්‍රියාත්මක වුණේ නැහැ. මේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් බලාපොරොත්තුවෙන් ඉන්නවා පාලක පක්ෂයේ මන්ත්‍රීවරු කරනවා වගේම තමන්ගේ යෝජනාවකුත් මේ පොදු අරමුදලෙන් කරන්න. මම දන්න තරමින් ලංකාවේ හැම ප්‍රාදේශීය සභාවකම එහෙම තමයි වෙන්නේ. එක්කෙනෙකුට රුපියල් ලක්ෂය ගණන් වියදම් කරනවා නම්, 27 දෙනෙක් ඉන්නවනම් 27 දෙනාටම ඒ අවස්ථාව දෙනවා. නමුත් කණගාටුයි. ප්‍රාදේශීය සභාවේ විපක්ෂ මන්ත්‍රීවරුන්ට රුපියල් දාහක් වියදමක් පොදු අරමුදලින් වියදම් කරලා තමන්ගෙ කොට්ඨාශයට දෙයක් කරන්න මේතාක් අවස්ථාව ලබාදීලා නැහැ. පිට ප්‍රාදේශීය සභා එක්ක අපි කතා කරනවා. ඒ සභාවල තත්වය මීට වඩා වෙනස්. එනිසා ඒ ගැන සොයා බලා කටයුතු කරන්න. ගරු සභාපතිතුමනි ඔබතුමා මෙහෙමවත් කරනවා කිව්වට, විපක්ෂ මන්ත්‍රීවරුන්ට පොදු අරමුදලින් කල දෙයක් කියන්න. ඔබතුමා කොට්ඨාශයෙන් පොදුවේ යෝජනා ගන්න. මගේ කොට්ඨාශයේ මේ අවුරුද්ද පුරාවට අද තමයි යෝජනා දෙකක් සම්මත වුනේ. මම සතුටුයි ඒකට. නමුත්, ඒකවත් වෙන්නේ නැති එක ගැන අපි කණගාටුවෙනවා. නමුත් ගම් වල ප්‍රශ්න අපිත් ඉදිරිපත් කරනවා. ඔබතුමාලා කිසිම සැලකිල්ලක් දැක්වුවේ නැහැ. නමුත් ඔබතුමාලට අපේ විෂයභාර ඇමති තුමා හැටියට පළාත් පාලන ඇමතිතුමා ඉන්නවා. කවදාවක්වත් එහෙම කරල නැහැ. එතුමා ඔබතුමාලට උත්සවවලට ආරාධනා කරනවා. පාදේශීය සභාවට යම් යම් භාණ්ඩ උපකරණ ලබා දෙන්න සූදානම් වෙලා ඉන්නවා. මේ අවුරුද්ද පුරාවට ඔබතුමාලා තීන්දු අරගෙන ඉවරයි අපි කරන්නේ නැහැයි කියලා. අන්න ඒ නිසා වෙන්න ඇති. මේ අවස්ථාව නැති වෙන්න ඇත්තේ. ගරු සභාපතිතුමනි, බෝපේ පෝද්දලට, නෙළුවට දෙනවනම්, මේ ප්‍රාදේශීය සභාව දිස්ත්‍රික්කයේ තියෙන, ඒවා ලබාගන්න පුළුවන් සුදුසුකම් තියෙන සභාවක්. මීට වඩා මේ විපක්ෂ මන්ත්‍රීවරු සැලකිල්ලක් දක්වනවා නම්, අපටත් හිතෙනවා දහසැරයක් ගිහිල්ලා හරි මේ වැඩේ කෙරෙන්න ඕන කියලා කියන්න. නමුත් මේ සභාවේ අවුරුද්දක් පුරා මොකක්ද මේ වැඩේ කියල හිතෙනවා. ඒ නිසා ඔබතුමා උනන්දුවක් දැක් වූවොත්, ප්‍රාදේශීය සභාවට මීට වඩා දේවල් ගන්න පුලුවන්. ඔබතුමා මේ කරන්නේ ජනතාවට කරන අසාධාරණයක්. මම මේ කියන්නේ ඉදිරි අවුරුදු 3 ඇතුළත, ඒවා නිවැරදි කර නොගත්තොත් ඔබතුමාලා ප්‍රදේශයේ ජනතාවට කරන අසාධාරණයක්. මම මේ ඔබතුමාට විතරක් නෙවෙයි පාලක පක්ෂයේ සියළුම දෙනාට කියන්නෙ. රැස්වීම්වලදී මීට වඩා සැලකිලිමත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමාලා අහනවනේ මේ ආණ්ඩුව වැඩ කරනවද කියලා. අද උදේ පැය භාගයකටත් වැඩි වෙලා කරන වැඩ ලේඛනයක් කියෙව්වා. ඒවා කරන වැඩ ලක්ෂ 20, 5, 10 ඒවා. ඉතින් නාගොඩ ප්‍රාදේශීය සභාවට තමයි මේ වැඩ කරන්නේ. ඔබතුමාලගේ

අනුමැතිය දීලා, මන්ත්‍රීවරුන්ට අධීක්ෂණය කරන්න කියලා, ඒ සහයෝගය දෙනවා වගේම, අනිත් කටයුතු සඳහා මේ ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදල විතරක් ඇයි ඔබතුමා විතරක් තනියෙන් පාවිච්චි කරන්නේ කියලා විමසමින්, මම ආයිත් විපක්ෂයේ සියලූ මන්ත්‍රීවරු වෙනුවෙන් ඒ ගැනත් සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම උක්ඕවිට ප්‍රාදේශිය සභාව තමයි පෙර පාසල් ඉතිහාසයේ ප්‍රධානම එක. ඒක දැන් ළමයි හැත්තෑවක් විතර ඉන්නවා. ඉතාමත් අවම පහසුකම් යටතේ ඒ පෙර පාසල පවත්වාගෙන යන්නේ. එකේ ළමයි 30 කට වගේ තමයි පහසුකම් තියෙන්නේ. මේ අවුරුද්දේදී පෙරපාසල පුරනැගුම ශාලාවට ගන්නවනම් එයට පහසුකම් දීලා, ඒ ගැලපෙන පරිසරය හදලා, ඒ ස්ථානයට ගන්න. එහෙම නැත්නම්, දැනට පෙර පාසල පවත්වාගෙන යන ස්ථානයේ ළමයින්ට අවශ්‍ය පහසුකම් දෙන්න. මොකද ළමයි ඉන්නෙ එළියෙ. දැන් වර්ෂාව නැති නිසා ප්‍රශ්ණයක් වුණේ නැහැ. නමුත් එහි පොඩි වැඩයි කරන්න තියෙන්නේ. දැනට තියෙන බිත්තිය කඩලා, ඒ බිත්තිය නැවත එළියෙන් බැදලා, දැනට තියෙන සියලු දේ පාවිච්චි කරල පෙරපාසල ලොකු කරල දෙන්න. දැන් නීතිය අනුව ළමයි විස්සකට එක වැසිකිලියක් තියෙන්න ඕන. අපි ප්‍රාදේශීය සභාවේ කියලා මහලොකුවට පෙරපාසල් පහළොවක් පාලනය කරනවා. නමුත් ඒ දරුවන්ට අවශ්‍ය පහසුකම් වත් අපි ලබාදෙන්නෙ නැහැ. ඔබතුමා ඒ පෙර පාසල් සඳහා නිල ඇඳුමක් ලබාදෙන්න කටයුතු කරලා තියෙනවා. ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. ඒවගේම මේ පෙර පාසලේ පහසුකම් ගැනත් සලකා බලන්න කියල ඉල්ලා සිටිනවා. මොකද දක්ෂ ගුරුවරු ටිකක් ඉන්නවා. ඒ වගේම ඒ පෙරපාසලට ලොකු ඉල්ලුමක් තියෙනවා. දක්ෂතාවයට තැන දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම කතා කරන්න බලාපොරොත්තු වුන දෙයක් විලේගේ මන්ත්‍රීතුමා කතා කළ නිසා මම ඒ ගැන කතා කරන්න ඕන නැහැ. ඉන්ධන පිරවුම්හලේ බිල ගේන්න ගියාම මටත් ඔය චෝදනාව ආවා. ජනවාරි 31 වෙනකොට තමයි අර දෙලක්ෂ දාහත් දහස් ගණනක හිගයක් කිව්වේ. පෙබරවාරි බිලත් අද එවල තියනවා. එතුමා යම් චෝදනාවක් කරනවා රජයේ ආයතනයක් විදියට, යක්කලමුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ පිරවුම්හලෙන් මේ තාක් කල් සේවාව සභාවට ලබා දුන්නෙ ඇප මුදලකින් තොරව. නමුත් අද වෙනකොට පෞද්ගලික පිරවුම්හලට ගිහිල්ලා තියෙනවා. ඒ විනිවිදභාවය කොහොමද කියලා අපි දන්නේ නැහැ. ඒ වගේම අර බිල් ගෙවන්න කටයුතු කරන්න. ගරු සභාපතිතුමනි නාගොඩ පිරවුම්හල ගත්තම සමහරවිට ගංවතුරෙන් යට වෙන්න පුළුවන්. නමුත් ඒ සම්බන්ධතාවය තියාගන්න ඕන. මොකද ගඟ අයිනෙ වගේ නෙවෙයි හදිස්සියකට අවශ්‍ය පහසුකම් සපයපු ආයතනය තරහ කරගන්නෙ නැතුව බිලගෙවනවා නම් හොඳයි. මම මූලාසනයට කියන්නේ ඒ ගැන හොයලා බලන්න කියලා.

අවසාන වශයෙන් සභාවට අයිති සුසාන භූමි, අද වන විට යම් යම් පිරිස් වගා කටයුතු සඳහා පාවිච්චි කරලා තියෙනවා. විශේෂයෙන්ම උඩුගම කුරුන්දෙ, අපේ වෙරංග මන්ත්‍රීතුමා දන්නවා. මන්ත්‍රීතුමාගේ ගේ ඉදිරිපිට ඇති සුසාන භූමියෙත් දැන් වැවිලි කටයුතු සිදු කරලා, ගෙවල් හදලා. ඒක අද ඊයෙ නෙවෙයි කාලාන්තරයක් තිස්සේ සිදු වුන වැරද්දක්. ඔබතුමාට කෙළින්ම චෝදනා කරනවා නෙවෙයි. නමුත් කවුරුහරි ලියුමක් එවූවම තමයි දන්නෙ, මේක සභාවට ගන්න පුළුවන් නේද කියලා. අනිත් දේවල් වගේම, පාරවල් වගේම, මේ සභාවට අයිති දේපල මොනවද කියලා මන්ත්‍රීවරු මුලින්ම ඔවුන්ව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටියා. එසේ දැනුවත් කිරීම් කරන්න. නැත්නම්, මේ වගේ ලිවුමක් ආවට පස්සේ තමයි මා හිතන්නේ සභාපතිතුමා දන්නෙත්. සභාවෙ දේවල් අපි දන්නෙත් නැහැ. ඔබතුමා දන්නෙත් නැහැ. තල්ගස්වල ප්‍රදේශයේ සභාවට අයිති ප්‍රජා ශාලාවක් තියෙනවා, එතකොට මෙතන සමෘද්ධිය සම්බන්ධ ශාලාවක් ගැන කිව්වා. ඒකෙ යතුර ඇයි අපි බාර නොගන්නෙ කියලා. නමුත් අපි ඒවයි නියම අයිතිය මේ වෙනකොට භුක්ති විඳින්නේ නැහැ. ඒකත් සභාවේ දේපළ. එක එක්කෙනාට ඕන විදියට යතුරු ඉල්ලගෙන ගියායි කියලා, ඒ අයට එක දිගට අවුරුදු ගානක් භාවිතා කරන්න

දෙන්නත් බැහැ. ඒනිසා ඒවා ගැන අවධානය යොමුකරලා, මේ සභාව ඉදිරියටත් සාර්ථකව කරගෙන යන්න මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම විදුලිය ගැන කතා කලා. ගරු සභාපතිතුමනි, විපක්ෂ කණ්ඩායමට ලබා නොදෙන නිසා, අපි අපේ මන්ත්‍රීවරු හරහා ඉල්ලපු සහ එතුමන්ලා මුදල් යම් ප්‍රමාණයක් මේ සභාවට ලබා දීපු ඒවටවත් අපට වීජී ලාම්පු ලබා දෙන්න කටයුතු කරන්න. මොකද ඒ පළාත් සභා මන්ත්‍රීවරුනුත් දේශපාලනයක් කරන්නේ, සභාපතිතුමනි ප්‍රදේශ වලට ගියහම, එතුමන්ලටත් ඉල්ලීම් තියෙනවා. අපි ලයිට් එකක්වත් හයි කරන්නෙ නැහැ කියලා අපිට කියනවා. ඉතින් සභාවෙන් අපට දෙන්නේ නැහැ කියලා අපි කියනවා. එතුමන්ලා එවිට සල්ලි දෙනවා. ඒ දෙන සල්ලිවලිනුත් ඔබතුමාලා හයි කරගන්නවද කියලා මම දන්නෙ නැහැ. අද වෙනකොට මටවත්, මේ විපක්ෂ කිසිදු මන්ත්‍රීවරයෙකුට ඒ පහසුකම ලබා දීලා නැහැ. අඩුම ගානෙ එතුමන්ලා දීපු මුදල් වලටවත් ලබා දෙන්න. මොකද එතුමන්ලාත් මේ අප්‍රේල් දහයෙන් පස්සේ විසුරවනවා. ඊළඟට මැතිවරණයකට මුහුණ දෙන්න වෙනවා. ඒ නිසා මේ කෙටි කාලසීමාව ඇතුළත ඒ කරුණු කෙරෙහි සිතා බලා ඒ දේවල් ඉටු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ගයන්ති මන්ත්‍රී තුමියට සුභ උපන් දිනයක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. ගරු සභාපතිතුමනි, මම මේ වෙලාවේ දීර්ඝ වශයෙන් කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට නම් පොඩි ප්‍රශ්නයක් තියෙනවා විසඳගන්න. ඉතින් පළමුකොටම ගයන්ති කුමාරී මහත්මියට සුබ උපන්දිනයක් වේවා කියලා සුබපැතුම් එකතු කරනවා. ඒ වගේම එතුමියගෙ සියලු කටයුතු, ව්‍යාපාර කටයුතු සාර්ථක වෙන්න කියලා ප්‍රර්ථනා කරනවා. දැන් මම ප්‍රාදේශීය ලේකම්තුමිය එක්ක කෙටියෙන් කතා කළා මොකක්ද මේ කියන එක සභාවට දැනුම් දෙන්න ඕනෙ නිසා. පළමු කොටම මම හිතන්නේ මේක සභාපතිතුමාට කියන්නේ අප වෙත පැවරිලා තියෙන වගකීම, සභාපතිතුමාට තියෙන වගකීම, ප්‍රාදේශීය ලේකම්තුමියට වත් දෙනවට මම විරුද්ධයි. ඒක නිසා මේකෙදි පූර්ණ තීන්දුවක් ගැනීමේ හැකියාව තියෙන්නේ. ඔබතුමාට මම එදත් කිව්වා, අදත් කියනවා. අපේ බලය අපි ප්‍රාදේශීය ලේකම් තුමාට, ගමේ ග්‍රාම නිලධාරී තුමාට යවනවා කියන්නේ අපේ නොහැකියාවක්. පුංචි මතක් කිරීමක් කරන්න අවස්ථාව ගන්නවා. ගෙන මම මේක කියවන්නෙ නැහැ. ප්‍රාදේශීය සභා පනත යටතේ තියෙනවා. ප්‍රාදේශීය සභාව කලින් ලබා ගත් කැමැත්ත නැතිව තමාගේ ඉඩමේ කරනු ලබන යම් ක්‍රියාවකින් යම් මාවතක වූ යම් කාණුවක් හෝ බෝක්කුවක් ඔස්සේ හෝ නිදහස් ජලය ගලා ගෙන යෑමට බාධා කිරීම මගින් නඩු පැවරිය හැකි බවයි. දැන් මේක කරලා අවසානයි. නඩු පවරන්න අධිකරණයට යන්න පුලුවන්. මේකෙ බලවතා ප්‍රාදේශීය සභාව හැරෙන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නොවෙයි. ඒක නිසා අපි ඊළඟ කාරණය කියනවා ප්‍රාදේශීය සභාවේ අවසරය නොමැතිව හෝ අවසර නියමයන්ට, කොන්දේසිවලට අනුකූල නොවන ක්‍රමයකින්, ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් යම් මාවතක, යමා මාවතක් ඔස්සේ හෝ මාවතක් යට හෝ මං මාවතක් මත කුළුනක්, ලාම්පුවක්, කම්බියක්, නලයක් වැටක් හෝ යම්කිසි දෙයක්, වැඩබිමක් ඉදි කිරීම, සිටුවීම සපුරා තහනම් වේ. මම මේ කාරණා දෙකයි කියන්නේ. මේකෙ දිගින් දිගටම තියෙනවා. ඉතින් ඒක නිසා මේ පනත තමයි පස්සේ අපි අධිකරණයට ගියහම නීතිඥ මහත්වරුන් ලවා නඩුකාර උන්නාන්සෙට කියවන්නෙ. දෙසැරයක් හිතන්න දෙයක් නැහැ. පක්ෂ-විපක්ෂ අපි සියලු දෙනාම මේ සඳහා එකඟයි. මේ ප්‍රශ්යන අපට විතරක් නෙවෙයි මේ පැත්තෙනුත් කියැවුණා. ඒ නිසා පැවරී තිබෙන බලතල අනුව අපි තීන්දුවක් ගමු කියලා මම කියනවා. මේ පාරවල් අහුරගෙන ඉන්නේ මාළිගාව වගේ ගෙවල් දොරවල් හදලා ගාලු නගරයේ පදිංචි වෙලා ඉන්න අය. ඒ අයට මේ පාරේ අවශ්‍යතාවය නැහැ. මේ පාරෙ අවශ්‍යතාවය තියෙන්නේ ගම්වල අහිංසක ගම්වැසියන්ට. මේ ගමේ ගෙවල් තුන්හාර දහසක් ආවරණය වෙනවා. සමහර වෙලාවට රෝගී මව්වරු, ගර්භනී මව්වරු ආදීන්ට මේ නිසා ලොකු විනාශයක් වෙන්නත් පුළුවන්. එහෙම වුණොත්

ව්‍යාපාරිකයන් වගකියන්නේ නැහැ. ඒකේ වගකීම සභාවට. ඒකයි මම මේ කියන්නෙ. මම මේ කියන වචනයක් නැර මම කතා කරන හැම පිටුවක්ම ව්‍යාපාරිකයන්ට යවන්න. මෙන්න මෙතනින් බේරෙන්න බැහැ කියලා. මේක ගමක් වෙනුවෙන්, ප්‍රදේශයක් වෙනුවෙන්, අනාගත පරපුර වෙනුවෙන් ඒ වගේම වතුකරයේ ජනතාව ගොවියෝ අහිංසක ජනතාව වෙනුවෙන් මම කතා කරන්නේ. ඒ වගේම මේ අයට ගන්න පුළුවන් ඉහළම වාහනේ තමයි ත්‍රීවිල් රථය. මටත් ඇති ප්‍රශ්නයක් නැහැ. මටත් සද්ද නැතුව ඉන්න පුළුවන්. මට මෙහෙම කතාකරන්න අවශ්‍යතාවයකුත් නැහැ. නමුත් තමුන්නාන්සේලට අමාරු දේ අපි කරලා තියෙන්නේ. මේ මොහොත වන විට ලක්ෂ දහයක් ඇවිල්ලා. ඉතුරු ලක්ෂ පහළොවක් එනවා. මේක ප්‍රාදේශීය සභා පාරක්. අපි මේක තාර ටික දාලා ආරම්භ කරනකොට තමුන්නාන්සේට ආරාධනා කරනවා. මේ ගෞරවය ප්‍රාදේශීය සභාවට අයිති වෙනවා. මාර්ගය නැහිනිගල මාර්ගය නැත්නම් අනෝමදස්සී මාවත කියලා මේකෙ බෝඩ් එක වදිනකොට, නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ට මේ ගෞරවය ඇවිල්ල තියෙනවා. ඒ නිසා මේ සල්ලි ටික යන්න දෙන්න එපා. අපි සූදානම් ලබන සතිය වැඩ පටන් ගන්න. තමුන්නාන්සේට පැවරී තියෙන බලතල ක්‍රියාත්මක කරන්න කියන එකයි මම කියන්නේ. මෙතැනදී අපි පක්ෂ, විපක්ෂව නෙවෙයි. මේ වෙලාවෙදි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ තමුන්නාන්සේ ආරක්ෂා කරන්න, ප්‍රාදේශීය සභාව ආරක්ෂා කරන්න, පනත ආරක්ෂා කරන්න මේ සියල්ලටම අපි කැප වෙනවා. එහෙම නම් තමුන්නාන්සේට තියෙන්නේ මෙතනට ගිහිල්ලා ස්කැවේටරයක් දාලා කාණු සුද්ධ කරල දෙන්න. ඊට පසුව අපි තාර වැඩ පටන් ගන්නවා. ගිවිසුම් අත්සන් කරන්න විතරයි තියෙන්නෙ. පාසල් යන දරුවො වෙනුවෙන්, අහිංසක මිනිස්සු වෙනුවෙන් හැකි ඉක්මනින් මේක කරලා දෙන්න කියලා සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද විශාල සංඛ්‍යාවක් වාහන අනතුරු සිදුවෙලා තියෙනවා. ජීවිත හානියක් වුණොත් ඒකත් අරගෙන මම ප්‍රාදේශීය සභාවට එනවා. ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් ගෙනියනවා. මේකේ වැඩි වේදනාවක් තියෙන්නේ මටත් අපේ පතිනායක මන්ත්‍රීතුමාටත් විතරයි. නිලධාරීනුත් මේක එහෙට මෙහෙට අදිනවා. ඒ නිසා නැවත නැවතත් ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ පිළිබඳව කාරුනික අවධානය යොමු කරන්න කියලා. ඒ සඳහා ඔබතුමාට ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. මොනව හරි කවුරුහරි කියනවනම් පොලිසියට හරි වෙනත් නීතිඥ මහත්තයකුට හරි මං පනත අතේ තියාගෙන පිටුවෙන් පිටුව පෙන්නන්න අපට හැකියාව තියෙනවා. මම ඒ ගැන මීට වැඩිය කියන්නේ නැහැ.

ඒ වගේම මම මේ වෙලාවේ ධනංජය මන්ත්‍රීතුමාට සහයෝගයක් දෙන.වා ඇත්තටම මමත් මීට කලින් ඇහුවා එස්ලොන් බටවලට, කූඩාරම්වලට, කොස් ගස් වලට, ඇට්ටෝනියා ගස් වලට, ජෙනරේටර්වලට, වතුර මෝටර් වලට මොකද වුනේ කියලා. හොඳ පරීක්ෂණයකට හොඳ ආරම්භයක් තමයි එතුමා මතක් කර දුන්නේ. එනිසා ඒක ඇත්තටම හොයන්න ඕන. නැත්නම් සියලු දේට එතුමාගේ පියාගේ නම කියාවි. මෙ සියලු ද්‍රව්‍ය ස්ථානගත වෙලා. මේක මම විතරයි එදා කතා කෙරුවේ. අද පාලක පක්ෂයේ තරුණ මන්ත්‍රීවරයෙක් ඒ සඳහා සම්බන්ධ වීම ගැන මම සතුටු වෙනවා. වගේම ස්තූති කරනවා. ඒ වගේම J.C.B. යන්ත්‍රයේ කෑලි ගැලවිලා තියෙනවා. ඒ පිළිබඳව පොලිසියේ පැමිණිලි දාලත් තියෙනවා. ඒ නිලධාරීන්, සේවකයන් තවම මෙහේ වැඩ කරනවා. ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කළොත් හොඳයි. පොල් සම්බන්ධව නම් මම දන්නේ නැහැ. අපේ කාලෙදි පොල් ඉඩම බදු දීල තිබුනෙ. එතකොට එක් ලක්ෂ ගානක් අරගෙන ගිහින් ගිණුම් වල බැර කරලා තියෙනවා. ඒ යුගය ගැන මට කියන්න පුළුවන්. එම මුදල් එම ගිණුම් වලට දැම්ම මිසක් අපි සාක්කුවෙ දා ගත්තෙ නැහැ. අපි වතුර ටැංකියක් වත් ගෙදර ගෙනිච්චෙ නැහැ. වතුර ටැංකි 17 ක් අස්ථාන ගතවෙලා තියෙනවා. ඒ විතරක් නෙවෙයි මගේ කාලේ ගෙනාපු සංගීත භාණ්ඩ වගේකුත් ඇති. බණ්ඩාරනායකපුර කලායතනයක් දාලා ඉගැන්වීම් කටයුතු සිදු කළා. ඒ භාණ්ඩ වලට වෙච්ච දෙයක් නැහැ. මම මන්ත්‍රී ප්‍රතිපාදන අරගෙන ගෙනත් දුන්නෙ. මම මෙතනින් ගියාට පස්සේ ඒවා අස්ථාන ගත වුණා. ඒ නිසා සියලු දෙනාම පරීක්ෂණයට සහයෝගය දේවි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ

වගේම වීදි ලාම්පු ගැන කතා කළා. ඇත්තටම මට පුංචි ප්‍රශ්ණයක් තියෙනවා. මේකට අපේ මන්ත්‍රීතුමා සම්බන්ධ නැහැ. මමත් සම්බන්ධ නැහැ. අපේ පැත්තෙ නම් හිටිහැටියේ ප්‍රශ්න ඇතිවුණා. ගෙවල් ගාව මෙම වීපී ලාම්පු හයි කරගෙන ගියා මම දන්නවා ඔබතුමා මේකට විරුද්ධයි. දැන් මේ මන්ත්‍රීවර අහනකොට ප්‍රශ්නයක් වෙනවා. ඒවත් මම හිතන්නේ මුල ඉඳලම වැරැද්ද කරපු නිසා තමයි එහෙම වුණේ. ඒ නිසා එතන ඉඳලා නිවැරදි විය යුතුයි. නමුත් මෙතුමා ඒ කාර්යයන් කිරීම ගැන මම සතුටු වෙනවා.මෙතුමා වැඩ කරනකොට මම ගිහිල්ලා අහන් නැහැ. මොකද මම දන්නවා එතුමා කරන දේ හරි කියලා. නමුත් සභාවෙ මහජන දේපළ ආරක්ෂා කිරීමට දිවුරුම් දීලා තියෙන්නේ ප්‍රාදේශී සභාවෙ ඉන්න මන්ත්‍රීවරුන්. ඒක නිසා මේ දිවුරුම් දීමට පිටස්තරව ගම්වාසීන්ට අපි දේශපාලනය කළා. අපේ එක්සත් ජාතික පක්ෂය අයත් ඉන්නවා, දෙපැත්තම ඉන්නවා. අපි කියන්නේ දේශපාලනය කළ යුතු වෙලාවට විතරයි අපි දේශපාලනය කරන්නෙ. මම හිතනවා අපෙන් කිසිම බාධාවක් මෙතෙක් මේ වර්තමාන යුගයේ කවදාවත් වෙලා නෑ. කවදාවක්වත් අපි සභාවේ වතුර බෝතල් වලින් ගහන තත්වයක් ඇවිල්ලා නැහැ. මේ සභාවෙන් ඒ ගෞරවය ආරක්ෂා කරගෙන තියෙනවා. ඒ ගැන තමුන්නාන්සෙ ආඩම්බර වෙන්න ඕන. මොකද ලංකාවේ ඕන තැනකට ගිහිල්ලා නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා කියලා කියන්න පුළුවන් හැකියාවක් තියෙනවා. මොකද වතුර බෝතල් පාරක් කාපු සභාපතිතුමෙක් නෙවෙයි. ඒ ගෞරවය අපි ආරක්ෂා කරලා දීලා තියෙනවා.

අවසන් වශයෙන් කටු පොල් වගාව ගැන කතා කරන විට, මේ කටුපොල් වගාව සඳහා ගිවිසුම් අත්සන් කරන්න මම විරුද්ධයි. මම මේ කියන්නේ මේක ඉතිහාසය ගිහිල්ලා බැලුවම අවු 60 ක් විතර වෙනවා. පතිනායක මන්ත්‍රීතුමා දන්නවා අවුරුදු හතළිහකින් විතර ඔයා ඇළට බහින්න බැරි වුණා. නන්දන මන්ත්‍රීතුමා දන්නවා. යටලමත්ත ඇළටත් අවුරුදු 40කින්, 50කින් බහින්න බැහැ. ඒ වගේම උඩලමත්ත ඇළ. එහෙමනම් මේ ඉතිහාසය අපි වෙනස් කළ යුතුයි. මම එක සැරයක් නෙවෙයි දහ සැරයක් මේකට විරුද්ධයි. මේක ඉවත් විය යුතුමයි. 2002 දී වතුර බටේ පිපිරීම නිසා මාලු මැරුණා. යටලමත්තෙන් වතුර අරගෙන මාළුත් එක්ක රස පරීක්ෂක වෙත යැව්වා. නමුත් ඇත්තටම කනගාටුයි. ඒ කාර්යය සාර්ථක වුණේ නැහැ. ඒ වගේම අද එක කාක්කෙක් හොයාගන්න නැහැ. අඩුගානේ සෙනසුරු අපලෙට බත් ගුලියක් දෙන්න එකෙක් හොයාගන්න නැහැ. මොකද මේ කටු පොල් වසංගත වගාව නිසා. ඒක නිසා අපි සියලු දෙනාම පක්ෂ, පාට භේදයකින් තොරව කටු පොල් වගාව ඉවත් කරන්න කටයුතු කරමු. මම ලකුණු දාගන්නවත්, ප්‍රදර්ශනයට වත් මාධ්‍යයට වත් නෙවෙයි ඒක මගේ ස්ථාවරය. එහෙමනම් ගම්පෙරළිය යටතේ විශාල වෙනසක් ඉදිරියේදී සිදුවෙනවා. රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු ආණ්ඩුව යන්නේ කොහාටද කියන එක බලාගන්න පුළුවන්. එක බෝක්කුවක්, අඩිපාරක් සියල්ලම සංවර්ධනය කරනවා. සිරිසේන මහත්තයා කකුලෙන් ඇද්දෙ නැත්නම් ඒ කටයුත්ත මේ වෙනකොට ඉවරයි. නමුත් මම ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද අද පොලීසියෙ මහත්වරුන්ට පින් සිද්ධ වෙනවා. ඒ ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම දෙනාට අපි පිං සිදු වෙන්නේ කියලා කියනවා. මොකද මත්ද්‍රව්‍ය වල යම්කිසි අඩු වීමක් වෙලා තියෙනවා. ඒ නිසා ඒකට ශක්තිය දුන්න සියලුම හමුදාව වෙන්න පුළුවන්, වෙනත් අයෙක් වෙන්න පුළුවන්, පොලීසියට ඔත්තුවක් දීලා සහයෝගය දීපු කෙනෙක් වෙන්න පුළුවන්, ඒ සියලු දෙනාටම අනාගත පරපුර වෙනුවෙන් අපි අපේ ගෞරවයත්, ස්තුතියත් පුද කරමින් තමුන්නාන්සේලා සියළු දෙනාටම සුභ ගමනකට ප්‍රාර්ථනය කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, ජයතිස්ස අබේසුන්දර මහතාගේ නිවෙස ඉදිරිපිට තියෙන වතුරවල සම්බන්ධවයි මට කතා කරන්න සිදුවෙන්නේ. රංජිත් ජයවීර මන්ත්‍රීතුමාත් දන්නවා. චන්දිමා මන්ත්‍රීතුමිය මේ ගැන කතා කළා. මමත් ඒ කොට්ඨාසයේ ගෙවල් ලග. ඇත්තටම මමත් ඔය ස්ථානයේ වතුර තියෙන වෙලාවට ලොකු අපහසුතාවයකට

පත්වෙනවා. මොකද මිනිස්සු කියන දේවල් අහගෙන ඉන්න බැරුව. ඒ වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම කරන්න උත්සාහ කළා. නමුත් ප්‍රදේශයේ ඉන්න මිනිස්සුන්ගෙ මතිමතාන්තර සමග ගැලපීම්, නොගැලපීම් නිසා ඒ දේ කරගන්න බැහැ. RDA එකේ මහත්වරුත් එක්ක ම කතා කලහම එතුමන්ලා කිව්වෙ පොලිසිය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිසාපති තුමිය සම්බන්ධ කරගෙන ඒ අයගේ රැකවරණයක් ලැබෙනවා නම් මේ දේ කරන්න පුලුවන් කියලා. මොකද එක් අවස්ථාවක ඒ නිලධාරීන්ට පහර දීමකට සැරසිලා තියෙනවා. පෞද්ගලිකව අමනාප වන නිසා මම නම් වශයෙන් කියන්න නැහැ. අපේ නිශාන්ත නන්දන මන්ත්‍රීතුමාට මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ආණ්ඩුකාරතුමාගේ රැස්වීම තිබුණු දවසේ එතුමා ඒ ගැන අවධානය යොමුකරලා ඒ ගැන ඉල්ලීමක් කරල තිබුණා.

අනිත් එක තමයි අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා ඔබතුමා මගේ කොට්ඨාශයේ පිහිට තැනකට කියලා තියෙනවා. ලයිට් පිළිබඳව. ලයිට් වලට අවශ්‍ය උපකරණ ගෙනත් තියන්න දාලා දෙන්නම් කියලා. නම් වශයෙන් වුනත් මට කියන්න පුළුවන්. ඉතින් ඒ වෙනකොට මම දවස් තුනක් ලයිට් හදලා ඉවරයි. මට කියපු හතර දෙනෙක් ඉන්නවා. ඒ අයගේ පෞද්ගලික අරමුණු සඳහා ඔවුන්ගේ නිවෙස් ඉදිරිපිට ලයිට් දාගන්න කතා කරපු අය තමයි ඉන්නේ. පොදු තැනකට නම් ලයිට් දාන්න පුළුවන්. කොහොම වුණත් ඔබතුමා මේ යන ක්‍රමය කොහොමද කියලා පැහැදිලිව දන්නවා. මගේ කොට්ඨාස වත් තවම දාලා ඉවර නැහැ. ඔබතුමා එහෙම කිව්වම මිනිස්සු අපි ගැන වැරදි විදියට දකිනවා. දෝෂාරෝපණය කරනවා. ඒ අය මේකේ ඇත්ත නැත්ත දන්නේ නැහැ. එතැනදී අපි ලොකු අපහසුතාවයකට පත්වෙනවා. අනික එහෙම කිසි අපහසුතාවයකට පත් නොවෙන්න ඒ අදාල කොට්ඨාශයේ ඒ වගේ දෙයක් කරනකොට මේ මන්ත්‍රීතුමිය ඉන්නවා. එතුමියට නම් එහෙම ප්‍රශ්නයක් නැහැ. එතුමිය මට මොනා හරි කිව්වා නම් ඒකත් මම කරනවා. පහුගිය දවසක එහෙම ප්‍රශ්නයක් ඇතිවෙලා එතුමිය දැනුවත් ඇති. ඉතින් එතුමාගේ ඒ තොරතුරටත් මම ගරු කරල මම ඒ දේ නොකර හිටියා. ඒ නිසා මම කියනවා රංජිත් ජයවීර මන්ත්‍රීතුමනි, ඒ වගේ ප්‍රශ්න ඇති කරන්න එපා. මොකද අපිත් රෙද්දක් ඇඳගෙන යන්න ඕන. එතකොට එස් ඩබ්ලිව් චමින්ද මහතාට කිව්වේ නැද්ද මාතරගේ ගුණදාස මහතාට සහ ඒ අය කියනවා. මෙහෙම ලයිට් ගෙනත් දෙන්න කිව්වයි කියලා. හැබැයි මට ඔබතුමාලගේ පැත්තේ ලයිට් හදපු දවස විතරයි ඒ ප්‍රශ්නය ඇතිවුණේ. ඒ වගේ ප්‍රකාශ කරන කොට නැවත දෙපාරක් හිතන්න කියලා මම ඉල්ලනවා. අනික තමයි ගරු මන්ත්‍රීතුමනි, මොන ප්‍රකාශයක් කළත්, මම මේ මතයක් පිළිබඳ විතරයි පෞද්ගලික අමනාප කම් ඇතිකරගන්න එපා.

අනික් කාරණාව තමයි ගරු සභාපතිතුමනි, අළුත්තානායම්ගොඩ, පරණ තානායම් ගොඩ යාකරන පාළම පිළිබඳ මම මුල ඉඳලම යෝජනා දැම්මා. ඒ සඳහා ලොකු මුදලක් යන්නේ නැහැ. ඒකෙ ඇණ ටික ගැලවිලා. ඒ අවට මිනිස්සු කොහොම ඉන්නවද කියලා හිතාගන්න බැහැ. එච්චරටම සද්දෙයි. ඒ ගැන මම එය සභාවට යොමු කරලා ඒ ගැන අවධානය යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා.

සභාපතිතුමනි, තව දෙයක් මම කියන්න කැමැතියි. ඔබතුමාට තියෙන බලය සහ ඒ අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කරලා එකේ r d a එකේ අය සමඟ කතා කරලා, අපේ නන්දන මන්ත්‍රීතුමා කියපු විදියට වැඩේ කෙරුනොත් හොඳයි මැදිහත් වෙලා නිලධාරීන් සහ r d a නිලධාරීන් සහ භාව මැදිහත්වෙලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්බන්ධ කරගෙන ඒ අය සමග සාකච්ඡාවක් අරගෙන හරි මම කිවුව මම කියපු වතුර වල එතන පමණක් නෙවෙයි. කීප පළක ම ඒ වගේ ප්‍රශ්න තියෙනවා. නමුත් මම කියපු ස්ථාන ලොකු ප්‍රශ්නයක්. එතන වතුර බහින්නෙම නැහැ. ඒ නිසා සාකච්ඡාවක් ඉල්ලගෙන යම් ක්‍රියාමාර්ගයක් ගන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියල ඉල්ලනවා. නන්දන මන්ත්‍රීතුමා කිව්වා වගේ ආණ්ඩුකාරතුමාගෙන වැඩේ කෙරුනොත් හොඳයි. ඒ වගේම මට ගිය සභා වාරයේදී සහභාගි වෙන්න වුනේ නැහැ. විදුළි බල්බ් සවි කරන්න ගිහිල්ලා, මගේ වීපී පහන්

80%ක් විතර හදාගන්න සහයෝගය දුන්න සභාපතිතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයට විශේෂයෙන් ස්තුතිය පුද කරනවා. ඒ වගේම අපේ ගයන්ති මන්ත්‍රීතුමියගේ ඉදිරියේදී එළඹෙන උපන්දිනය සුභම සුභ උපන්දිනයක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ප්‍රථමයෙන්ම ගයන්ති මන්ත්‍රීතුමියට සුබ උපන්දිනයක් ප්‍රාර්ථනා කරමින්, ගරු සභාපතිතුමනි, හෝමදොල ක්‍රීඩා පිටිය සභාවට පවරා ගන්නා ලෙස ඉල්ලීමක් කරනවා. ඒ වගේම, ගරු සභාපතිතුමනි, හෝමදොල ක්‍රීඩා පිටියෙ, දැනටත් අර පාර හදන්න ගෙනත් දාපු ගල් වගයක් ගොඩගහලා තියෙනවා. ඒ නිසා එම ස්ථානයේ සෙල්ලම් කරන්න බැරි තත්ත්වයට පත්වෙලා තියෙනවා. ගල් ටික ඉවත් කරගන්න, ඔබතුමත් එක්කත් මම කතා කළා. j.c.b. පැය පහක් විතර යනවා. ගල් දාපු අයට සභාපතිතුමා හරහා ලිපියකින් දැනුම් දුන්නා. ඒකට තවම උත්තරයක් ආවෙ නැහැ. ඒ කොම්පැණිය දැන් නවත්තලා. ඒ නිසා සභාපතිතුමා, දැනට ඒක අයිනකට දාගන්න පැය පහක් විතර ජේසිබි යන්ත්‍රයක් දෙන්න. කොතලාවල පාර හදන්න ගෙනාපු ගල් ටික තමයි ඒ තියෙන්නෙ. ඒ නිසා ඒක අනවශ්‍ය විදියට කාටවත් දෙන්න බැහැ. ඒක නිසි ක්‍රමවේදයකට සභාවට ගන්නවා නම් ප්‍රශ්නයක් නැහැ. ඒ ගැන අවධානය යොමු කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපේ ධනංජය මන්ත්‍රීතුමා කිව්වා වගේ, ගරු සභාපතිතුමනි, උඩුගම කුණු එකතු කිරීමේදී නිසි ක්‍රමවේදයකට එකතු කරන්නේ නැහැ. අද උදෙත් බලාගෙන ආවා. තැනින් තැන කුණු ගොඩ ගැහිලා. අර පෝස්ටර් ගහපුවා එහෙම තියෙනවා. ඒ නිසා ඒකත් නිසි ක්‍රමවේදයකට කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, දැන් උඩුගම පොලේ තත්වෙ කොහොමද දන්නෙ නැහැ. දැන් පොල ඉක්මනින්ම එහා ගොඩනැගිල්ලට ගන්න පුළුවන්ද? ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරන ගමන්ම, වීදි ලාම්පු ප්‍රශ්නේ අහන්නම කැමති නැති ප්‍රශ්නයක්. ප්‍රධාන පාරේ වීදි ලාම්පු ටික දැනට උඩුගම ප්‍රධාන පාරේ පාරේ වීදි ලාම්පු ටිකවත් දැනට සකස් කරල නැහැ. කැටගොඩට යද්දි වීදි ලාම්පු එකොළහක් විතර සවි කරන්න තියෙනවා. ලාම්පු හයි කරගන්න බැරිවුන නිසා, ගම ඇතුලෙ යන්න බැරි තත්වෙට පත්වෙලා. ඒ නිසා ඔබතුමා දැනටත් වීථි ලාම්පු ක්‍රමවේදයකට සකස් කරමින් සිටින නිසා වීදි ලාම්පු ටික සකස් කරලා දෙන්න කියලා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය , අපේ මාධ්‍යවේදී ගුණපාල කාරියවසම් මැතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම මුලින්ම ස්තූතිවන්ත වෙනවා. ගිය මාසයේ අපේ මුලණ ආනන්දාරාම විහාරස්ථානයේ චෛත්‍යයට මුල් ගල තැබීමේ අවස්ථාව තිබුණා. ඒ වෙලාවෙ ගරු සභාපතිතුමා ඇතුළු ප්‍රාදේශීයට සභාවෙන් උපරිම සහයෝගය ලබා දුන්නා. ඒ වගේම අපි මන්ත්‍රීතුමන්ලාට මන්ත්‍රීතුමියන්ලාට ආරාධනා කළා. පිරිසක් ඇවිල්ල හිටියා. පැමිණීම වෙනුවෙනුත්, ලබාදුන් සහයෝගය වෙනුවෙන් සියලු දෙනාටත් විහාරස්ථානය, ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ස්තුතිය පුද කරනවා.

ඒ වගේම මාපලගම මංසන්ධියේ සභාවේ වෙළෙඳ සංකීර්ණයේ තියෙන වැසිකිළි කැසිකිළි පද්ධතිය සුද්ද පවිත්‍ර කරලා ආරම්භ කරලා තියෙනවා. හැබැයි සමහර වෙලාවට මම දන්නේ නැහැ පියල්

හිරිමුතුගොඩ මන්ත්‍රීතුමා මේක සඳහන් කරාවි. මේකෙ ඉබ්බෙක් දාලා කඩවල් කීපයක යතුර තියෙනවයි කියලා ආරංචියක් තියෙනවා. හදිසි අවශ්‍යතාවයකට ගන්න විදිහක් නැති ප්‍රශ්නයක් තියෙනවා. ඒක ව්‍යාපාරිකයෝ දෙන්නෙක් ළඟ තමයි තියෙන්නේ. කොහොම නමුත් දෙතුන් පාරක් කඩලා දාලා තියෙනවා. හැබැයි ඔබතුමන්ලා එදා කිව්වේ මෙකට කවුරුහරි එක්කෙනෙක් දාලා, මෙය නිතර සුද්ද පවිත්‍ර කරන්න කටයුතු කරනවා කියලා. හැබැයි එහෙම ක්‍රමවේදයක් නැහැ. පහුගිය කාලේ තිබුණ ගැටලුව වැඩි දවසක් නොගිහින් නැවත ආරම්භ වෙයි. කවුරුහරි දාල මේක සුද්ද පවිත්‍රව කරනවා නම් හොඳයි කියලා මම මේ වෙලාවේ සඳහන් කරනවා. එදා මම එතනදි විරුද්ධ වුණ වෙලාවේ, ඔබතුමන්ලා, සභාපතිතුමා ඇතුළු මේ සියලු දෙනා කවුරු හරි මේකට වෙනම කම්කරුවෙක් දානවා කිව්වා. එහෙම දෙයක් වුණේ නැහැ. මේ වැසිකිළි පද්ධතිය හදලා තියෙන්නේ වෙළඳ සංකීර්ණයේ වෙළෙඳ ප්‍රජාවට. ඒ සඳහා කවුරුහරි යොදවන්න. හන්දියේ නිතර සැරිසරන පුද්ගලය හැටියට අපට තමයි මිනිස්සු ඔය ප්‍රශ්නේ කියන්නේ. ඒ නිසා ඔබතුමා ඒ සඳහා තීන්දු තීරණ ගන්න කටයුතු සිදු කරන්න.

ඒ වගේම මේ වෙලාවෙ අපේ මාපලගම කොට්ඨාශය භාර මන්ත්‍රීතුමා කතා කළා වගේ, අර ගල්වාන හන්දියෙ තියෙන පාලමේ ප්‍රශ්නය දැඩිවම බලපාල තියෙනවා. මේ පාලම නිසා ඒ අවට මිනිස්සුන්ට හැන්දෑවට නිදා ගන්න විදියක් නැහැ. මේකේ ඇණ ගැලවිලා. තහඩුවක් හැන්දෑවක වැටිලා තිබුනොත්, එතනින් යන බයිසිකලේ හරි පුද්ගලයා හරි ගඟ පතුලේ තමයි නවතින්නේ. දැඩි අවදානමක් තියෙනවා. ඒ නිසා ඔබතුමාගේ අවධානය මේ පිළිබඳව යොමු කරන්න. අදාල අංශවලට යොමු කරලා පිළිසකර  කරලා දෙන්න. මොකද ඉතාමත් අත්‍යාවශ්‍ය පාලමක්. ගම් දෙකක් යා කරන පාලමක්. අතිවිශාල පිරිසක් මේකෙන් ප්‍රයෝජන ගන්නවා. උඩුගම කුඹුරුහේන, තල්ගස්වල හැම පැත්තටම කිට්ටු මාර්ගයක්. දැන්ම පිළිසකර නොකළොත්, තවත් අබලන් වෙනවා. කාර්මික නිලධාරීන් දාලා කම්කරුවෙක් දාල තමයි මේ කටයුතු කරන්න වෙන්නේ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, උඩුගම පොල් ඉඩම පිළිබඳවත්, තේ ඉඩම පිළිබඳවත් අපේ ධනංජය මන්ත්‍රීතුමා කතා කලා. ඇත්ත එතුමාගේ පියාට අපි ගරු කරනවා. ඒ කාලේ ලොකු වැඩ කොටසක් කළා. හැබැයි එතුමා කිව්වා වගේ, මමත් ඔය සභාවෙ හිටියා. ඔය කියන තරම් ආදායමක් සභාවට හම්බ වුණාද කියලා මම දන්නෙ නැහැ. හැබැයි මේ කාලෙ ඔබතුමා යම් ආදායමක් පෙන්නුවා. ඒ කාලේ මමත් සභාවේ හිටියා. ඔය කතන්දර වලට මමත් එතුමාගේ පියා සමග වරින්වර බහින්බස් වීම් සිදු වුණා. ඒ කාලේ ඔය ආදායම,කොහාට ගියාද? කවුරු ගත්තද කියලා දන්නෙත් නැහැ. පහු ගිය අවු. 05 සභා කාලයේදී අපේ සභාපතිතුමා සභාවෙ හිටියා. අරුම පුදුම දෙයක් නෙවෙයි. එතුමා කියපු දේට තමයි මම කිව්වේ. ඒ කියපු කාරණාව ඇත්තක්ද බොරුවක්ද කියල මම දන්නේ නැහැ. එතුමා හරියට හොයලා බලලා එතුමා දන්නෙ නැතුව ඇති.

ඒ වගේම මේ වෙලාවේ ගම්පෙරළිය පිළිබඳව මම කතා කරන්න යන්නෙ නැහැ. මේ ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කිව්වා තාම ආරම්භ වුණා විතරයි. නමුත් ඉස්සරහට යනකොට ලොකු ලොකු දේවල් බලාගන්න පුලුවන් වෙයි. ඒක නිසා අද වන විට 2015 ජනවාරි 8 වෙනිදායින් පස්සේ දැවැන්ත සංවර්ධනයක් සිදු වුණා. මේ පරිවර්තනයත් එක්ක මම ලංකාව ගැන කතා කරන්නේ නැහැ. ප්‍රදේශ ගැන කතා කරන්නේ ප්‍රදේශවල දීර්සව, මහා පරිමාණයේ සංවර්ධන කටයුතු සිදු වෙනවා. ඒ වගේම අතුරු මාර්ග, අත්‍යාවශ්‍ය මාර්ග සංවර්ධනය වෙමින් පවතිනවා. මේ සියල්ල ඉදිරියේදී වේගවත් වෙයි. ඒ වගේම සාධාරණ සමාජයක් සඳහා ජනවාරි 8න් පසු ඒ කැපකිරීම් කරපු අපට එහි ප්‍රතිඵල අද වන විට  අත් වෙමින් තියෙනවා. පරිවර්තනයක් එක්ක දැවැන්ත වෙනසක් මේ සමාජ තලය තුළ තියෙනවා. ධනංජය මන්ත්‍රීතුමත් පොලිසිය ගැන කතා කළා. අපි එතුමන්ට හැබැයි මතක් කරලා දෙනවා. ජනවාරි 15 ට ඉස්සර වෙලා තිබුන පොලිසියත්, දැන් කියන පොලිසියත් අතර වෙනස. එදා දේශපාලනය වෙච්ච පොලිසියක් තිබුණේ. අද යම් මට්ටමකට සාධාරණ අයුරින් කටයුතු කරන ආයතනයක් විදිහට

තියෙනවා. අසාධාරණකම් ඇති. සමහර වෙලාවට වැරදි ඇති. නමුත් එදා තිබුණ සමාජයත් එක්ක අද එය සැබැවින්ම වෙනස් වෙලා, ජනතාවට යම් මට්ටමකට තමන්ගේ යුක්තිය, සාධාරණය ඉටු වෙනවා කියල බලාපොරොත්තු තියාගන්න පුළුවන් හැටියට අද පොලීසිය ක්‍රියාත්මක වෙනවා. ජනාධිපතිතුමාත් පත් කලේ අපි තමයි. හැබැයි අද අපි ඒ ගැන කණගාටු වෙනවා. ඒ ගැන කතා කළොත් පැය ගානක් කතා කරන්න වෙනවා. අපට මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලේ කරපු සෙල්ලම්, මේ වෙලාවේ ගරු අග්‍රාමාත්‍ය තුමන්ගේ දැවැන්ත බුද්ධියත් එක්ක ආර්ථික ශක්තියත් එක්ක හට දැවැන්ත ඉදිරි ගමනක් ආරම්භ වෙලා තියෙනවා. එතුමා මේ 2019 වර්ෂය අවසාන වෙනකොට 2020 පටන් ගන්නකොට අතිවිශාල සංවර්ධන ක්‍රියාවලියක් නිම කරන්න බලාපොරොත්තු වෙනවා. එම ප්‍රතිඵල අපේ ප්‍රදේශයේ ජනතාවට විඳින්න හැකියාව ලැබෙයි කියලා, සිහිපත් කරමින් මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී ගයාන් මධුශංක මහතා**

ගරු සභාපතිතුමනි පන්සලේ උත්සවයකටෙසහභාගිවීමට තියෙන නිසා මට මෙතනින් බැහැර යාම සඳහා අවසර ඉල්ලනවා.

**ගරු මන්ත්‍රීනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලාගෙන් හා මන්ත්‍රීතුමියන්ලාගෙන්, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. අපි ගිය අට වැනිදා කාන්තා දිනය සැමරුවා. ඇත්තටම වත්මන් ආණ්ඩුව කාන්තාවන්ට විශේෂයෙන් සලකනවා කියන එක මේ අවස්ථාවෙදි ප්‍රකාශ කරන්න ඕන. අපි හත් දෙනෙක් අද මෙතන නියෝජනය වෙන්නෙත් මේ ආණ්ඩුව කාන්තාවට නිසි තැන ලබා දෙන්න දරන උත්සාහයේ ප්‍රතිඵලයක් විදිහට තමයි කියලා මම දකින්නේ. ඒ වගේම පසුගිය 8 වෙනිදා කාන්තාවන් වෙනුවෙන් දුම්රිය මැදිරි වෙන් කලා. ඒ පිළිබඳව ඒ කටයුතු තව තවත් සාර්ථක වෙන්න කියලා, ප්‍රවාහන අමාත්‍යාංශයට අපේ සුභ පැතුම් එක්කරනවා.

ඒ වගේම කාන්තාවන් රැකියාවලට ඇතුල් වීමේදී පවතින වයස් සීමාවන් ඉවත් කරන්න අපේ එරාන් වික්‍රමරත්න මැතිතුමා යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා. ඒ කටයුතු සාර්ථක වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම සභාපතිතුමා, මම ඇස්තමේන්තුවක් හදන්න ලියුමක් ඉදිරිපත් කළා. ඒක ගැන සඳහනක් ආවෙ නැහැ. හැබැයි මම ඇස්තමේන්තුව නම් හැදුවා. දකුණු පළාත් මාර්ග අධිකාරියෙන් අපේ ගෝණදෙනියේ දිසානායක මාවතට අපි පළාත් පාලන තුමාගෙන් තමයි ඒක ගත්තේ. දකුණු පලාත් අධිකාරියෙන් ඇවිත් ඇස්තමේන්තුව හැදුවා. පාර අඩි තුන හමාරක් වගේ පළල් කරන්න, කාපට් කරන්න, දිසානායක මාවතේ කේ.එච්. පියදාස මහත්මාගේ ගෙදර අසල අඩි 03 ක්වත් පාර පළල නැහැ. තාප්පයක් බැඳපු නිසා මාර්ග සංවර්ධන අධිකාරියෙන් වැඩ කරනකොට අපට සභාවෙන් කෙරෙන්න ඕන කටයුතු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මගේ උපන්දිනය වෙනුවෙන් සුබ පැතුම් එක් කළ සියලු දෙනාට ගොඩක් ස්තුතියි. මාර්තු මාසය කියන්නේ මට ගොඩක් විශේෂ මාසයක්. ඒක නිසා තමයි මේ සංග්‍රහය කරන්න හිතුවේ. ඒ වගේම මගේ ව්‍යාපාර කටයුතු වල ප්‍රවර්ධන වැඩසටහන් කළා. එහෙමනම් සියලුදෙනාට ස්තුතියි.

**ගරු මන්ත්‍රී නන්දන නිශාන්ත මහතා**

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිතුමනි, විපක්ෂ නායකතුමනි, සියලු මන්ත්‍රීවරුනි, ලේකම්තුමිය, මාධ්‍යවේදී මහත්මා ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. අපේ ගයන්ති මන්ත්‍රීතුමියට සුභ පතනවා. ඒ ගමන් ම ස්තුතිවන්ත වෙනවා. අපේ ගමට දැවැන්ත මුදල් ප්‍රමාණයක් ලබාදුන් වජිර අබේවර්ධන ඇමතිතුමා ට ස්තුති කිරීම මගේ යුතුකමක්. මොකද අවශ්‍ය වූ පාලම් තුනක්, අත්‍යවශ්‍ය වූ පාරක් හා තවත් අත්‍යවශ්‍ය වූ පොඩි පොඩි පාරවල් කිහිපයකට උදව් කරලා, ගමකට දෙන්න පුළුවන් උපරිම මුදල් ප්‍රමාණය ගමට ලබාදීලා තියෙනවා. ඊට අමතරව පියසේන ගමගේ හිටපු අමාත්‍යතුමා, වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා කෝටියකට අධික මුදලක්, මම හිතන්නේ ඉතිහාසයේ වැඩිම මුදල යටලමත්ත ප්‍රදේශයට ලබාදීලා තියෙනවා. එක් කෝටි පන්ලක්ෂ ගණනක් මේ වන විට අනුමත කරලා එවලා තියෙනවා. ඒ වෙනුවෙන් මගේ ගෞරවය පුද කරනවා. ඊට අමතරව ගම්පෙරළිය හරහා තවත් කෝටියකට ආසන්න මුදලක් ලක්ෂ 70ක් වගේ මුදලක් මේ වෙනකොට අනුමත වෙලා තියෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පවතින කොට්ඨාස 15 වෙන් මම විශ්වාස කරනවා වැඩිම මුදල් ප්‍රමාණය හම්බ වෙලා තියෙන්නෙ යටලමත්ත ප්‍රදේශයට, නෙලී මන්ත්‍රීතුමියටත්, මටත් කියන එක මා මේ වෙලාවෙ ප්‍රකාශ කරනවා.

ඒ වගේම නාගොඩ ප්‍රාදේශීය සභාවේ වැඩිම මුදල් ප්‍රමාණය අපි අරගෙන තියෙන්නේ. ටිකක් නෙවෙයි ජයවීර මන්ත්‍රිතුමා, හයලක්ෂ අසූ හතර දාහක් අපි අපි තුන්දෙනා අරගෙන තියෙනවා. මේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ ගමේ මිනිස්සු මේක දන්නෙ නැහැ. මේ තත්වය තුල නාගොඩ ප්‍රාදේශීය සභාව තුළින් කළේ මොනවද කියන එකේ ප්‍රශ්නයක් තියෙනවා. ඔබතුමාට මම චෝදනා කරනවා නෙවෙයි. අපේ තියෙන ආර්ථික ප්‍රශ්න වෙන්න ඇති. මම ඒ ගැන සිහිපත් කළේ නැත්නම් මේ ඉන්න මන්ත්‍රීවරුන්ට තේරෙන් නැහැ. මෙපමන මුදලක් අපේ ගමේ පරිහරණය කරනකොට අපි මේ සභාවෙන් හෝ රජයෙන් කොච්චරක් අපේ ගමට අපි වැඩ කරල තියනවද කියලා. ඒ නිසා මම අපේ සභාපතිතුමාට ආරාධනා කරන්නේ පළාත් පාලන ඇමතිවරයා සමග ගිහිල්ලා කතා කරලා, මොනවා හරි සාධාරණ ක්‍රමවේදයකට මුදල් ලබාගන්න. අපි සියලු මන්ත්‍රීවරුන් සහබන්දු මහත්තයා, වනමල් මන්ත්‍රීතුමා, තරංග මන්ත්‍රීතුමා අපි මේ ඉන්නේ මන්ත්‍රීතුමිය සියලු උදව් උපකාර දෙන්නම්. නෙලී මන්ත්‍රීතුමියට මම කිව්වා යෝජනාවක් දෙන්න. මම සල්ලි දෙන්නම් කියලා. එහෙම කිසි ප්‍රශ්නයක් නැහැ. නාගොඩ සභාවට මොනවහරි උවමනාවක් තියෙනවා නම්, අපි ඔක්කොම එකතුවෙලා කණ්ඩායමක් හැටියට ඉල්ලීමක් කළොත්, ඒ මුදල ලබා දෙයි කියලා මම විශ්වාස කරනවා. ඔබතුමා ගිහිල්ලා ඒ මුදල් ඉල්ල ගන්න කියන ඉල්ලීමක් කරමින්, පියල් මන්ත්‍රීතුමා මාපලගම ආසිරි සේවා ස්ථානය ළඟ තියෙන කාණුව ගැන කතා කලා. මීට අවුරුදු දහයකට කලින් ඒ ගැන කතා කළා. එවිට මෙහෙ ඉන්න නිලධාරියෙක් ගිහිල්ලා, ඒ මනුස්සයට තර්ජනය කළා. ඒ වෙලාවේ මම කිව්වා පොලිසියේ ඇන්ට්‍රියක් දාන්න කියලා. නමුත්, රාජකාරියට බාධා කළා කිවුවම අත්අඩංගුවට ගන්න වුණත් පුළුවන්. නමුත් මේ හිටපු සභාපතිවරු ඒක කළේ නැහැ. මේ සභාපති පුටුවට ආවම හැමෝටම පුදුම ප්‍රශ්නයක් තියෙනවා. අපි ගියත් එහෙම වෙන්න පුළුවන්. මෙතුමා මේ පැත්තේ ඉන්නකොට පුදුම සද්දෙට කතා කළේ. ඒත් අද හිර වෙලා. ක්‍රියාත්මක කරගන්න බැහැ. නැතිවෙච්ච බැරල් ගානේ, ලයිට් දාන්නෙ නැති එකට ඇතිවෙන්න කතා කළා. නමුත් අද ඒවා කතා කරන්නේ නැහැ. මම ඔබතුමාට චෝදනා කරන්නේ නැහැ. නමුත් මෙතන ඉන්නවට වඩා ඔය තැනට ගියහම කරන්න පුලුවන් දේවල්. ඔබතුමා කුඹුරුහේනපාර ගැන කතා කරනවා විතරයි. ඒ පාරෙ ගෙවල්වල සියළුම ජලය පාරට එනවා. මේ පාර හදන්න කලින් වතුර පාර නවත්වන්න කියලා ඔබතුමා ගිහින් කියන්න. එක ගෙදරක් නැර කුඹුරුහේනේ සියලුම ගෙවල් වල වතුර එන්නේ පාරට. කණගාටුයි ඒ පාරවල් හදලා වැඩක් නැහැ. ඒ අය දැනුවත් වෙන්න ඕන. අපි නීතිය ක්‍රියාත්මක කරන්නේ නැති ප්‍රශ්නයක් තියෙන්නේ. පාරක් හැදුවට පස්සේ නීතිය ක්‍රියාත්මක කරලා පාරට වතුර එන එක නවත්වන්න ක්‍රමවේදයක් සකස් කරන්න ඕන. මිනිස්සු එක්කෙනෙකුට දෙන්නෙකුට නඩුවක් දාන්න ඕන. පියල් මන්ත්‍රීතුමා කියන එක හරි. මම හිතන්නේ දැන් හොඳ අවස්ථාව. ඒ ගල් බැම්ම ඉවත් කලා නම් ඉවරයි. එහෙම නීතියක් නැහැ. වතුර

බහින්නේ නැත්නම් එක සුද්ද කරන්න ඕන. එහෙම කොහොමද නවත්තගෙන ඉන්නේ. අපි මේවා එහා පැත්තෙ ඉඳගෙන කිව්වා, දැන් මේ පැත්තට ඇවිල්ලත් කියනවා. අපි දන්නේ නැහැ මොන විදියට ක්‍රියාත්මක වේද කියලා. මෙතන ධනංජය මන්ත්‍රීතුමා නැහැ. පසුගිය සභා වාර්තා 25 කට එහා ගිහිල්ලා බැලුවනම් ඒකෙ ලැබුනු ආදායම්, වියදම් ඔක්කොම බලාගන්න තිබුණා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, බෝවිටියමුල්ල පාසල් කන්ද මාර්ගය සංවර්ධනයට පියසේන ගමගේ ඇමතිතුමා ලක්ෂ දහයක් දාලා තියෙනවා. මේ වෙනකොට ඇස්තමේන්තු හදලා ඉවරයි. එකේ හියුම් පයිප්ප දෙකක් දාන්න තියෙනවා. මීට කලින් එතුමා 10 පාරක් විතර ඇවිල්ලා ලේකම්තුමියට ලියුම් දුන්නා. ඔබතුමාට පෞද්ගලිකවම මම කතා කළා. ඇස්තමේන්තුව මට වෙනස් කරන්න බැරි නිසා මම මේ හියුම් පයිප්ප දෙක ඔබතුමාගෙන් ඉල්ලන්නෙ. නැත්නම් ඔබතුමාගෙන් සල්ලි ඉල්ලලා ඔබතුමාට මම කරදර කරන්නේ නැහැ. නැත්නම් කොන්ක්‍රීට් එක දාන්න බැරි වෙනවා. ගරු සභාපතිතුමනි මේ පුංචි ඉල්ලීම විතරක් මට ලබාදෙන්න සිහිපත් කරමින් සියලු දෙනාට සුබ දවසක් කියලා මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී එන්.වී පතිනායක මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. ගරු සභාපතිතුමනි, මම යෝජනා දෙකක් ඉදිරිපත් කරල තියෙනවා. එක යෝජනාවක් හැටියට සභාවෙ ඉන්න කම්කරුවන් සහ යන්ත්‍රෝපකරණ එක් සතියක් එක් කොට්ඨාශයකට ඉල්ලුවා. කොට්ඨාශ පහළොවයි තියෙන්නේ. මාස හතරක වගේ කාලයක් තමයි මේ සියලු කොට්ඨාශ වලට බෙදී යන්නේ. ඒ නිසා ඒ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඉරිදා දින පැවැත්වෙන උපකාරක පංති නිසා දහම් පාසල්වලට පැමිණෙන ළමුන් සංඛ්‍යාව අඩුවෙලා තියෙනවා. ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින ළමයින්ට පංති පැවැත්වෙනවා. ඒ ගැන සභාවේ යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉරිදා දින උදේ වරුවේ පැවැත්වෙන උපකාරක පන්ති නවත්වන්න අපට ගන්න පුලුවන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන්න. ඒ වගේම අපේ ආණ්ඩුකාරතුමා, අපේ මන්ත්‍රීතුමියන්ට ඒ සම්බන්ධයෙන් ප්‍රධානත්වය ගන්න කිව්වා. නමුත් මන්ත්‍රීතුමියන්ගේ අතින් ඒ අදහස සභාවට ඉදිරිපත් වුනේ නැහැ. ඒ නිසා මම සභාවට මෙය යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා. මීට පෙරත් මේක යෝජනා වුණාට ක්‍රියාත්මක වුණේ නැහැ.

ඒ වගේම ඌරල ක්‍රීඩාංගණයට මුදලක් ඇවිල්ල තියනවා. අපේ හිටපු සභාපතිතුමන් කියනවා. ක්‍රීඩාංගණය සභාවට අයිති කිය.ලා නමුත් අපි මොන දේ කරන්න ගියත් විදුහලෙන් අවසර ගන්න ඕන. ළඟදී බක් මහ උළෙලක් පවත්වනවා. ඒකටත් අපි විදුහලෙන් අවසර ගන්න තමයි ඉන්නේ. විදුහල්පතිතුමා කියනවා විදුහලට අයිති කියලා, මෙතුමා කියනවා සභාවට අයිති කියලා. මේ වෙන්වෙච්ච මුදල්වලින් සංවර්ධනයක් කෙරෙන්න ඕන. මම කියන්නේ පුලුවන්නම් සභාවට පවරගන්න. දැනටත් අවට ඉන්න ඉඩම් හිමියෝ විසින් ක්‍රීඩාංගණයෙන් විශාල ප්‍රමාණයක් අත්පත් කරගෙන තියෙන්නේ. මැනුම් කටයුතු නැහැ. මේ ක්‍රීඩාංගණයට ප්ලෑන් එකක් තියෙනවා. ඒක අනිවාර්යෙන් නිරවුල් කරගන්න ඕන. ඒ වගේම අපට මතක තිබුණ කාලයේ හැටියට ඇළට බහින්න තොටුපොළක් තිබුණා. මම හිතන්නේ තව මාස හයක් විතර යනකොට ඒ තොටුපළක් වැහිලා යන තත්ත්වයට පදිංචිකරුවන් විසින් ඉඩම් අත්පත් කරගෙන තියෙන්නේ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම මාස හයකට විතර උඩදී සභාවෙන් ඉල්ලීමක් කළා. කටඹුරාවෙ වැඩිහිටි නිවාසයේ කුණු ගන්න කියලා. ටැක්ටරේ උනන්විටිය ට යනවා, නාගොඩ හරහා ඌරල ශෙඩ් එක ළඟට යනවා. තෙල් පිරවුම් හලේ කුණු ටික විතරයි ගන්නේ. ඒ නිසා කටඹුරාවෙ වැඩිහිටි නිවාසෙ

කුණු ටික ගන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම දැන් අපේ ප්‍රදේශයේ ඉඩම් කට්ටිකර විකුණනවා. සභාව දැනුවත් නැහැ. වීථි රේඛා ලබා ගෙන නැහැ. ඉඩම් ගත්ත පුද්ගලයත් එක්ක මම කතා කලා. ඒ ගැනත් අවධානයක් යොමු කරන්න. ඉඩමක් කැබලි කනකොට, පාරවල් වෙන් කරන විට නීතිමය රාමුවක් තියෙනවා. නමුත් පාරක් කපල දීලා නැහැ. ස්ථානය ඌරල නැහිනිගල පාරේ විජය වත්තෙ ඉඩම්. මම ළඟ සියලු විස්තර තියෙනවා. ගාල්ලේ එලියට් පාරේ පදිංචි වෙලා ඉන්න මිලින්ද විජේනාරායන කියන මහත්මයෙක්. ඉඩම් කට්ටි 12ක් විතර විකුණලා තියෙනවා. දුරකථන අංකය 0773016091 , මිලින්ද විජේනාරායන no 102 එළියට් පාර, ගාල්ල තමයි ලිපිනය. මම හිතන්නේ 1% ක වගේ ප්‍රමාණයක් සභාවට අය වෙන්න තියෙනවා. පසුව මේවා සභාවටත් ගැටලුකාරී තත්ත්වයන් මතු වෙන්න පුළුවන්. පසුව පාරවල් කපලා දෙන්නෙ නැහැ. ඊළඟට අපෙන් ඉල්ලීම් කරලා අපට මැදිහත් වෙලා පාර කපලා දෙන්න කියලා කියාවි. දැන්මම විසඳලා දෙන්න කියලා ඉඩම් හිමියාට කියලා තිබුණම, ඒ ප්‍රශ්න නැහැ. අක්කර 03 ට අඩු ප්‍රමාණයක් තමයි දැනට වෙන්දේසි කරලා තියෙන්නේ. ඒක නිසා අපට කොටසක් වෙන් කරන්න කියලා කියන්න බැහැ. ප්‍රජා ශාලාවක හෝ වෙනත් දෙයකට තාම මෙහෙන් අවසර අරගෙන නැහැ. නමුත් ඉඩම් කට්ටි වෙන් කරලා ඉවරයි. ඒ ටික තමයි මට දැනුම් දෙන්න තියෙන්නේ. ඒ වගේම අපේ සහබන්දු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි ඌරල නැහිනිගල මාර්ගයේ ප්‍රශ්නය නිරාකරණය කර දෙන්න කියලා ඉල්ලා සිටිමින්, ඔබ සියලු දෙනාට තෙරුවන් සරණ පතමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමා ගෙන් අවසරයි. පළමුවෙන්ම මම ගරු සභාවට මගෙන් පුංචි ඉල්ලීමක් කරනවා. උඩවැලිවිටිය ක්ෂේත්‍රාරාම විහාරස්ථානයේ දෙදිනක පින්කමක් පැවැත්වෙනවා. ඉනෝකා මන්ත්‍රීතුමිය කිව්වා වගේ එම මාර්ගය ගරු සභාපතිතුමාගේ මැදිහත් වීමෙන් සකස් කරලා දෙන්න. අපි දෙපාරක් මගේ මං දීමනාවෙන් තණකොල කැපුවා. නමුත් අද ඒ පැත්තට යන්න බැරි තත්ත්වයක් තියෙනවා. ඒ නිසා පුළුවන් කමක් තියෙනවනම්, හෙට දිනයේදී මැෂින් එක දාල මීටර් සීයක් විතර පන්සල අවට ප්‍රමාණයවත් සුද්ද කරල දෙන්න. ඒ පිළිබඳව සභාපති තුමාගේ අවධානය යොමු කරන ගමන්ම, ඒ කටයුත්ත සිදුකරලා දෙන්න කියලා සභාපතිතුමා ගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වගේම, මම ගරු සභාපතිතුමා ගෙන් හා ගරු ලේකම් තුමිය ගෙන් ඉල්ලීමක් කරනවා. අද දිනයේ සභාවේ වාර්තාව එළියට යන කොටම, ඒ සභා වාරයේදී ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිසි වෙලාවට ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සලසන්න කියන ගෞරවනීය ඉල්ලීම සිදු කරනවා. මොකද මේ සභාව තුළදී සිදු කරන කතාබහ, යෝජනාවලට ඊළඟ සභාවාරය වෙනකොට කුමක් හෝ පිළියමක් දෙන්න ඕන. අපේ ආර්ථික තත්වයත් එක්ක, මේ කියන සියලු දේවල් කරගැනීමට නොහැකි වුණත්, ඒ සඳහා යම් පිළිතුරක්, එම කාර්යයන් සඳහා අවශ්‍ය විධිවිධාන සලසා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීමත් සිදුකරනවා.

මේ වෙලාවෙ විශේෂයෙන්ම සඳහන් කරපු ගම් පෙරළිය මගින් විශාල වැඩ කොටසක් කරන්න බලාපොරොත්තු වෙනවා කියන එකට අපි සතුටු වෙනවා. හැබැයි එම වැඩ කොටසෙදි, මම මේ වන විට අහපු සහ දැකපු දේවල් වලින් තියෙන්නේ මේ ප්‍රදේශයක එක් කොට්ඨාශයක ගත්තම, එහි ගමන් කිරීමට තියෙන ප්‍රධාන මාර්ගයට අමතරව අතුරු මාර්ග, අතුරු මාර්ග කියන්නේ පාදේශිය සභා පාරවල් අමතක කරලා, ඊට එහා ගිය අතුරු පාරවල් වල තමයි කටයුතු කරගෙන යන්නේ. ඒ නිසා ඒ පිළිබඳව මේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය යොමු කරලා, ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන්නයි කියන ඉල්ලීමක් මේ වෙලාවෙදි සිදුකරනවා. ඒ වගේම මම එදත් සඳහන් කළා. උඩවැලිවිටිය කොට්ඨාශය තුළ මේ වන විට මැනුම් කටයුත්තක් සිදු වෙනවා. එම කටයුත්තේදී යම් යම් අසාධාරණකම් බහුලව සිදුවෙනවා. ඊයෙ දිනයේදීත් උඩවැලිවිටිය ප්‍රදේශයේ එක් ප්‍රදේශයක මැනීම් කටයුතු සිදුකළා. ඒ ඉඩම අයිති පුද්ගලයෙක්වත් නැහැ. එය අයිති වෙන්නෙ ප්‍රාදේශීය ලේකම්තුමියට. අනවසර ඉඩමක්ට නමුත්

පොලීසියෙන් ගෙනිහිල්ලා පාරේ ගල් දාලා, ඒ අහිංසක ආරියදාස කියන මහත්මයාගේ ඉඩමේ බොහොම සුළු ප්‍රමාණයක් තියෙන්නේ. වෙනත් මාර්ගයකින් වෙන් කරලා තියන මාර්ගයක් තියෙද්දී මේ කටයුතු සිදුකරලා තියෙනවා. ඉතින් ඒ නිසා මා මේ දේවල් සඳහන් කළේ අසාධාරණයක් සිදු වුණ නිසා. ඒ පිළිබඳව සභාව හැටියට සභාපතිතුමා මේ සම්බන්ධයෙන් මැදිහත් වීමක් කළා. ඒ සම්බන්ධයෙන් තවදුරටත් මැදිහත්වීමක් කරලා අදාල කටයුතු සිදු කර දෙන්නට අවශ්‍ය අවස්ථාව සලසා ගත යුතුයි.

ඊළඟට සඳහන් කරන්න ඕන. මේ වෙලාවෙදි අපේ මන්ත්‍රීවරු සියලු දෙනාම සඳහන් කර සිටියේ, ඉදිරියේදී විශාල සංවර්ධන කාර්යයන් සිදු කරලා විශාල පෙරළියක් ඇති කිරීමට සූදානම් වෙලා ඉන්නවා කියලා. ඉතින් ඒ කෙසේ වෙතත්, අපි දන්නවා පස්වන විධායක ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය තුළ මෙරට සුවිශේෂී කාර්යභාරයක් කළා. ඒ නිසා කාටත් අමතක වෙච්ච දෙයක් තමයි අපි මොන සංවර්ධනය කළත් මිනිසුන්ගේ හදවතට කිට්ටු නොවුනොත්, මිනිස්සුන්ට ජීවත් වෙන්න පරිසරයක්, වටපිටාවක් නිර්මාණය නොකළොත්, අපි සියලු දෙනාටම අත්විඳින්න වෙන්නේ එදා ඒ අපිට විඳින්න සිදුවුන අත්විදීම තමයි. මේ දිනවල නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වෙනවා. මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වෙන ආකාරය පිළිබඳ අපි හරි සතුටුයි. මොකද ඒක භුක්ති විඳින්නේ කණ්ඩායමක් විතරයි. ඔබතුමාල මේ පාරවල් කොන්ක්‍රීට් කරලා, පාරවල් හදලා, මොන දේ කරත් මිනිසුන්ගේ හදවත් වලට කිට්ටු වෙන්න බැහැ. පසුගිය දිනවල අයවැයක් ඉදිරිපත් කළා. ඒ අය වැය තුළිනුත් අපි දැක්කෙ රටේ සියලුම දෙනා ණය කාරයෝ කරන අය වැයක්. නිදහස් අධ්‍යාපනය තියෙන රටේ නිදහස් අධ්‍යාපනය පවා තියෙන තත්ත්වයකට නෙවෙයි ණය දීලා තමයි අධ්‍යාපන රටාවත් ඉදිරියට කරගෙන යන්නේ. ඒවා හොඳ පූර්වාදර්ශ නෙවෙයි. මම දේශපාලනය ගැන කතා කරන්නෙ නැහැ. මගේ අදහස තමයි මම කියන්නෙ. මා විශ්වාස කරනවා ඒ වගේ දේවල් තුළින් අපේ රටට අහිතකර බලපෑම් ඉදිරියට සිදුවෙන්න පුළුවන්. මොකද හැම අංශයකින්ම ණය දිය තමයි මේ කටයුතු සිදු කරන්න බලාපොරොත්තු වෙන්නේ. මේ අපේ රට කෘෂිකාර්මික රටක්. දණ්ඩක් බිමට දැම්මත්, පැලවෙන රටේ කෘෂිකර්මාන්තය පිළිබඳ කිසිම වැඩපිළිවෙළක් නැහැ. එමගින් රට ස්වයංපෝෂිත කරන්න බැරි වෙනවා. ඒ නිසා එළිවෙන ජාමෙට හොඳ හොඳ සෙල්ලම් කිව්වට, ඒක කරන්න බැරි වෙනවා. ඒ වගේම අපි මොන යෝජනා කළත්, රටේ ආර්ථිකය, ප්‍රදේශයේ ආර්ථිකය ශක්තිමත් වෙන්න ඕන. ඒ සඳහා අවශ්‍ය පහසුකම් අපට අවශ්‍යයි. නමුත් මේ රටේ අද තියෙන තත්වය අනුව බදු මත තමයි යැපෙන්නේ. ඒ නිසා බදු මත යැපෙන ආර්ථිකයක් තුළ මේ බලාපොරොත්තු වන කාර්යයක් ඉදිරියට කරන්න ලැබෙයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. කුමන රජයෙන් හෝ සංවර්ධන කටයුත්තක් කරනවා නම් ඒ සඳහා අපේ සහයෝගය නිරන්තරයෙන් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. පක්ෂ පාට භේදයක් නැතුව ගරු සභාපතිතුමාගෙන් මම නැවත ඉල්ලීමක් කරනවා. මේ මාර්ගය ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා. ඒ වගේම ගයන්ති මන්ත්‍රීතුමියගේ උපන්දිනයට සුභ පතනවා. හැම දෙනාටම සුභ අනාගතයක්.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා, ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ඇත්තටම සභාව පිහිටුවලා වසරක් ගතවෙන මොහොත, ගිය මාසෙ විතරයි වචනයක් ප්‍රකාශ නොකර සිටීයෙ. අදත් කතා නොකරන්න හිටියේ, නමුත් අවසාන මොහොතේ කතා කළ යුතුයි කියලා මට හිතුණා. ඇත්තටම දැන් ගම්වල ප්‍රශ්න බැලුවම, යටලමත්ත ප්‍රදේශය ගැන බැලුවම ගැන අපි සභාපතිතුමාට කිසිම කරදරයක් කලේ නැහැ. අපි සභාපතිතුමා අපහසුතාවයට ලක් කලේ නැහැ. එතුමන් සමග සහයෝගයෙන් වැඩ කරනවා. ඒ වගේම යටලමත්තට විතරක් ලක්ෂ පනස්පහක්. ඒ වගේම අවශ්‍ය පාලම් තුනක් තිබුණා. ඒ පාලම්තුනට ගිය මාසේ මුල්ගල් තිව්වා. අපි පක්ෂ පාට භේදයක් නැතිව කටයුතු කළා. ඒ වගේම ලොකු අවශ්‍යතාවයක් තිබුණා යටලමත්තේ කනත්තෙගොඩ පාලම, ඒ මොකද සෞඛ්‍ය සායන

මධ්‍යස්ථානයක් තියෙනවා. ඒ නිසා ඒ පාලම අත්‍යාවශ්‍යයි. ඒ පාලම අපි උණ බම්බු දෙකක් ගැටගහලා තියෙන්නේ. හදිසි අනතුරක් වුණොත්, කරන්න දෙයක් නැති නිසා, මේ මාසේ අන්තිම සතියේ වැඩ පටන් ගන්නවා කිව්වා. මේ සභාවේ කළ යුතු වැඩ ටික වුණත්, අපි අපේ සභාපතිතුමාට කරදර කරන්නේ නැතුව ඉන්නෙ. මොකද මේකෙ තත්ත්වය අපි දන්නවා. සභාපතිතුමා අපිත් එක්ක නිතරම ඉන්නවා. මම මාසයක් තිස්සේ ඉල්ලීම් කරන ලයිට් එක නම් ලැබුණේ නැහැ. යෝජනා ටිකක් තාම එහෙම තියෙනවා. මුදල් ප්‍රතිපාදන තියෙන හැටියට තමයි යෝජනා කරන්නේ. මම හිතන්නේ යටලමත්ත ට ලොකු සංවර්ධන වැඩකොටසක් කෙරෙනවා. ඇත්තටම යටලමත්තේ විජිත් සහබන්දු මහත්තයා අපිත් එක්ක නොහිටියට, අපි යටලමත්තේ වසම් තුනේම වැඩ කරනවා. මේ පාර අපි එතුමට කරේ නෑ කියන්න බැරි විදිහට වැඩ කරනවා. මොකද එතුමා අපි එක්ක සම්බන්ධ වෙනවනම්, අපි ගොකු වැඩ කොටසක් කරනවා. ඉදිරියේදී සංවර්ධන කටයුතුවලට තව මුදල් එනව කිවුවා. එයිනුත් නිසි ආකාරයෙන් කරන්න තියෙන්නෙ සභාව සතු යටලමත්ත හරහා මාමනදොල පාර. එම පාරෙත් යන්න බැරුව තිබුණා. ගිය මාසේ 03 වෙනිදා යටලමත්ත හංදියේ ඉඳලා බරව මුල්ලේ ගෙවල් 20 දක්වා ශ්‍රමදානයක් සිදුකළා. අපේ සභාවේ සේවකයෝ අඩුයි කිව්වා. නමුත් සභාපතිතුමා නිතරම යටලමත්ත ගැන අවධානය යොමු කරනවා. ඒ වගේම සහබන්දු මහත්තයා සමුපකාර කටයුතු කළා ඒ වෙලාවෙත් මම සහබන්දු මහත්තයත් එක්ක කටයුතු කළා. මොකද මොකද එතුමා ඇත්තටම වැඩ කරන නිසා. සමුපකාර අධ්‍යක්ෂක මණ්ඩලය වෙලාවෙදි අවුරුදු ගාණක් වැඩ කළා. සමුපකාර ගොඩනැගිල්ල අයිතිකාරයා දෙන්නෙ නැති කොට ඌරල ඔබතුමා ගොඩනැගිල්ල හදනකොට යටලමත්තෙන් එතැනට ගියේ මම විතරයි. වෙන කවුරුත් ඉදිරිපත් වුනේ නැහැ. ඒ වගේ කරන්න ඕන තැනට වැඩ කරනවා. ඒ වගේම මම හිතන්නේ මේ මාසේ 17 වෙනිදා මාමානදොල ධර්මශාලාවට මුල්ගල් කියනවා. ඒ සඳහා ලක්ෂ 40 ක මුදලක් වැය වෙනවා. ඒ සඳහා මට ආරාධනා කරන්න බැහැ. නන්දන මන්ත්‍රීතුමා ආරාධනා කරාවි. අපි ළඟ ඉන්න ගයන්ති මන්ත්‍රීතුමිය ප්‍රවර්ධන වැඩසටහනක් කළා. උත්සව අවස්ථාවකදී මෙතුමිය සම්බන්ධ කරගන්න. එම කෑම රසයි. සභාපතිතුමා කිව්වා පිරිත් පිංකමක් කරනවා කියලා. ඒ ගැන සභාපතිතුමාගෙ කතාවෙදි දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ගයන්ති මන්ත්‍රීතුමියට සුබ උපන්දිනයකට සුභ පතනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, මම අහන්න කැමතියි. මම ගිය සභාවේ මතක් කළා. පුස්තකාලය පිළිබඳව, ඒ වගේම ඇළවල් අයින් වල කුණු දාන එක ගැන පොඩි අදහසක් මගේ කතාවේදී කිව්වා. ඒ පිළිබඳ ඔබතුමා ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද? ඒ වගේම කටුපොල් වගාව ගැනත් අපි නොයෙක් දේවල් කතා කලා. ඒ වගේම නෙලී මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා. එතුමිය හොඳ කතාවක් කළා. එතුමිය 95% ක්ම අපිත් එක්ක තමයි ඉන්නේ.

ඒ වගේම මේ කටු පොල් වගාව ගැන නොවෙයි. කටු පොල් කර්මාන්තශාලාවේ අපද්‍රව්‍ය පිටකිරීම පිළිබඳ කතා කරන්න ඕන. මේ කටු පොල් කර්මාන්ත ශාලාව හදලා තියෙන්නේ අපද්‍රව්‍ය මාමනදොල ඇළට දාන්න හිතාගෙන. ඒ ඇළ දිගේ කිලෝමීටර් ගානක් ඇවිල්ල මේ ඇළ මාර්ගය අගුරුවලින් ගඟට එකතු වෙනවා. මේ අය හැමදාම කියන්නේ අත්වැරදීම් සිදුවුණා කියලා. මේ වෙලාවේ අපද්‍රව්‍ය පිට කරන්න හදපු වලවල්වලට පිට කරන්න පුළුවන් ¼ යි. අනිත් ¾ ම මාමනදොල ඇළට පිට කරන්න තමයි මේ අය මේක හදලා තියෙන්නේ. ඒ පිළිබඳ කාර්මික නිලධාරී යම් පරීක්ෂණයක් කළොත්, පරිසර බලපත්‍රය නැතුව මේ කරගෙන යන දේ වැරදියි. ඒ වගේම සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා වගේ, බලූ කපුටු දානයක් දෙන්න වත් කපුටෙක් හොයාගන්න නැහැ. ඒ වගේම ඒ ප්‍රදේශයේ හිටපු මීමැස්සා, මීමින්නන්, වගේ සත්තු සම්පූර්ණයෙන්ම වඳ වෙලා ගිහිල්ලා ඌරල ජිනදාස විජේතුංග මහත්මයා ලියපු last for my peak කියන පොතේ ලියලා තියනවා. අපේ ගම්වල මිනිස්සු ආහාරයට ගත්ත මිරිදිය මාළු, පැරණි ගෙවල්වල මිරිදිය ධීවර කර්මාන්තයට අදාළ ආම්පන්න තිබුණු බව හා මේ ගමේ මිනිසුන්

මේ ඇළෙන් පෝෂණය වූ බවත් එම කෘතියේ සඳහන් වෙලා තිබුනා. පිටගම් වලිනුත් මිනිස්සු මේ ඇලේ නාන්න එනවා. හරි ලස්සන සුන්දර පරිසරයක් තිබුණා. මේ සියල්ල විනාශ වුණේ කටුපොල් වගාව නිසා. හැමදාම මොන ක්‍රමයකින් හරි මේ ඇළ මාර්ගයට ඒ අපද්‍රව්‍ය වතුර පිට කරනවා. කොහෙන් හරි නිලධාරී කෙනෙක් ගිහිල්ලා කතා කරනකොට, ඒ අයට උදව් උපකාර කරන කොටසක් ඉන්නවා. මේ ඇල පෝෂක ප්‍රදේශ යටලමත්ත, උඩලමත්ත, බෙම්බඩ ප්‍රදේශවල තේ වගාව සම්පූර්ණයෙන් ම විනාශ වුණේ මේ කටුපොල් වගාව හින්දා. ඒ අය කියනවා වෙනත් පළාත්වලත් ගංවතුරට තේ මැරුණා කියලා. බෙම්බඩ ප්‍රදේශයේ තේ ගස්වල දළු තවම නැහැ. නිසරු බිමක් බවට පත්වෙලා. ඒ වගේම කී දෙනෙකුට රැකියා අහිමි වෙලා ද? සතා සිවුපාවා, තියා මනුස්සයෙකුටවත් ජීවත්වෙන බැරි තත්වයකට පත්වෙලා තියෙනවා. ඒ නිසා මෙම කටුපොල් කර්මාන්තශාලාව වහන්න කටයුතු කරන්න කියලා මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාට කරන්න පුළුවන් සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න. සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මම මේ අවස්ථාවේ ප්‍රථමයෙන්ම අපේ ගයන්ති මන්ත්‍රීතුමියට සුබ උපන්දිනයක් කියලා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, විදුලි ලාම්පු ගැන කතා කරද්දි, මේ වන විට මගේ කොට්ඨාශයේ 90% ක් පමණ විදුලිය අලුත්වැඩියා කටයුතු අවසන් කරලා තියෙනවා. ඒ පිළිබඳ ඔබතුමාටත්, ඒ සඳහා යන විදුලි කාර්මික මහතා ඇතුළු මහත්වරුන් තුන් දෙනාටත් මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. විදුලි ලාම්පු හදන්න කියලා මම කවදාවත් සභාපතිතුමාට කරදර කරේ නැහැ. ප්‍රායෝගිකව බලද්දි දවසකට හදන්න පුළුවන් විදුලි පහන් ප්‍රමාණයක් තියෙනවා. ඒ බලද්දි විදුලිය සම්පූර්ණයෙන්ම වයර් දාලා, අලුත්වැඩියා කටයුතු කරනවා නම්, දවසකට විදුලි පහන් දහයක්වත් හදන්න බැහැ. සමහර කණුවල තියෙන්නෙ බල්බ් එක සවි කරන කොක්ක විතරයි. වයර්, ස්විච් මොනවත් නැහැ. ඒ නිසා ප්‍රායෝගිකව බලද්දී, අවුරුද්දක් ඇතුළත විදුලි කාර්මික නිලධාරීතුමා මෙතන නිකං හිටියෙත් නැහැ. සභාපතිතුමා යවන්නේ නැතුව හිටියේ නැහැ. අවුරුද්දක් ඇතුළත වැඩ කරා. ඒ නිසා කඩේ යනවා නෙවෙයි. ඇත්ත කතා කරන්නේ.

ඒ වගේම ගරු සභාපතිතුමා, මගේ කොට්ඨාශයේ පොදු ළිං ප්‍රමාණයක් තියෙනවා. ඒ මේ වන විට ජනතාව පාවිච්චි කරනවා. ඒ ටික ඉහලා පිරිසුදු කරලා දෙන්න. එනිසා ඉදිරියේදී ඒ කටයුතු සිදු වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වගේම පඤ්ඤාලෝක මාවත පාර අයිනේ පාවිච්චි නොකරන පොදු ළිඳක් මේ වන විට ගරා වැටිලා, බාගෙට වැහිලා තියෙනවා. ගම්වාසීන් ඒ පිළිබඳ දැනුවත් කළා. ඉතා අවදානම් සහගත තත්ත්වයක් තියෙනවා. ඒ නිසා ඒ ළිඳ වසා දමන මෙන් ඉල්ලා සිටිනවා. ඔබ සැමට සුභ අනාගතයක්.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමනි පන්සලේ පැවැත්වෙන රැස්වීමට සහභාගිවීම සඳහා මට බැහැර වීම සඳහා අවසර ලබාදෙන මෙන් ඉල්ලා සිටිනවා

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ගරු මන්ත්‍රීවරුනි මේ අවස්ථාවේ දීර්ඝ සභා රැස්වීම පවත්වලා අවසාන මොහොතේ මම නැගී සිටියේ වැදගත්ම කරුණ පිළිබඳව කතා කිරීමටයි. ඒ ගැන කිසි කෙනෙක් කතා කළේ නැහැ. දැන් අපේ සභාවේ මූල්‍ය ශේෂය ලක්ෂ 32යි. ඔබතුමා ළඟ තියෙන වාර්තාවල සඳහන් වෙනවා. ලක්ෂ 70 කින් ආරම්භ වෙච්ච සභාව, ලක්ෂ තිස් දෙකකට අඩු වෙලා තියෙනවා. අපට තව තියෙන්නෙ වසරක කාලයක් විතරයි. තව වසරක් යනකොට මේක බිංදුවටම

බහිනවා. ගෙවී ගිය මාස 12 ක කාලය තුළ එක් අවස්ථාවක ලක්ෂ දෙකකුත් ගානක් සභාපතිතුමාට ලැබිලා තිබුණා. මුද්දර ගාස්තු හා දඩ මුදල් දැන් අඩු වෙනවා. මත්ද්‍රව්‍ය නිවාරණය සමඟ උසාවි වලින් ලැබෙන දඩ මුදලුත් අඩු වෙනවා. ඉඩම් වෙන්දේසි වලින් සහ අනිකුත් ඔප්පු තිරප්පු ලියනකොට ලැබෙන මුදලත් අඩු වෙනවා. මේ ආකාරයෙන් තව වසරක කාලයක් යනකොට අපේ දුරකථන බිල සහ ඉන්ධන දීමනා මුලින් ම නතර වෙනවා. පස්සේ අතීතයේ සිදුවුන වගේ අපේ දීමනාව ලැබෙන්නේ මාස දෙකක් තුනක් ගියාට පස්සේ. දැන් මුදල් ප්‍රතිපූර්ණය වෙන්නේ නැහැ. අපි මේ සභාවට ඇවිල්ලා මොනවද ආරම්භ කළේ, කොතනින්ද, අවසාන කළේ කොතනින්ද? රටේ වල් පල් හා වෙනත් අදාළ නොවන කරුණු කතා කළත්, කෙටියෙන් අපේ සභා පනත් එක්ක තීන්දු තීරණ ගන්නේ නැතුව ඒව සාකච්ඡා කරලා පිට වෙලා යනවා. ඒ නිසා අපි ගරු මන්ත්‍රීවරුන් ගෙන් ඉල්ලා සිටිනවා. ලබන සභාවට වත් මේකට උපක්‍රමශීලීව මුහුණ දෙන්නේ කොහොම ද යන්න පිළිබඳව කතා බහ කළ යුතුයි. අද මේ සභාව නඩත්තු කරගන්න බැහැ. සභාපතිතුමා නිතරම කියනවා. ආදායම හා වියදම තුලනය වෙන්නේ නැහැ. හැමදාම සෘණ අගයක් ගන්නවා. අද මේ සභාවේ විදුලි බිල, වතුර බිල ගෙවාගන්න බැරි තත්ත්වයට පත්වෙලා තියනවා. මේ තියන සල්ලි වලින් ගෙවනවා. නමුත් අපේ ආදායමට සරිලන ආකාරයෙන් වියදම සකස් කරගන්න බැරිවෙලා තියෙනවා. අපි නිවසක නම් මුදල් වියදම් අය කරන ආකාරය පිළිබඳව අපි කලින් සැලසුම් කරනවා. අපි ඒක ආදායමට වියදම තුලනය කරගන්න උත්සාහ ගන්නවා. ඉතාමත් කල්පනාකාරීව තමයි අපි ගෙදර ආදායම වියදම හසුරුවන්නේ. සභාවේ සභාපතිතුමාට නමුත් මේ සභාවේ ආදායම වියදම තුලනය කර ගන්න බැරි තත්ත්වයට පත්වෙලා තියෙනවා. එතුමාගේ දර්ශනයක් තියෙනවා. ආරම්භයේ ඉඳලා අපි මේ මුදල ඉතුරු කරගෙන යම් ප්‍රධාන කාර්යයක් කරන්න. ඉලක්කයට යන්න පුළුවන් ද, යන්න බැරිද කියන එක පිළිබඳව දැන් තමයි සාකච්ඡා කරන්නේ. මේ සභාවේ ඉදන් ඉදිරි සභාවලට මෙම සාකච්ඡා නොවුනොත්, එක පාරටම කඩා වැටිලා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ගේ එක ඉල්ලීමක් වත් කරගන්න බැරුව අනාථ වෙලා කිසි දෙයක් කරගන්න බැරි තත්ත්වයට පත්වෙනවා. අපි මේකට මුහුණ දෙන්නෙ කොහොමද කියන එක පිළිබඳව ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ඊළග සභාවෙ ඉදන් සාකච්ඡා කරමු. දැන් මම මේ කියන්නේ අපේ උඩලමත්ත කොට්ඨාස වීථි පහන් පිළිබඳව ම එතරම් තැකීමක් කළේ නැහැ. ප්‍රධාන මාර්ගවල සභාපතිතුමා සකස් කරල තිබුනා. අතුරු මාර්ග වලට ගියේම නැහැ. ඒක මම දන්නවා. අනවශ්‍ය විදිහට වීථිපහන් පහුගිය කාලය තුල සකස් කළා. එදා මේ සභාවේ වැඩ කරපු සේවකයෙක්ගේ නිවස ගාවත් වීථි පහන් සවිකලා. මේ වගේ නොගැළපෙන තැන් වලට වීථි පහන් සවි කරාම සිදුවෙන්නේ, හැමෝම කණුවෙන්, කණුව හන්දියෙන්, හන්දිය වීථි පහන් ඉල්ලනවා. මේ ක්‍රමය ක්‍රමානුකූලව විධිමත් වෙලා නැහැ. ඒ නිසා තමයි මෙහෙම මේ තත්ත්වයට පත් වෙලා තියෙන්නේ. ඒ නිසා මේවට මුහුණ දෙන ආකාරය පිළිබඳව ගරු මන්ත්‍රීතුමාන්ලාට සභාවෙන් හරි, පිටතදි හරි සාකච්ඡා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම අපේ ගමේ හාමුදුරුවෝ ඇත්තෙන්ම උතුම් හාමුදුරුවන් වහන්සේ නමක්. හැම කඨින පිංකමකටම මුළු මාර්ග පද්ධතියම ශ්‍රමදාන මගින් සකස් කරනවා. උන්වහන්සේගේ වියදමින් පෙට්‍රල් දාලා, මැෂින් දාලා, ප්‍රධාන මාර්ගය සුද්ධ කරනවා. . තරුණ පිරිසක් එකතු කරගෙන අපි ඒවට සහයෝගය දෙනවා. අද ගමේ හතු පිපෙනවා වගේ ස්වේච්ඡා සංවිධාන බිහි වෙලා තියෙනවා. නමුත් මේවා මගින් කරන කාර්යය කුමක්ද? කිසි කෙනෙක් ප්‍රජා දායකත්වය දෙන්නේ නැහැ. ඒ සංවිධානයට ගොනුවෙලා, කොටු වෙලා තමන්ගෙ වැඩේ කරගන්නවා ඇරෙන්න ප්‍රජා දායකත්වයක් ලබා දෙන්නේ නැහැ. අපේ ගමේ සමිති තියෙනවා. පොඩි පොඩි ශමදාන කරනවා. නමුත්, ගරු සභාපතිතුමනි ඔබ තුමාට අයිතියක් තියෙනවා. ප්‍රදේශවල තියෙන ස්වේච්ඡා සංවිධාන අමතන්න. ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කරලා, ඒවායේ විස්තර අරගෙන, මෙම සමිතිවල දායකත්වය ලබාගත හැකි ක්‍රමවේදයක් හදන්න. ඔබතුමාට අයිතියක් තියෙනවා. එනිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ සම්බන්ධව කටයුතු කරන්න කියලා. ඒ වගේම අපි සාකච්ඡා කළ යුතු කරුණු කාරණා

රාශියක් තියෙනවා. විශේෂයෙන්ම මේ බැංකුගත ශේෂය හීන වීම පිළිබඳව තවදුරටත් අපි කල්පනා නොකලොත්, මේ සභාවට ඇවිල්ල ජනතාව වෙනුවෙන් කිසි දෙයක් කරන්න බැරිව අන්ත අසරණ තත්වයකට පත් වෙන බව මම විශේෂයෙන්ම මතක් කරන්න කැමතියි. මේ සඳහා මම පහුගිය දවස්වල ලේකම්තුමිය සමඟත් කතා කළා. සභාපතිතුමාත් දැනුවත් කරලා අපි වහාම මේ සඳහා ආදායම් උපයා ගැනීමේ මාර්ග වශයෙන් මම හඳුනාගත්තා. ත්‍රීරෝද රථ ගාල් ඇති කරන්න. ඒ සඳහා අවශ්‍ය අණපනත් හික්කඩුව, ගාල්ල වගේ ප්‍රාදේශීය සභාවලින් ගෙන්නගෙන අවශ්‍ය කෙටුම්පත් සකස් කරලා, සභාවට දාලා අනුමත කරන්න තියෙන්නෙ. ඒවා ගෙනත් දෙන්න ඒ වගේම ඒවා සකස් කරන්න දැනුමක් නැහැ. දැනුම තියෙන නිලධාරී හිටියත් ඒවා ක්‍රියාවේ යොදවන්න අමාරුයි. අපි ඒ පනත් ගෙනල්ලා සභාවේ සම්මත කරගෙන, යටලමත්ත, මාපලගම, නාගොඩ, තල්ගස්වල, උඩුගම, වගේ නගර වල ත්‍රීරෝද රථ ගාල් ඇති කරන්න පුළුවන්. ඒවා නියමානුකූල කරලා, සමගිය ඇති කරලා, වගකීම් බාර දීලා, ඒ අය ආදායම් ලබන කොට, අපටත් යම් මුදලක් ලබාගැනීමේ හැකියාවක් ඇති කළ යුතුයි කියලා සභාව හමුවේ කියනවා. ඒ ගැන සාකච්ඡා කරන්න.

වරිපනම් ලබාගැනීමේදී, වරිපනම් ලබාගන්න ක්‍රමවේදයක් සකස් කරන්න. කොට්ඨාශයක් හඳුනගෙන, දැන්වීම් මගින් ප්‍රචාරණයක් දීලා, උඩුගම කොට්ඨාශයේ වරිපණම් අය කිරීම සඳහා සැලසුම් කරන බවට ජනතාව දැනුවත් කරලා, ඒ සඳහා ජනතාවගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදෙන්න. ඒ ජනතාවගේ අදහස් හා යෝජනා අරගෙන මෙන්න මෙතනට වෙනකම් අපි වරිපනම් අය කරනවා කියලා තීරණයක් ගනිමු. අපේ අජිත් මන්ත්‍රීතුමා ඉන්න කොට්ඨාසයේ අලුත්වත්ත දක්වා ජනතාව වරිපනම් ගෙවලා ඒ පහසුකම් සලසා දෙනවට කැමතියි. දැනටත් අලුත්වත්ත ප්‍රදේශයේ ජනතාව නිරතුරුවම කුණු එකතු කරන්න ගියාට දැන් යන්නේ නැහැයි කියලා මැසිවිලි නගනවා. පස්සේ කැටගොඩ ස්ටෑන්ඩ් එකට එහා ගල්ලන්දලට වෙනකම් යන්න පුළුවන්. නමුත් මොරගල්මුල්ල ප්‍රධාන පාර අයිනේ යම් පිරිසක් හඳුනාගෙන, එය සිතියම් ගත කරලා, ඒ ක්‍රමය අනුගමනය කරන්න. සමහර ප්‍රදේශ තියෙනවා ගමගොඩ, මොරගල්මුල්ල ප්‍රදේශයේ මේවා ගෙවන්න බැරි දුප්පත් ජනතාව අතැරලා, යම් කොට්ඨාශයක් හඳුනාගෙන 2020 වෙනකොට මේ බදු අය කරගැනීමේ ක්‍රමවේදයක් කළොත්, යම් සහනයක් ලබාගත හැකියි කියලා මම කියනවා. ඒ වගේම යෝජනා කරනවා. ඒ සඳහා දැන්ම සූදානම් වෙන්න ඕන. දැන්ම මේ කාර්යය සඳහා නිලධාරී මහත්මයෙක් තෝරාගෙන, වරිපනම් ලබා ගැනීමේ ක්‍රියාදාමය පිළිබඳව අන පනත් සභා සම්මත කරගෙන, ඒ නිලධාරි මහතා සූදානම් කරගන්න ඕන. ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ කාර්යාලයේ නිලධාරී මහතකුට මේ සඳහා අවශ්‍ය පහසුකම් එනම් ඩීසල් ටිකක් ගහලා කැබ් රථය ලබාදීලා, ඒ අවශ්‍ය පහසුකම් දීලා කටයුතු කරන්න. ඒ කටයුතු කිරීමේදී ඒ සම්බන්ධව නිලධාරි මහතාට ක්‍රියාදාමය පිළිබඳව දැනුවත් කිරීමක් සිදුකර, අපටත් සාකච්ඡාවක් ලබා දෙන්න. මුල ඉඳලම අඳුරේ අතපත ගානවා වගේ වැඩ කරලා වැඩක් නැහැ. ඒ නිසා නිශ්චිත ක්‍රියාදාමයන් සකස් කරලා, ලබන වසරේ සිටවත් යම් ආදායමක් ලබාගන්න කටයුතු කරන්න.

ඊළඟට විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි. ගරු ආණ්ඩු පක්ෂ මන්ත්‍රීතුමන්ලාගේ ගම්පෙරළිය දැන් දෙවෙනි පාරටත් එනවා. මේ සභාවේ ගම්පෙරළිය යෝජනා සම්මත වුණා. ලක්ෂ කෝටි ගණන් කියනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම සිහිපත් කරන්න කැමතියි. අපිත් ආණ්ඩු බලය තියෙද්දි, පළාත් සභා බලය තියෙද්දි, කෝටි ගණන් වල වැඩ කරා. හොරගහකන්ද පාර කාපට් කරන්න එක්කෝටි හැට පන් ලක්ෂයක් වැය වුණා. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ, වැඩ කරාට විතරක් මිනිස්සු කැමති වෙන්නේ නැහැ. චන්දෙ දෙන්නෙ නැහැ. එකෙක් අමුතු ක්‍රමවේදයක් තියෙනවා. ඒක නිසා මම ප්‍රාර්ථනා කරනවා තුන්වැනි වරටත් මේ සභාවේ ගම්පෙරළිය අනුමත නොවෙන්න, යෝජනා ලැයිස්තු නොවෙන්න, කටයුතු කරයි කියලා. ඉදිරි පළාත් පාලන මැතිවරණය හෝ මධ්‍යම ආණ්ඩු මැතිවරණය, ජනාධිපති මැතිවරණය යම් වෙනසක් වුනොත්, තුන්වෙනි පාරටත් සංශෝධනය වෙන බව මතක්

කරනවා. ඒ පිළිබඳව සිහිපත් කරමින් ඔබතුමාල කටයුතු කරලා ඉක්මනට මුදල් ගෙන්නගන්න. ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ රජයේ අයවැය ලේඛනයේ මුදල් එන ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා මේ මුදල් විදේශාධාර හෝ විමධ්‍යගත මුදල් නෙවෙයි. එහෙම නම් විදේශාධාර මුදල් කියලා, ආසියානු සංවර්ධන ආධාර කියලා එනවා. එහෙම නෙවෙයි යම්කිසි ක්‍රමවේදයක් හඳුන්වලා දීලා, යෝජනා අරගෙන කියනවා විතරයි. ඒ නිසා අපි ආණ්ඩු පක්ෂයේ මේකට මැදිහත් වෙච්ච මන්ත්‍රීවරුන්ට කියන.වා පුලුවන්නම් මුදල් ගමට ගේන්න. අපිත් කැමතියි ගම සංවර්ධනය කරන්න.

විශේෂයෙන් මතක් කරන්න ඕන තව කරුණක් තියෙනවා. ලේකම්තුමිය විසින් මාර්ග පවරාගන්න ලයිස්තු දෙන්න කියලා ලියුමක් එව්වා. ඒකත් කඩිනම් කරන්න. සහබන්දු මහත්තයා ගිය සභාව් ඉදිරිපත් කළා. උඩලමත්ත ගමේ බීරිගෙවත්ත මාර්ගය මුල්ම සභාවේ මම අත්සන් ලේඛනයකුත් එක්ක ගෙනත් දුන්නා. දැන් ඔබතුමා මුනගැහුනත්, මම මුනගැහුනත් එම පුද්ගලයා අහනවා මොකද්ද වුනේ කියලා. ඒ නිසා මේ ගරු මන්ත්‍රීතුමාලගේ යෝජනා එක එක කාලෙට අරගෙන මේක කරන්න බැහැ. ඒක ගැසට් වෙන්න ඕන. ගැසට් එකට ඔක්කොම නම් ටික යන්න ඕන. එක නමකට මේක යවලා වැඩක් නැහැ. ඊට පස්සේ මේ ක්‍රමවේදය කාට හරි භාර දුන්නම, දිග, පළල මනින්න අපේ තාක්ෂණ නිලධාරීට හරි කාට හරි යන්න ඕන. ඒ නිසා එක එක්කෙනා එක එක වෙලාවට යෝජනා දෙන්න එපා. ගන්නත් එපා. සභාපතිතුමනි, දිනයක් දීලා මේක ඉවරයක් කරලා , අද මේ ප්‍රදේශයේ තියෙන ප්‍රශ්න ටික නිරාකරණය කරගන්න බලන්න. කාණුවක් කපා ගන්න බැරිව තියෙනවා. වැටක් එහාට කරගන්න බැහැ. මිනිස්සු පරම්පරාගතව සින්නක්කර ඉඩම්වල තණකොල ගහක්වත් ගලවන්න දෙන්නෙ නැහැ. ඒ නිසා ප්‍රශ්න විතරයි. මේ මාස දෙක, තුනක කාලයේ ඉවරයක් කරලා, ලබන වසර වෙනකොට මේ ප්‍රශ්න වලට පිළිතුරු දෙන්න, ඔබතුමාට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ඔබ සැමට සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුලූ මන්ත්‍රිතුමන්ලාගෙන්, මන්ත්‍රිතුමියන්ලාගෙන්, ලේකම්තුමිය, මාධ්‍යවේදී මහතා ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. මම පළමුවෙන්ම, කලින් යෝජනා වූ පරිදි උඩුගම නගරය ආශ්‍රිතව වරිපනම් අය කිරීම සම්බන්ධ කටයුත්තේදී උප සභාපතිතුමා මූලික වෙලා කටයුතු කරන්න. ගරු මන්ත්‍රීවරුනි, පළමුවෙන්ම කියන්න ඕන මන්ත්‍රීවරු කිහිප දෙනෙක් යම් යම් අවශ්‍යතාවයන් වලට ගියා. සමහර කරුණු පිළිබඳව උත්තර දිය යුතු මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් මෙතන නැහැ. මම මුලින්ම කියන්න ඕන අපේ ලේකම්තුමිය 2014 වර්ෂයේ සේවයට ආවා. එතුමියට ලබන සුමානේ ස්ථාන මාරුවීම් ලැබිලා තියෙනවා. ඇත්තටම මෙතුමිය පිළිබඳව කතා කරනවනම්, සභාව විසුරුවන්න කළින් අපි සමඟ එකට කටයුතු කළා. ඊට පස්සේ අවුරුදු තුනහමාරක් තුල මෙතුමිය තමයි මේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ නායකත්වය අරගෙන කටයුතු කළේ. ඒ අතරේ අපේ සභාව සතු ඉඩම් භුක්ති වින්දට අයිතිවාසිකම් නැහැ. නමුත් ගොඩක් ඉඩම් එතුමිය මැදිහත් වෙලා ඒ කටයුතු සිදු කරලා තිබුණා. මටත් එය ලොකු පහසුවක් වුණා.

ඒ වගේම අපි දේශපාලඥයෝ හැටියට අභ්‍යන්තරය ඇතුළත යම් යම් කටයුතු, නිලධාරින්ගේ කටයුතු පිළිබඳව දන්නේ නැහැ. ඒවායේ නීත්‍යානුකූලභාවය සම්බන්ධව අපි දන්නේ නැහැ. නමුත් මෙතුමිය ඒවායේ කටයුතු නියමාකාරයෙන් කරලා තිබුණා. ඒ පිළිබඳව ඇත්තටම අපි සතුටු වෙන්න ඕන. ඒ වගේම ගරු කරන්න ඕන. මෙතුමිය යෑම තුළ මෙතනට ලොකු පාඩුවක් සිදු වෙනවා. ඒ නිසා මම එතුමියට කිව්වා. පුළුවන්නම් ඉන්න කියලා. මාර්තු මාසේ පළවෙනිදා ස්ථාන මාරුවීම් තිබුණා හතරක්. මම ලේකම්තුමාට කියලා නතර කර ගත්තා.

ඊළඟට අපේ ගරු උප සභාපතිතුමා කියපු දේ හරි, මම මේ සභාව පටන් ගෙන මාස ගානක් තුළදී මුදල් තත්වය පිළිබඳව කතා කළා. රුපියල් ලක්ෂයක් ගානේ මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාස 15ට ලක්ෂ

පහළොවක් දුන්නා. ලක්ෂ 71ක මුදල ලබා ගත්තේ අපේ උනන්දුවෙන්. ඊළඟට එකතු වූ මුදල ලෙසයි, රු. 214000.00 ක් අපට ආවේ. සියලුම මුදල් අපිට ලබා දී ඇති නිසා තමයි. මම ඔබතුමන්ලාට කිව්වේ නිතරම ආදායම වියදම බැලන්ස් කරගෙන යන්න ඕන කියලා. ඉතින් ඔබතුමාලගේ ඉල්ලීම් ඉටුකරන්න නොහැකියාව තියෙන්නේ. ඒ නිසා නැතිව මම කවදාවත් බැහැයි කියල නැහැ. හැබැයි කොහෙවත් මේ වගේ සාධාරණව වැඩ කරන්නේ නැහැ. මම එදත් කිව්වා වගේ, අපේ පාලක පක්ෂය මූලික කරගැනීම මගේ යුතුකමක්. ඒක තමයි ඇත්ත. නිකන් බොරු කියන්න ඕනෙ නැහැ. සමහර සභාවල විපක්ෂ මන්ත්‍රීවරුන්ට කතා කරන්න දෙන්නෙත් නැහැ. එච්චර බලය අරගෙන තියෙනවා. නමුත් මම කාටත් සාධාරණය ඉටුකරලා තියෙනවා. ඉතින් ඒ නිසා මම ඊට එහා යමක් කියන්නේ නැහැ. සහබන්දු මන්ත්‍රීතුමා, මට පුළුවන් ක්‍රමවේදය තුල මම හැමදෙනාටම නැහැයි, බැහැයි කියන්නේ නැහැ.

කටුපොල් වගාව ගැන කතා කිරීමේදී කටු පොල් පිළිබඳව මම පළමුවෙන්ම දැනගත්තේ උද්ඝෝෂණයකට ගිහින්. හිටපු අමාත්‍ය දොඩංගොඩ මැතිතුමා, නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා සභාපති වෙලා ඉන්න කාලේ තල්ගස්වල, උඩුගම මේ සම්බන්ධව උද්ඝෝෂණ කළා. එකේ අන්තිම ප්‍රතිඵලය වුණේ, එක රාළහාමි කෙනෙක්ගේ වැඩ තහනම් වුණ එක විතරයි. ඊළඟට හැමදාම, හැම තැනම මිනිස්සු උද්ඝෝෂණ කරනවා. දේශපාලන නායකයෝ කතා කරනවා. එතනින් ඉවරයි. වෙන දෙයක් නැහැ. අද වෙනකම් මේක නතර කරන්න බැරි වුණා. මම කියන්නේ කරනවා නම් මාරාන්තික උපවාසයක් දක්වා උද්ඝෝෂණය කරන්න ඕන. මිනිස්සු ගෙන්නලා, රවට්ටලා, බොරු කරලා වැඩක් නැහැ. බෝඩ් උස්සලා වැඩක් නැහැ. වර්තමානයේ කටු පොල් විරෝධතාවයත් එක්ක ආණ්ඩුකාරතුමාගේ සාකච්ඡාවේ දී එතුමන් කිව්වේ කටු පොල් විරෝධය දැන් යම් සාර්ථක මට්ටමක තියෙනවා. කටුපොල් වගා කරන ස්ථාන හා සියළු විස්තර සහිතව එතුමා අපෙන් ලිපියකුත් ඉල්ලුවා. ඒ අදාල ලියුම් යැව්වා. දැන් සාර්ථක ප්‍රතිඵලදායක තත්වයක තියෙනවා. ආණ්ඩුවේම මැති ඇමතිවරු තමයි මූලික වෙලා මෙම වගාව නතර නොකරන්න කටයුතු කරන්නේ කියලා තමයි හැම තැනම ආරංචි. ඒ නිසා කරනවා නම් ප්‍රතිඵලයක් ලැබෙනකන් හරි දේ කරමු.

ඊළඟට මේ කටු පොල් කර්මාන්තශාලාව පිළිබඳව කතා කරනවිට, අපි ප්‍රාදේශීය සභාව හැටියට කර්මාන්ත ශාලාවට ගියා. අවශ්‍ය නිලධාරීන් කැඳවලා ඒ සාකච්ඡාවට මට එන්න බැරි වුණා. උප සභාපතිතුමා ගියා. පෙබරවාරි 15 වනදා අවශ්‍ය ස්ථානයට යන්න යෝජනා කරගත්තා. අපි ගියා. එතනදි අපි අඩුපාඩු සකසා ගැනීමට මාර්තු 15 දක්වා කල් දුන්නා. අපි දැක්කා එතන තියන අඩුපාඩු. සෞඛ්‍ය, පරිසර ආදී අදාළ සියලු නිලධාරීන් හැමතැනින්ම ගෙන්නලා පරීක්ෂණයක් කළාට පස්සේ තමයි මාර්තු 15 වැනිදා දක්වා කල් ලබාදුන්නෙ. ඉතින් මේ ප්‍රශ්නය අද ඊයෙ ආපු එකක් නෙවෙයි. නමුත් වර්තමානයේ ඉන්න අපි තමයි එකෙන් අපහසුතාවයට පත්වෙලා තියෙන්නෙ. ඒ නිසා මේ කටයුත්තේදී අපි සාධාරණව, කිසිම කෙනෙකුට කොන්ද නමන්නේ නැතුව, වැඩ කටයුතු කරන බව මම වගකීමෙන් කියනවා.

ඒ වගේම අපේ පියල් මන්ත්‍රීතුමා, ගයාන් මන්ත්‍රීතුමා මාපලගම පාරෙ වතුර බැස නොයන ස්ථාන ගැන කතා කළා. ඒ පිළිබඳවත් අපි ආණ්ඩුකාරතුමාට කිව්වා. එතුමා දේශපාලන පක්ෂයකින් තොර ව ආපු නිදහස් මතධාරියෙක් නිසා මේ සම්බන්ධව සාධාරන නිවැරදි ක්‍රියාමාර්ගයක් ගනීවි.

ඒ වගේම රංජිත් ජයවීර මන්ත්‍රීතුමා කිව්වා ලයිට් පිළිබඳව, ගයාන් මන්ත්‍රීතුමා කිව්ව වගේ, හැම තැනටම මේ බල්බ් එක තමයි ප්‍රශ්නෙ වෙලා තියෙන්නේ. එහෙම වීථි ලාම්පු ප්‍රශ්නේ මට විතරක් කරගන්න බැහැ. ගරු උප සභාපතිතුමා අද වෙනකම් වීථි ලාම්පු ඉල්ලුවේ නැහැ. දැන් මුදල් තත්ත්වය සුළුවට තියෙන නිසා වීථි ලාම්පු දාන්න පුළුවන්. හැමදාම වීදි ලාම්පු වලට ලක්ෂ තුනකට වැඩි මුදලක් යනවා. දැන් හරි විදිහට නම් මේ අවුරුද්ද තුළ විතරක් ලක්ෂ තිස් හයක් ගිහිල්ලා තියෙනවා. ඊළඟට

නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා ප්‍රකාශ කල පරිදි, අපි 684,000 ගත්තා මොනවද කළේ කියලා. ඒ හය ලක්ෂ හැට දා ගන්න රජයෙන් එන මුදල්. නමුත් සභාවෙ සල්ලි නැහැ. සභාවට එනවනම් සභාවෙන් කරන්න තිබුණා. මම තනියෙන් මගේ බල ප්‍රදේශයට වැඩක් කරගෙන නැහැ. මම කාටත් පොදුවේ වැඩ කරන්නේ.

ඒ වගේම, උඩුගම ධනංජය මන්ත්‍රීතුමා, උඩුගම නගරය පිරිසිදු කිරීම ගැන කතා කරා. සෞඛ්‍ය කම්කරුවෝ එක්කෙනෙක්ගේ අත කැඩිලා. තව ඉන්නේ එක්කෙනයි. දෙන්නෙක් ට්‍රැක්ටරේ යනවා. මම ගිහිල්ලා කුණු එකතු කරන්නද? ඉතින් ඔහොම කටයුතු කරන්න බැහැ. හැබැයි කුණු එකතු කිරීමේ ප්‍රශ්නයක් තිබුනොත්, අපි ඒකෙ වගකීම ගන්න ඕන. ට්‍රැක්ටර් තුන කැඩිලා තියෙන්නේ. ඒවත් හදන්න කටයුතු කරල තියෙන්නෙ. නමුත් තවම නැහැ. පහුගිය දවස්වල උඩුගම බස්ටැන්ඩ් එකේ වැසිකිලි කොන්ත්‍රාත්තුවෙ අවසන් මුදල් ගෙව්වා. සදරුස්ගම පිට්ටනියෙ කතාවක් කිව්වා. එකේ කුණු දාලා. අපේම අය අය තමයි මේවා කරන්නේ. ඒ වගේම මේ ළඟ ශෙඩ් එකෙන් තෙල් ගහන්න යෝජනා සම්මත වුණා. මගේ පෞද්ගලික උවමනාවකට නෙවෙයි. මෙහෙ තියන වාහන වලට මෙහෙනුත්, උඩුගම තියෙන වාහන වලට එහෙනුත් තෙල් ගහන්න තමයි තීරණය වුනේ. උඩුගම ෂෙඩ් එකට මුදල් ගෙවන්න පරක්කු වුණා. ඒක ඇත්ත. නමුත් කිසි කෙනෙකුගේ මුදල් පමා කරලා නැහැ කොන්ත්‍රාත් මුදල් වුනත්, මුදල් ආපු ගමන් අත්සන් කරලා දෙනවා. අපේ හිටපු උප සභාපති තුමා අජිත් මහත්තයා මේවට සාක්ෂි දරයි.

ඊළඟට විජේවර්ධන මන්ත්‍රීතුමිය කියපු උඩවැලිවිටිය ප්‍රජාශාලාව පිළිබඳව සහ ක්ෂේත්‍රාරාමයට යන පාර දෙපස පිළිසකර කරගැනීම නම් අපහසු වෙයි. උත්සාහ කරනවා. නමුත් හෙට කරගන්න බැරිවෙයි. හැමදේම සභාවෙන් නැතුව ශ්‍රමදාන මට්ටමින් කරගන්නවා නම් ගොඩක් වටිනවා. මැෂින් එකක් දුන්නත්, ඒක කැඩුනට පස්සෙ ඒකෙ වගකීම ගන්නේ නැහැ. ඒ නිසා සභා සේවකයෙක් එක්ක මැෂිම යවන්න තමයි අපි තීරණය කරලා තියෙන්නෙ.

අපේ තරංග මන්ත්‍රීතුමාත්, පෙර පාසල් පිළිබඳව, සුසාන භූමි පිළිබඳව කතා කළා. අපට අයත් භූමි පවරා ගැනීම පිළිබඳව, දැනටමත් කොමිෂන් සභා සතු ඉඩම් ආයතන, පුද්ගලයින් සඳහා බදු හෝ විකුණුම් පදනම මත ලබා දීම, තල්ගස්වල ආදාහනාගාරය සඳහා අක්කර තුන හමාරක ප්‍රමාණයක් විකුණුම් පදනම් මත අපට ගන්න කියලා තියෙනවා. බදු පදනම මත සති පොල සඳහා පර්චස් 20 ප්‍රමාණය, බදු පදනම මත රූඩ් දෙකක ප්‍රමාණය වෙළෙඳ සංකීර්ණයට, ගන්න කියලා තියෙනවා. මේවා තල්ගස්වල වතුයායේ ඉඩම්. අපි දැන් එම ඉඩම් මැනලා සුද්ද කරලා, අපට පවර ගන්න විතරයි තියෙන්නේ. එතකොට අපේ අයිතිය තියෙනවා. එතකොට අනවසරව සිටින අය ඉවත් කරනවා. ඒකයි එතන තත්ත්වය. අනිත් ඉඩම් වලටත් පවරා ගැනීමේ කටයුතු ඇවිල්ල තියෙන්නේ. තවම අපට බැරි වුනේ ආදාහනාගාරයට අවශ්‍ය ඉඩම පවරා ගැනීම පමණයි. එය ඉක්මනින් සිදු කර ඉක්මනින්ම ආදාහනාගාරය ඉදිකරන්න මගේ ලොකු බලාපොරොත්තුවක් තියෙනවා. මේ ඉඩම පිළිබඳව අපේ ගරු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා හුඟක් උනන්දු වෙලා, අපට සහාය දැක්වූවා. යථා කාලයේදී ඒ පිළිබඳ සතුටුදායක ආරංචියක් ලබාගන්න පුළුවන් වෙයි.

අපේ සමන් මන්ත්‍රීතුමා, වෙරංග මන්ත්‍රීතුමා උඩුගම පොළ පිළිබඳව නිතරම කතා කරනවා. පහුගියදා වහලෙ වතුර බහින බට දාන්න එක් ලක්ෂ ගාණක් වැය වුණා. ඒ වගේම ඊළඟට පුරනැගුම ශාලාවෙ වතුර නැහැ. විදුලිය නැහැ. භාරගන්නකොටම කැඩිලා. දැන් අපි තමයි වියදම් කරලා හදන්න ඕන. ඔන්න ඕක තමයි අපිට වෙච්ච ලාභ. ඒවා හදාගෙන යන එක අපේ යුතුකමක්. ඒ කටයුතු කරන නිලධාරීන්, තාක්ෂණ නිලධාරීන් දැනගන්න ඕන ඒවා හරියට හදාගෙන කරන්න.

ඊළඟට වසන්ත මන්ත්‍රීතුමා දැන් මෙතන නැහැ. මාපලගම වැසිකිළිය පිළිබඳ කතා කළා. එකෙ වර්තමාන තත්ත්වය මම දන්නේ නැහැ. පියල් මන්ත්‍රීතුමා නම් කියන්නේ කිසි ප්‍රශ්නයක් නැහැ කියලා.

ඊළඟට සහබන්දු මහත්තයා කිව්වා නැඟිනිගල පාරේ කානුවක් ගැන, යථා කාලයේදී ඒ කටයුත්ත සිදුවෙනවා. ඒකට සභාවේ සල්ලි වලින් රුපියල් 25,000.00 කට වැඩිය වියදම් කළා. නමුත් ඒකෙන් වැඩක් නැහැ. ඊට පස්සේ වර්ෂාව නිසා ඒ කටයුත්ත අසාර්ථක වුණා.

ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමා, මා කියපු පාර පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ කතා කලා. ප්‍රශ්න සහගත තත්වයක් ඇතිවුවහොත් යන අදහස මත එතුමිය තමයි පොලිසියත් එක්ක යන්න කියලා තියෙන්නෙ. වැසිකිළිය පාරට අහු වෙනවා ඒ නිසා එක වෙනස් කරන්න කියලා කරපු ඉල්ලීමට අනුව, වැසිකිළිය බේරලා එහා පැත්තෙන් මනින්න කියලා තමයි යවලා තියෙන්නෙ. ඒ වගේම අපේ ගයන්ති මන්ත්‍රීතුමිය කිව්වා  වගේ පාරවල් පළල් කිරීම පිළිබඳව කටයුතු වලදී අපට ලොකු ඇස්තමේන්තු හදන්න බැරි නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යැව්වා.

විජිත් සහබන්දු මන්ත්‍රීතුමා අදත් විනාඩි දහයක් විතර කතා කලේ, කටු පොල් වගාව ගැන. අපි දැන් ඒවා කතා කරල තියෙනවා. යථා කාලයේදී , කුමන තීරණයක් ඒවිද අපි දන්නේ නැහැ. යථා කාලයේදී ඒ කටයුතු අපට සාධාරණයක් වෙන විදිහට, සමාජයට, ජනතාවට යහපතක් වන විදියට සිද්ධ වෙයි. නැත්නම් එයට විරුද්ධව අපි කටයුතු කරනවා. අපි දැනටමත් ලියුම් යවලා තියෙනවා. මාර්තු 15 වෙනිදට පෙර යථා තත්ත්වයට පත් කරන්න නැත්නම් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්න වෙනවා කියලා.

පතිනායක මන්ත්‍රීතුමා කියපු ඉඩම් බෙදුම් කරන කාරණයේදී, ඉඩම් බෙදුම් කරනවා නම් සභාවෙ අවසරය ගන්න කියලා සහ බෙදුම් කරලා තියෙන ඒවට හිග මුදල්, දඩ මුදල් වහාම සභාවට ගෙවන්න කියලා සභාවේ යෝජනා වුණා කියලා අදාළ ප්‍රසන්න විජේනාරායන මහතාට ලිපියක් යවනවා. ඔබතුමාගේ ඉල්ලීම අනුව වැඩිහිටි නිවාසෙ කුණු ටිකත් ගන්න කටයුතු කරනවා.

ඊළඟට මන්ත්‍රීතුමන්ලා, හිටපු සභාපතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට උපහාර උළෙලක් පවත්වන්න ගියසැරේ යෝජනා වුණා. ලබන මාසේ 28 වෙනිදට සභාව පත් වෙලා අවුරුද්දක් පිරීම නිමිත්තෙන්, හිටපු නියෝජිතයන් සිහිපත් කරලා කැඳවලා වාම් විදියට උපහාර උළෙලක්, උඩුගම ප්‍රධාන රූස්වීම් ශාලාවේ පවත් වන්න බලාපොරොත්තු වෙනවා. ඒක ඉදිරියේදී ඔබතුමාට ලිඛිතව දැනුම් දෙන්නම්. ඒ සඳහා මන්ත්‍රිතුමන්ලා සහ තමන්ගේ පවුලේ සාමාජිකයන් සියලු දෙනාත් එක්ක සහභාගි වෙන්න. ඒ වගේම 28 වෙනිදා සභා ගොඩනැගිල්ලේ ගිහි පිරිතක් තියන්න බලාපොරොත්තු වෙනවා. මේකටත් සියලු දෙනා සහභාගී වෙලා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න. ඒ වගේම අපේ ගයන්ති මන්ත්‍රීතුමියට සුබ උපන්දිනයක් කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අවුරුදු පහකට ආසන්න කාලයක්, අපේ සභාවට හොඳ සේවයක් කරපු අපේ ලේකම්තුමිය ස්ථාන මාරු වීම් ලබනවා. තව මාස කිහිපයට හරි එතුමිය නවත්වා ගැනීමට උත්සාහ ගත්තත්, එය අසාර්ථක වුණා. කොහොම නමුත් කරන්න දෙයක් නැහැ. තමන්ගේ අවශ්‍යතාවයන් අනුව ඉල්ලීම් කරලා යනකොට, අපට මානුෂික හේතූන් මත ඒ දිහා බලන්න වෙනවා. එතුමිය ලියුම ඉල්ලුවම, මම අනුප්‍රාප්තිකයකු ඇතුව තමයි දුන්නෙ. එතුමිය ගොඩක් වෙලාවට නීත්‍යානුකූලව උපදෙස් මට ලබාදීලා  ඉතා සාර්ථක අන්දමින් වැඩ කටයුතු කළා. ඒ පිළිබඳවත් එතුමියට මම ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම ගරු කරනවා. ඒ වගේම අද සභාව කිසි හැල හැප්පීම් වලින් නොමැතිව සහෝදරත්වයෙන් කටයුතු කිරීම පිළිබඳ මම උප සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලයට ස්තූතිවන්ත වෙමින්, අද දින සභාවේ වැඩ කටයුතු මින් අවසාන කරනවා

සභාපති,